2022 අප්‍රේල් • 241 කලාපය

# රණවිරුවා



## ආගමික සහයෝගීතාවය හා මිත්‍රත්වයට යුද්ධ හමුදාව දෑත් දිගුකළ වගයි

මනෝවිද්‍යාත්මක මෙහෙයුම් අධ්‍යක්ෂ මණ්ඩලය, යුද්ධ හමුදා මූලස්ථානය, ශ්‍රී ජයවර්ධනපුර.

# නව ආරක්ෂක රාජ්‍ය අමාත්‍යතුමන් රාජකාරී අරඹයි



නව ආරක්ෂක රාජ්‍ය අමාත්‍යවරයා වශයෙන් පත් වූ ගරු මහාචාර්ය ජී.එල්. පීරිස් මහතා ඉකුත් අප්‍රේල් 19 වන දින ආරක්ෂක අමාත්‍යාංශයේ පිහිටි සිය කාර්යාලයේ දී පැවති චාම් උත්සවයකදී රාජකාරී ආරම්භ කරන ලදී.

ආරක්ෂක අමාත්‍යාංශ පරිශ්‍රය වෙත සපැමිණි නව ආරක්ෂක රාජ්‍ය අමාත්‍යතුමන්, ආරක්ෂක ලේකම් ජෙනරාල් කමල් ගුණරත්න (විශ්‍රාමික) සමගින් ආරක්ෂක මාණ්ඩලික ප්‍රධානී හා යුද්ධ හමුදාධිපති ජෙනරාල් ශවේන්ද්‍ර සිල්වා ඩබ්ලිව්ඩබ්ලිව්වී ආර්ඩබ්ලිව්පී ආර්එස්පී වීඑස්වී යූඑස්පී එන්ඩීසී පීඑස්සී එම්ෆිල් සහ ආරක්ෂක අමාත්‍යාංශයේ ජ්‍යෙෂ්ඨ නිලධාරීන් විසින් පිළිගැනීමෙන් අනතුරුව ආගමික වතාවත් සිදුකිරීමෙන් පසුව එම චාම් උත්සවයේ ආරම්භය සනිටුහන් විය. නාවික හා ගුවන් හමුදාධිපතිවරු, සිවිල් ආරක්ෂක දෙපාර්තමේන්තුවේ අධ්‍යක්ෂ ජෙනරාල්, ආරක්ෂක අමාත්‍යාංශයේ සහ රාජ්‍ය ආරක්ෂක අමාත්‍යාංශයේ අතිරේක ලේකම්වරු ඇතුළු ජ්‍යෙෂ්ඨ නිලධාරීන් කිහිපදෙනකු ද එම අවස්ථාවට සහභාගී වූහ.

# මෙරට විදේශ දූත මණ්ඩලයන්හි ආරක්ෂක උපදේශකවරුන් සමඟ සාකච්ඡාවක



මෙරට සන්නද්ධ හමුදා සාමාජිකයින් සෑම අවස්ථාවකදීම ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවට අනුකූලව කටයුතු කරනු ලබන බව ආරක්ෂක මාණ්ඩලික ප්‍රධානී හා යුද්ධ හමුදාධිපති ජෙනරාල් ශවේන්ද්‍ර සිල්වා ඩබ්ලිව්ඩබ්ලිව්වී ආර්ඩබ්ලිව්පී ආර්එස්පී වීඑස්වී යූඑස්පී එන්ඩීසී පීඑස්සී එම්ෆිල් මෙරට විදේශ මහකොමසාරිස්වරුන්, තානාපති කාර්යාලවල ආරක්ෂක උපදේශකවරුන් සහ ආරක්ෂක නියෝජිතයින් හමුවේ ප්‍රකාශ කළේය.

බණ්ඩාරනායක අනුස්මරණ ජාත්‍යන්තර සම්මන්ත්‍රණ ශාලාවේදී ඉකුත් අප්‍රේල් 04 දින පැවැත්වූ මෙම හමුවේදී ශ්‍රී ලංකාවේ වත්මන් තත්ත්වය පිළිබඳ යුද්ධ හමුදාධිපති විසින් විදේශ දූත මණ්ඩල නිලධාරීන් දැනුවත් කළේය. වෘත්තීමය හැකියාවන්ගෙන් සමන්විත යුද්ධ හමුදාව ප්‍රමුඛ ත්‍රිවිධ හමුදාව සැමවිටම රටේ ආරක්ෂාව වෙනුවෙන් කටයුතු කරනු ලබන බවත් එහිදී ඔහු වැඩිදුරටත් ප්‍රකාශ කළේය.

මෙම සාකච්ඡාවට ඇමරිකා එක්සත් ජනපදය, එක්සත් රාජධානිය, රුසියාව, ඕස්ට්‍රේලියාව, ජපානය, චීනය, ඉන්දියාව, ඉරානය, පකිස්තානය, බංගලාදේශය සහ මාලදිවයින යන රටවල මෙරට තානාපති කාර්යාලවල ආරක්ෂක උපදේශකවරුන් සහ ආරක්ෂක නියෝජිතයින් සහභාගී වූහ.

# 107 වන ඕස්ට්‍රේලියානු සහ නවසීලන්ත රණවිරු අනුස්මරණ දින උත්සවය



ලංකා වැව්ලිකරුවන්ගේ රයිෆල් බලකා සාමාජිකයින්ගෙන් සමන්විත ඕස්ට්‍රේලියානු සහ නවසීලන්ත ඒකාබද්ධ යුද්ධ හමුදාවන්හි පරාර්ථකාමී හා රණකාමී විරුවන්ගේ දීර්ඝකාලීන අතීත මතකයන් යළි ආවර්ජනය කිරීම උදෙසා ශතවර්ෂයක් පුරා පවතින සබඳතාවයන් ද පිළිබිඹු කරමින් 107 වන *Anzac* දිනය වෙනුවෙන් ඉකුත් අප්‍රේල් 25 වන දින *'Australia House'* හිදී උදෑසන දේව මෙහෙයක් පවත්වන ලදී. මෙම අවස්ථාවට මහ කොමසාරිස්වරුන්, තානාපතිවරුන්, රාජ්‍ය තාන්ත්‍රිකයින්, ආරාධිත අමුත්තන් සහ ශ්‍රී ලංකාවේ ස්ථාපිත තානාපති කාර්යාලයන්හි ආරක්ෂක උපදේශකවරුන් ද සහභාගී වූහ.



ඕස්ට්‍රේලියාවේ සහ නවසීලන්ත තානාපති කාර්යාල සමග ශ්‍රී ලංකා සන්නද්ධ හමුදාවන්හි පවතින සහයෝගීතාවය පිළිබිඹු කරමින් ඕස්ට්‍රේලියානු මහ කොමසාරිස් අතිගරු ඩේවිඩ් හොලි (*HE David Holly*) මහතා සහ නවසීලන්ත මහ කොමසාරිස් අතිගරු මිචෙල් ඇප්ලටන් (*HE Michael Appleton*) මහතාගේ ආරාධනයකට අනුව මෙම සැමරුම් උත්සවයේ සම්භාවනීය ආරාධිතයකු ලෙස සහභාගී වූ ආරක්ෂක මාණ්ඩලික ප්‍රධානී හා යුද්ධ හමුදාධිපති ජෙනරාල් ශවේන්ද්‍ර සිල්වා ඩබ්ලිව්ඩබ්ලිව්වී ආර්ඩබ්ලිව්පී ආර්එස්පී වීඑස්වී යූඑස්පී එන්ඩීසී පීඑස්සී එම්ෆිල් විසින් ඕස්ට්‍රේලියාවේ සහ නවසීලන්තයේ දිවිපිදූ රණවිරුවන් වෙත සිය උපහාරය පුද කළේය.

තුර්කිය සමග පැවති යුද්ධයේදී වර්ෂ 1915 අග භාගය තෙක් තුර්කියේ *'Gallipoli'* අර්ධද්වීපයේ මිත්‍ර හමුදාවන් මුදවාගැනීම සඳහා සිදුකළ මෙහෙයුමේදී අමරණීය මතකයන් ඉතිරිකරමින් දිවිපිදූ ඕස්ට්‍රේලියානු රණවිරුවන් දහසකට අධික පිරිසක් අනුස්මරණය කිරීම වෙනුවෙන් 1916 වසරේ සිට සෑම වසරකම අප්‍රේල් මස 25 වන දින මෙම සැමරුම් උත්සවය පවත්වනු ලබයි.

ශ්‍රී ලංකාව ඇතුළු අනෙකුත් ජාතීන්ට ද වැදගත්කමක් එක්කරනු ලබන මෙම සංවත්සර සැමරුම් උත්සවයේ දී වර්ෂ 1915 අවසානයේ තුර්කියේ *'Gallipoli'* හිදී පැවති යුද්ධයේදී මිත්‍ර හමුදාවන් ඉවත් කරගන්නා තුරු අනෙකුත් ජාතීන් සමග එක්ව ශ්‍රී ලංකා යුද්ධ හමුදා සාමාජිකයින් සිදුකළ කැපකිරීම පිළිබඳ මතකයන් ආවර්ජනය කෙරිණි.

තුර්කියේ, *Gallipoli* අර්ධද්වීපය පිළිබඳ වසර 100 ක ඉපැරණි තොරතුරුවලට අනුව, එකළ පැවති ලංකා වැව්ලිකරුවන්ගේ රයිෆල් බලකායේ තේ සහ රබර් වගාකරුවන්ගෙන් සමන්විත මහනුවර ස්ථාපිත කර තිබූ ස්වේච්ඡා රෙජිමේන්තුවෙන් කණ්ඩායමක් වර්ෂ 1914 සරත් සෘතුවේ පළවන ලෝක යුද්ධ සමයේදීත්, වර්තමානයේ *'ANZAC Cove'* ලෙස නම්කරනු ලබන *Ari Burnu* වෙරළ ප්‍රදේශයේ ස්ථානගතව සිටි 1 වන ඕස්ට්‍රේලියානු සහ නවසීලන්ත හමුදා බලකායන් වර්ෂ 1915 අප්‍රේල් මස ශ්‍රී ලංකා වැව්ලිකරුවන්ගේ රයිෆල් බලකායේ කණ්ඩායමක් සමග තුර්කියේදී මෙම මෙහෙයුම සඳහා එක්වූහ.

# යුද්ධ හමුදා මූලස්ථානයේ "ඉෆ්තාර්" උත්සවය



ආගමික සහයෝගීතාවය හා මිත්‍රත්වය ප්‍රවර්ධනය කිරීමේ අරමුණින් දෛනික රාමදාන් උපවාස කාලය අත්හැරීමෙන් පසු ඉස්ලාම් භක්තික නිලධාරීන් සහ සෙසුනිලයින් විසින් සිදුකරනු ලබන "ඉෆ්තාර්" ආගමික චාරිත්‍ර චාරිත්‍ර සිදුකිරීමේ උත්සවය ඉකුත් අප්‍රේල් 29 වන දින යුද්ධ හමුදා මූලස්ථානයේදී ආරක්ෂක මාණ්ඩලික ප්‍රධානී හා යුද්ධ හමුදාධිපති ජෙනරාල් ශවේන්ද්‍ර සිල්වා ඩබ්ලිව්ඩබ්ලිව්වී ආර්ඩබ්ලිව්පී ආර්එස්පී වීඑස්වී යූඑස්පී එන්ඩීසී පීඑස්සී එම්ෆිල් ගේ සහභාගීත්වයෙන් පවත්වන ලදී.




ලොව පුරා වෙසෙන ඉස්ලාම් බැතිමතුන් විසින් සිදුකරනු ලබන "ඉෆ්තාර්" චාරිත්‍රයට ශ්‍රී ලංකා යුද්ධ හමුදාව වෙතින් දක්වන ගෞරවය සංකේතවත් කරමින් මෙම වැඩසටහන ශ්‍රී ලංකා යුද්ධ හමුදා මුස්ලිම් සංගමය විසින් සංවිධානය කරන ලද අතර, මෙමගින් රටේ සමෘද්ධිය සහ සෞභාග්‍ය ප්‍රාර්ථනා එක්කරමින් ආශිර්වාද කිරීම ද සිදුකෙරිණි.



යුද්ධ හමුදාධිපති මීට වසර කිහිපයකට පෙර යුද්ධ හමුදා මූලස්ථානයේ විධායක ජෙනරාල් ධූරයේ රාජකාරී සිදුකළ කාලවකවානුවේ මෙම නව "ඉෆ්තාර්" ක්‍රමය ආරම්භ කරනු ලැබූ අතර, එම වැඩසටහන තුළින් යුද්ධ හමුදාවේ සේවයේ නියුතු සියලුම මුස්ලිම් සහෘදයින්ට එක් වහලක් යට අන්‍යෝන්‍ය සබඳතාවයන් වර්ධනය කරගනිමින් තම ආගමික චාරිත්‍ර චාරිත්‍රයන් ඉටුකිරීම සඳහා අවස්ථාව උදාවූහ.

මෙම උත්සවයේ පිළිගැනීමේ කතාව බ්‍රිගේඩියර් අස්කර් මුතාලිෆ් විසින් සිදුකළ අතර, මවුලවි මොහොමඩ් ඉසඩ් සහ මවුලවි සෆ්රාස් ඉක්බාල් විසින් සිංහල සහ ඉංග්‍රීසි භාෂාවෙන් දේශන පවත්වමින් "ඉෆ්තාර්" චාරිත්‍ර චාරිත්‍ර පිළිබඳ සහ එහි අර්ථය ජීවන රටාවට වැදගත්වන ආකාරය පිළිබඳව පැහැදිලි කරන ලදී.

# ආරක්ෂක මාණ්ඩලික ප්‍රධානී අභිමංසල සුවතා නිකේතනයේ නේවාසික රණවිරුවන් හමුවේ



ආරක්ෂක මාණ්ඩලික ප්‍රධානී හා යුද්ධ හමුදාධිපති ජෙනරාල් ශවේන්ද්‍ර සිල්වා ඩබ්ලිව්ඩබ්ලිව්වී ආර්ඩබ්ලිව්පී ආර්එස්පී වීඑස්වී යූඑස්පී එන්ඩීසී පීඑස්සී එම්ෆිල් අප්‍රේල් මස 13 වන දින සිංහල හා දමිළ අලුත් අවුරුදු උදාවට ප්‍රථම "අභිමංසල" සුවතා නිකේතනයේ සංචාරයක නිරත වෙමින් එහි නේවාසිකව ප්‍රතිකාර ලබන රණවිරුවන්ගේ සුවදුක් විමසා බලනු ලැබීය. නිදහස සුරැකීමේ ඒකායන පරමාර්ථය පෙරදැරිව තම ජීවිත සහ අත් පා පුදකරමින් එදවස යුදබිමේ සතුරාට එරෙහිව සටන්වැදුනු ආකාරයත්, යුද බිමේදී දැක්වූ නිර්භීතකම සහ උත්තරීතර පරිත්‍යාගයත් එහිදී යුද්ධ හමුදාධිපති යළි ආවර්ජනය කළේය. එම අවස්ථාවේදී රණවිරුවන් වෙත අලුත් අවුරුද්ද වෙනුවෙන් රුැබ් යන්ත්‍ර සහ අත්‍යවශ්‍ය ද්‍රව්‍ය සහිත ත්‍යාග පාර්සල් ද පිරිනමනු ලැබීය.

එමෙන්ම, එහි රණවිරුවන්ගේ අවශ්‍යතා වෙනුවෙන් සහය දක්වන අනෙකුත් රණවිරුවන් වෙහෙස මහන්සිය නොබලා සිදුකරනු ලබන කාර්යභාරය ඇගයීමට ලක්කරමින් ඔවුන් වෙත ජංගම දුරකථනය බැගින් පරිත්‍යාග කිරීමටද යුද්ධ හමුදාධිපති එහිදී කටයුතු කළේය.

මෙම සංචාරය සඳහා ආරක්ෂක සේනා (වන්නි) ආඥාපති, පුනරුත්ථාපන අධ්‍යක්ෂ, අනුරාධපුර අභිමංසල සුවතා නිකේතනයේ සේනාවිධායක ඇතුළු පිරිසක් ද එක්වූහ.



# යුද්ධ හමුදා මූලස්ථානයේ අලුත් අවුරුදු සැමරුම





සිංහල හා දමිළ අලුත් අවුරුදු උදාවෙන් අනතුරුව ශ්‍රී ජයවර්ධනපුර පිහිටි යුද්ධ හමුදා මූලස්ථානයේ රාජකාරි කටයුතු ආරම්භ කරමින් ඉකුත් අප්‍රේල් 18 වන දින පෙරවරුවේ සම්ප්‍රදායානුකූලව සියලු නිලයන් ඇමතීමේ අවස්ථාවට ප්‍රධාන ආරාධිත අමුත්තා ලෙස ආරක්ෂක මාණ්ඩලික ප්‍රධානී හා යුද්ධ හමුදාධිපති ජෙනරාල් ශවේන්ද්‍ර සිල්වා ඩබ්ලිව්ඩබ්ලිව්වී ආර්ඩබ්ලිව්පී ආර්එස්පී වීඑස්වී යූඑස්පී එන්ඩීසී පීඑස්සී එම්ෆිල් සහභාගී වූයේය. මෙම අවස්ථාවට යුද්ධ හමුදා මාණ්ඩලික ප්‍රධානී මේජර් ජෙනරාල් එච්එල්වීඑම් ලියනගේ ආර්ඩබ්ලිව්පී ආර්එස්පී එන්ඩියූ, නියෝජ්‍ය මාණ්ඩලික ප්‍රධානී මේජර් ජෙනරාල් ටීජේ කොඩිතුවක්කු ආර්ඩබ්ලිව්පී ආර්එස්පී එන්ඩියූ ඇතුළු යුද්ධ හමුදාවේ ජ්‍යෙෂ්ඨ නිලධාරීන්, සෙසුනිලයන් සහ සිවිල් සේවක කාර්ය මණ්ඩල සාමාජිකයින් සහභාගී වූහ.



"වෘත්තීයමය හමුදාවක සාමාජිකයන් වශයෙන් විටින් විට ප්‍රචාරය වන පදනම් විරහිත අසත්‍ය කටකතා, චෝදනා සහ ඇතමුන් විසින් ගොතන ලද ප්‍රකාශ හමුවේ අප නොසැලී කටයුතු කිරීම ඉතාම වැදගත් වෙනවා. ඒ වාගේම, ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ විධිවිධානයන්ට අනුකූලව සෑම විටම රාජ්‍යය සහ මහජනතාව ආරක්ෂා කිරීම වෙනුවෙන් අප බැඳී සිටිනවා. ඔබ අප සැමදෙනා භුක්ති විඳින මේ නිදහස හා සාමය මානුෂියත්වය පෙරදැරි කරගත් ශ්‍රී ලංකා යුද්ධ හමුදා සාමාජිකයින් වන අපගේ ලේ දානයෙන්, කාය දානයෙන් සහ ජීවිත දානයෙන් උදාකරගත්තක් බව මේ මොහොතේ සිහිපත් කළ යුතු වෙනවා. රටේ ආරක්ෂාව වෙනුවෙන් කටයුතු කිරීමේදී අප සියලුදෙනා වෙත ඉතාමත් භාරදූර මෙන්ම වගකිවයුතු රාජකාරියක් සෑමවිටම පැවරී තිබෙන බව අප සිහි තබාගත යුතුයි."

"ශ්‍රී ලංකා යුද්ධ හමුදාව වශයෙන් අප සෑමවිටම මෙරට ජනතාව සහ ඔවුන්ගේ යහපත පිණිස කටයුතු කරනු ලබනවා. ඒ වාගේම, වර්තමානයේ ඇතැම් ප්‍රකාශයන්හි සඳහන් පරිදි කිසි විටෙකත් කිසිදු පුරවැසියකුට පීඩාවක් හෝ හානියක් සිදුවන ආකාරයෙන් ශ්‍රී ලංකා යුද්ධ හමුදාව කටයුතු නොකරන බව අවධාරණය කළ යුතුයි. ශ්‍රී ලංකා පොලිසිය විසින් අභ්‍යන්තර ආරක්ෂක රාජකාරි සඳහා ශ්‍රී ලංකා යුද්ධ හමුදාවේ සහය ඉල්ලා සිටින ඕනෑම අවස්ථාවකදී මාතෘභූමියත්, එහි වාසය කරන සියලු ශ්‍රී ලාංකික ජනතාවත්, ඔවුන්ගේ දේපළත් රටේ ආරක්ෂාව තහවුරු කිරීම වෙනුවෙන් ව්‍යවස්ථානුකූලව ආරක්ෂා කිරීමට ශ්‍රී ලංකා යුද්ධ හමුදාව බැඳිසිටී"

- යුද්ධ හමුදාධිපති

# අලුත් අවුරුදු උදාවෙන් පසු ආරක්ෂක මාණ්ඩලික ප්‍රධානී කාර්යාලයේ රාජකාරී අරඹමින්



2022 සිංහල හා දෙමළ අලුත් අවුරුදු උදාවෙන් අනතුරුව ආරක්ෂක මාණ්ඩලික ප්‍රධානී කාර්යාලයේ රාජකාරී කරන පළමු දිනය ආරක්‍ෂක මාණ්ඩලික ප්‍රධානී හා යුද්ධ හමුදාධිපති ජෙනරාල් ශවේන්ද්‍ර සිල්වා ඩබ්ලිව්ඩබ්ලිව්වී ආර්ඩබ්ලිව්පී ආර්එස්පී වීඑස්වී යූඑස්පී එන්ඩීසී පීඑස්සී එම්ෆිල් ගේ ප්‍රධානත්වයෙන් ඉකුත් අප්‍රේල් 18 වන දින ආරම්භ කරනු ලැබීය. එම අවස්ථාව සඳහා බණ්ඩාරනායක අනුස්මරණ ජාත්‍යන්තර සම්මන්ත්‍රණ ශාලා පරිශ්‍රයේ පිහිටි ආරක්‍ෂක මාණ්ඩලික ප්‍රධානී කාර්යාලයේ සේවයේ නියුතු ත්‍රිවිධ හමුදා නිලධාරීන් සහ පොලිස් නිලධාරීන් ද සහභාගී වූහ.



අලුත් අවුරුදු උදාව සංකේතවත් කරමින් මෙදින සාම්ප්‍රදායික තේ පැන් සංග්‍රහයක් පැවැත්වූ අතර ආරක්‍ෂක මාණ්ඩලික ප්‍රධානී එම අවස්ථාව සඳහා සහභාගී වූ සියලු දෙනා වෙත අලුත් අවුරුදු සුබපැතුම් එක්කරමින් විශේෂ ත්‍යාග ද ප්‍රදානය කළේය. මෙම තේ පැන් සංග්‍රහය අතරතුර ආරක්‍ෂක මාණ්ඩලික ප්‍රධානී විසින් සියලු නිලයන් සමගින් සුහද පිළිසඳරක ද යෙදුණේය.



මෙම අවස්ථාව සඳහා ආරක්ෂක මාණ්ඩලික ප්‍රධානී කාර්යාලයේ මාණ්ඩලික ප්‍රධානී මේජර් ජෙනරාල් ඩීඑම්ඒපී දිසානායක ආර්ඩබ්ලිව්පී ආර්එස්පී යූඑස්පී එන්ඩීයූ අයිජී, අධ්‍යක්ෂ ජෙනරාල් ප්‍රධාන මාණ්ඩලික මේජර් ජෙනරාල් ඒසී ලමාහේවා ඩබ්ලිව්ඩබ්ලිව්වී ආර්ඩබ්ලිව්පී ආර්එස්පී ඇතුළු ජ්‍යේෂ්ඨ නිලධාරීන්, සිවිල් නිලධාරීන්, සෙසුනිලයන් සහ සිවිල් සේවක කාර්ය මණ්ඩල සාමාජිකයින් ද සහභාගී වූහ.



# සිවිල් සේවක කාර්ය මණ්ඩලයේ හා සෙබළුන්ගේ සේවය අගයයි



සිංහල හා දෙමළ අලුත් අවුරුද්ද නිමිති කරගනිමින් යුද්ධ හමුදා මූලස්ථානය තුළ සේවයේ නියුතු සිවිල් සේවක කාර්ය මණ්ඩලයේ කාර්යභාරය ඇගයීමට ලක්කරමින් ඔවුන් වෙත ත්‍යාග පිරිනැමීමේ වැඩසටහනක් ආරක්ෂක මාණ්ඩලික ප්‍රධානී හා යුද්ධ හමුදාධිපති ජෙනරාල් ශවේන්ද්‍ර සිල්වා ඩබ්ලිව්ඩබ්ලිව්වී ආර්ඩබ්ලිව්පී ආර්එස්පී වීඑස්වී යූඑස්පී එන්ඩීසී පීඑස්සී එම්ෆිල් ගේ සුරතින් පසුගියදා සිදුකෙරිණ. මේ යටතේ යුද්ධ හමුදාධිපති ලේකම් කාර්යාලයේ සේවයේ නියුතු සිවිල් සේවක මහතුන් කිහිපදෙනකු වෙත යුද්ධ හමුදාධිපති කාර්යාලයේදී ත්‍යාග පාර්සල් පිරිනමන ලදී.



මේ අතර, යුද්ධ හමුදා සේවා වනිතා ඒකකයේ මූලිකත්වයෙන් යුද්ධ හමුදා මූලස්ථාන සංකීර්ණයේ සේවයේ නියුතු සිවිල් සේවක මහත්ම මහත්මීන්ගේ කාර්යභාරය ඇගයීමට ලක්කරමින් ඔවුනගේ ප්‍රයෝජනය වෙනුවෙන් ත්‍යාග හා වියළි සලාක පාර්සල් ඇතුළු අනෙකුත් අත්‍යවශ්‍ය ද්‍රව්‍ය ප්‍රදානය කිරීමේ උත්සවයක් ද යුද්ධ හමුදා සේවා වනිතා ඒකකයේ සභාපතිනි සුජීවා නෙල්සන් මහත්මියගේ ප්‍රධානත්වයෙන් පැවැත්විණි. එම ඒකකයේ ආරාධනයකට අනුව ආරක්ෂක මාණ්ඩලික ප්‍රධානී හා යුද්ධ හමුදාධිපති ද මෙම අවස්ථාවට එක්විය.



මෙම අවස්ථාවේදී හෝමාගම ප්‍රදේශයේ පදිංචි දානපතිනියක් වන චන්ද්‍රානි ලියනගේ මහත්මිය විසින් රණක්ෂිතයට පත් සහ දිවංගත රණවිරුවන්ගේ පවුල්වල සාමාජිකයින් සඳහා දියත් කරනු ලබන වැඩසටහන් වෙනුවෙන් සිය සහයෝගය පලකරමින් යුද්ධ හමුදා සේවා වනිතා ඒකකයේ සුබසාධන වැඩසටහන් සඳහා රුපියල් මිලියන 9 ක පමණ වටිනාකමකින් යුත් දෙමහල් නිවසක් පරිත්‍යාග කිරීම ද විශේෂත්වයකි.

# හිටපු එල්ටීටීඊ සාමාජිකයෙකුට නව නිවසක්

යාපනය අර්ධද්වීපයේ හිටපු එල්ටීටීඊ සාමාජිකයන් වෙත නව නිවාස ඉදිකරදීමේ ව්‍යාපෘතිය යටතේ යාපනයේ මයිලඩි ප්‍රදේශයේ විවිධ දුෂ්කරතා මධ්‍යයේ දිවිගෙවූ හිටපු එල්ටීටීඊ සාමාජිකයකු වන රාසවල්ලන් තබෝරුබන් මහතා වෙත පසුගියදා නව නිවසක් පරිත්‍යාග කෙරිණ.

2021 ජූනි මස 24 දින ජනාධිපති පොදු සමාව යටතේ නිදහස් වූ මෙම ප්‍රතිලාභියා පුනරුත්ථාපනය කර නැවත සමාජගත කරනු ලැබූ මුත් ඒ වනවිටත් ඔහුගේ දියණියට සහ පවුලේ සාමාජිකයන්ට ස්ථිර නිවසක් නොතිබුණි. මෙම කරුණ පිළිබඳ අවධානය යොමුකළ යුද්ධ හමුදාධිපති එතුමන්ගේ සුරතින් ඉකුත් නොවැම්බර් මස 03 වන දින මෙම පවුල වෙනුවෙන් ඉදිකෙරෙන නව නිවස සඳහා මුල්ගල් තබන ලදී.

මෙම නිවස ඉදිකිරීම සඳහා මූල්‍ය දායකත්වය යුද්ධ හමුදාවේ ඉල්ලීම පරිදි 55 වන සේනාංකාධිපති බ්‍රිගේඩියර් එම්කේයූපී ගුණරත්න ආර්එස්පී එන්ඩීයූ පීඑස්සී අයිජී ගේ සම්බන්ධීකරණයෙන් පරිත්‍යාගශීලී විශ්ව නඩරාජා මහතා විසින් ලබා දෙන ලදී. එසේම, ආරක්ෂක සේනා මූලස්ථානය (යාපනය) යටතේ ස්ථාපිත 515 වන බලසේනාවේ බලසේනාධිපති කර්නල් ඩබ්ලිව්එම්ඒබී විජේකෝන් යූඑස්පී ගේ අධීක්ෂණය යටතේ ඉදිකිරීම් කටයුතු සඳහා 10 වන මධ්‍යම රෙජිමේන්තුව ශ්‍රී ලංකා කාලතුවක්කු හමුදාවේ භටපිරිස් අවශ්‍ය ශ්‍රමදායකත්වය සහ තාක්ෂණික දායකත්වය ලබාදුන්හ.

මෙසේ ඉදිකරනු ලැබූ නව නිවස ආරක්ෂක මාණ්ඩලික ප්‍රධානී හා යුද්ධ හමුදාධිපති ජෙනරාල් ශවේන්ද්‍ර සිල්වා ඩබ්ලිව්ඩබ්ලිව්වී ආර්ඩබ්ලිව්පී ආර්එස්පී වීඑස්වී යූඑස්පී එන්ඩීසී පීඑස්සී එම්ෆිල්, ඉකුත් අප්‍රේල් 11 වන දින යුද්ධ හමුදා මූලස්ථානයේ පිහිටි යුද්ධ හමුදාධිපති කාර්යාලයේ සිට මාර්ගගත තාක්ෂණය (*zoom*) ඔස්සේ විවෘත කිරීමේ උත්සව අවස්ථාව සමග සම්බන්ධ විය. එහිදී, රාසවල්ලන් තබෝරුබන් මහතාට සහ ඔහුගේ පවුලේ සාමාජිකයන්ට දීප්තිමත් අනාගතයක් සඳහා එතුමන්ගේ සුබපැතුම් පිරිනැමීය.

නව නිවස විවෘත කිරීමේ උත්සව අවස්ථාව සඳහා ආරක්ෂක සේනා (යාපනය) ආඥාපති මේජර් ජෙනරාල් ඩීජීඑස් සෙනරත් යාපා ආර්ඩබ්ලිව්පී ආර්එස්පී එන්ඩීයූ, නිවස ඉදිකිරීම සඳහා අනුග්‍රාහකත්වය දැක්වූ විශ්ව නඩරාජා මහතා සහ ඔහුගේ භාර්යාව වන නඩරාජා මහත්මියද සහභාගී වූහ.










# නිරීක්ෂණ චාරිකාවක්



යුද්ධ හමුදා සාමාජිකයින් වෙතින් යුද්ධ හමුදාවට ඵලදායි සේවයක් ලබාගැනීමට හා එම අයවලුන් විශ්‍රාම ගැනීමෙන් පසු ඔවුනට ස්වයං රැකියා අවස්ථාවක් උදාකරදීමේ අරමුණින් "බුද්ධි බතික්" ආයතනය සමග සම්බන්ධතාවයෙන් බතික් පාඨමාලාවක් ආරම්භ කිරීමට යුද්ධ හමුදා සේවා වනිතා ඒකකය සැලසුම් කර ඇත. මුල්ලේරියාවෙහි පිහිටි "සන්ෆ්ලවර් විලේජ්" කඳවුරෙහි එම පාඨමාලාව පැවැත්වීමට ඇති හැකියාව සොයා බැලීම සඳහා ඉකුත් අප්‍රේල් 01 වන දින යුද්ධ හමුදා සේවා වනිතා ඒකකයේ සභාපතිනි සුජීවා නෙල්සන් මහත්මිය එහි සංචාරයක නිරත වූවාය.


එම සංචාරය අතරතුර එහි පවත්වාගෙන යනු ලබන ආහාර ව්‍යාපෘතිය සහ මධ්‍යගත සැපයුම් ව්‍යාපෘතියේ රාජකාරීන් හා ප්‍රගතිය සබැඳිව ද එතුමිය සොයා බැලුවාය. එම අවස්ථාවට සේවා වනිතා ඒකකයේ බ්‍රිගේඩියර් (සම්බන්ධීකරණ) බ්‍රිගේඩියර් ටීඑස් බාලසූරිය ද සහභාගී විය.





# අක්කරායන්කුලම් හිදී සිදුකරනු ලැබූ

# වීර ක්‍රියාව



සෙ/319509 ලාන්ස් කෝප්‍රල් දයානන්ද ටීජීඩීආර්
පීඩබ්ලිව්වී ආර්ඩබ්ලිව්පී
ශ්‍රී ලංකා පාබල හමුදාව

දර්ශණ රුවන් දයානන්ද පුංචි පුත් කුමරුවා මෙලොව එළිය දුටුවේ පදවි ශ්‍රීපුර ගම්මානයට අඳුරු වකවානුවක්ව පැවති කලෙකය. ඔහු ඉපදෙන සමය තුළ පදවියේ වැලිමය රන් හිරු දහරා ගැන ලියන්නට අපට පුළුවන්කමක් නැත. ඒ පළාතේ සැඟවී දෝංකාර දුන්නේ කුරිරු ත්‍රස්ත භීතියයි. මරු විකල්ලෙන් අහිංසක වැසියන් සොයා ගම්වැදුණු කුරිරු එල්ටීටීඊයේ දාමරිකත්වයට මුහුණදීගත නොහැකිව කැලෑ පැන ගහකොළ යට දිවි ගෙවූ මිනිසුන් අතුරින් අභීත ලේ ඇති වීර පුතුන් දසදහස් ගණනින් මෙබිම පහළ විය. යුද්ධයේ සැබෑ අත්දැකීම් ළපටි කාලයේම පුංචි දරුවන්ගේ හදවත්වල කිදාබැස හොල්මන් කරන්නට වූයේ සුන්දර වූ ළමාවිය අහිමි කරමිනි. එවන් සමයක පදවි ශ්‍රීපුර 31 වන සේවා ජනපදයේ පදිංචි වී ජීවිතයත් මරණයත් අතර සටනක් කළ ගමරාළලාගේ දයානන්ද පියාණන්ට සහ දොළපිල්ලේ පහත තලගහගෙදර චන්ද්‍රා ඥාණගරු මැණියන්ට දාව වර්ෂ 1988 ක් වූ ඔක්තෝබර් මස 06 වන දා රටට දැයට හිතැති පිංවත් කුමරුවකුගේ ආගමනය සිදුවිය.

දර්ශණ රුවන් දයානන්ද පවුලේ වැඩිමලා වූ අතර ඔහුට බාල සහෝදරයින් දෙදෙනකු සහ සහෝදරියන් තිදෙනකු සිටියෝය. පවුල තරමක් විශාල වුවත් රෝහල් කම්කරුවකු වශයෙන් ශ්‍රීපුර දිසා රෝහලේ රැකියාවෙහි නිරත වූ ගමරාළලාගේ දයානන්ද නම් අධිෂ්ඨානශීලී පියා පුංචි පැටවුන් රොත්තට කවා පොවා හදාගන්නටත් අකුරු උගන්වන්නටත් විඳි දුක දන්නේ ඔහුත් ඔහු ඇදහූ ඉෂ්ට දේවතාවනුත් පමණි.

පදවි පලුගස්වංගුව මහා විද්‍යාලය පුංචි දර්ශණ රුවන් දයානන්දගේ මහා සිප් කෙත විය. පාසලේ මෙන්ම පන්සලේ ඉරුදින දහම් පාසලේද ගුරු මාපියන්ගේ නොමඳ පැසසුමට ලක් වූ පුංචි දර්ශණ රුවන් දයානන්ද කා අතරත් ජනප්‍රිය චරිතයක් බවට පත්වීමට වැඩි කාලයක් ගත නොවීය.

"දර්ශණ රුවන් දයානන්ද කියන්නේ ගමටත් පන්සලටත් ගොඩක් ලෙන්ගතු දරුවෙක්. කවදාවත් ගමේ කෙනකුගේ හිත

විදෙව්වේ නෑ. මොන ප්‍රශ්නයක් ආවත් මුලින්ම ආවෙ පන්සලට. හමුදාවට ගියාට පස්සේත් ඒ පුරුද්ද දර්ශණ දරුවට තිබුණා. හැම නිවාඩුවකම පන්සලට ඇවිත් මාව මුණගැහිලා තමයි යන්නේ". එසේ දර්ශණ රුවන් දයානන්ද ගැන සියුම් කඳුලක් ඇස රඳවාගෙන කතා කරන්නේ ශ්‍රී පුර ධම්මාලෝක රජමහා විහාරයේ විහාරාධිපති පූජ්‍ය කරම්බන්කුලමේ සිරිධම්ම නාහිමියන්ය. ගමේ හා පාසලේ ක්‍රීඩා පිටියේද ජයකෙහෙළි නැංවූ ඔහු අධ්‍යාපන කටයුතුවලටත් වඩා ඉදිරියෙන් සිටියේ ක්‍රීඩකයකු ලෙසිනි.

දර්ශණ රුවන් දයානන්ද 2004 වර්ෂයේ අ.පො.ස. (සා/පෙළ) විභාගයට මුහුණ දී එහි ප්‍රතිඵල පැමිණීමටත් ප්‍රථම පාසල් ගමනින් සමුගෙන විවිධ රැකියාවන් කරන්නට පටන් ගත්තේ තමා විසින් තම පවුලට ඉටුවිය යුතු යුතුකම් නොපිරිහෙලා ඉටුකළ යුතුය යන ඒකායන බලාපොරොත්තුව ඇතිවය.

කුඩා කල සිටම රුදුරු ත්‍රස්තවාදයේ තාඩන පීඩන සියැසින් දැක අත්විඳ සිටි දර්ශණ රුවන් දයානන්ද නිසි වයසට එළඹෙත්ම වටහා ගත්තේ රටේ බෙදුම්වාදී තර්ජනය උඩුගම් බලා ගොස් ඇති බවයි. කුරිරු ත්‍රස්තවාදීන්ගේ ක්‍රියාකාරකම් හමුවේ බියවී පලායන නිවටයකු නොව අභීත සිංහයකු විය යුතු බව තරයේ සිතට ගත් වීර ලේ ඇති දර්ශණ රුවන් දයානන්ද දෙමාපිය, සහෝදර සහෝදරියන්ගේ ආශිර්වාදය මධ්‍යයේ වර්ෂ 2007 ක් වූ මැයි මස 09 වන දින, රට වෙනුවෙන් තම දිවි කැපකිරීමට සිතා නිවසින් එළියට බැස්සේ අභීත සිංහල වීරුවකුගේ චරිතයක් ආරූඪකර ගනිමිනි. දර්ශණ රුවන් දයානන්දගේ නික්ම යාමේ දුක නිවසට මෙන්ම මුළු ගමටම එකසේ දැනුණද සියල්ලන්ම ඔහුට ඉතසිතින් ආශිර්වාද කලේ හිතේ සියුම් සතුටක් සඟවාගෙනය.

ශ්‍රී ලංකා යුද්ධ හමුදා නිත්‍ය බලසේනාවේ ආධුනික සෙබළකු ලෙස එක් වූ දර්ශණ රුවන් දයානන්ද ආධුනික පාඨමාලාව හැදෑරීම සඳහා අනුරාධපුරයේ රණසේවාපුර 3 වන ශ්‍රී ලංකා සංඥා බලකා පුහුණු පාසල වෙත ඇතුලත් විය. දේශාභිමානයෙන් හා රට, ජාතිය, ආගම කෙරෙහි වූ ඇල්මෙන් පිරිපුන්ව සිටි දර්ශණ රුවන් දයානන්ද දක්ෂ ලෙස මෙන්ම ඉතා උනන්දුවෙන් ආධුනික පාඨමාලා අංක 16 නිමකලේ යුද භූමියට පියනගන්නේ කොයි මොහොතේදැයි



දයානන්ද කුඩා කාලයේදී

සිතේ තිබූ නොඉවසිලිමත්කම සමගිනි.

ආධුනික පාඨමාලාව සාර්ථකව හදාරා විසිරයාමෙන් අනතුරුව දර්ශණ රුවන් දයානන්දට හිමිවන්නේ ශ්‍රී ලංකා යුද්ධ හමුදාවේ ජ්‍යේෂ්ඨතම පාබල රෙජිමේන්තුව වූ ශ්‍රී ලංකා පාබල හමුදාවේ සාමාජිකත්වයයි. එම රෙජිමේන්තුවේ එවකට පැවති රණකාමී ඒකකයක් වූ 8 වන බලඇණිය ශ්‍රී ලංකා පාබල හමුදාව වෙත දර්ශණ රුවන් දයානන්දට ඇතුලත්වීමට හැකිවන්නේ වීරයන්ගේ සෙවණට තවත් වීරයකුගේ පැමිණීම සනිටුහන් කරමිනි. ඒකකයේ වීරයන් බිහිකළ කණ්ඩායමක් වූ "ඩී" කණ්ඩායමට අනුයුක්තව රාජකාරී කිරීම ආරම්භ කළ ඔහු එතැන් පටන් තමාට පැවරෙන කාර්යයන් මනාව ඉටුකරමින් බලඇණියේ සියලුදෙනා අතර ජනප්‍රියත්වයට පත්විය. කණ්ඩායමට මෙන්ම ඒකකයටද මහගු සේවයක් ලබාදුන් ඔහු ඒකකය සමඟ සේවය කළ අවුරුද්දක් වැනි කෙටි කාලයක් තුළදී "රණ වික්‍රම" පදක්කම ලබාගැනීම තුළින් ඔහුගේ වීරත්වය හා වික්‍රමාන්විත රණකාමීත්වය මනාව පිළිබිඹු වේ.

දර්ශණ රුවන් දයානන්ද රණවිරුවා වෙත "රණ වික්‍රම" පදක්කම පිරිනැමීමට හේතු වූයේ, ත්‍රස්තවාදීන්ගේ ප්‍රධාන සැපයුම් මාර්ගයක් වූ මඩුපල්ලිය හා පාලම්පිඩ්ඩි මාර්ගය අත්පත්කර ගැනීමේ ක්‍රියාන්විතයේදී, වර්ෂ 2007 ක් වූ ඔක්තෝබර් මස 10 වන දින ත්‍රස්තවාදීන් හා මුහුණට මුහුණලා ගැටෙමින් සිදුකළ වික්‍රමාන්විත මෙහෙය ඇගයීමටය.

වීරයින්ට කිසිදා වීරකම් සිදුනොකර සිටිය නොහැකිය. ඔවුන් බලාසිටින්නේ වීර වික්‍රමාන්විතයක සේයාවන් තමන් ඉදිරියේ රූප මවන තෙක්ය. දර්ශණ රුවන් දයානන්ද එබඳු වීරයකු වූ නිසාම සෑම විටම ඔහුට අවශ්‍ය වූයේ සටන්බිමට වැද සතුරාට එරෙහිව තම රණකාමීත්වය පිළිබිඹු කිරීමටය. ඔහුගේ බලාපොරොත්තු මල්ඵල ගන්වමින් වර්ෂ 2008 ක් වූ සැප්තැම්බර් මස 15 වන දින ඒකකය වෙත ඉතා දුෂ්කර වූ අභියෝගයක් ජයගැනීමේ හමුදා නියෝගයක් නිකුත් විය. එනම් "A9" ප්‍රධාන සැපයුම් මාර්ගයේ සිට කිළිනොච්චිය බටහිර දෙසට දිවෙන අක්කරායන්කුලම් මාර්ගය අත්පත්කර ගැනීමේ භාරදූර රාජකාරියයි. දර්ශණ රුවන් දයානන්ද රණවිරුවාද යුහුසුලුව තම බඩුබාහිරාදිය අසුරාගෙන තම පණ දෙවැනිකොට ආරක්ෂා කළ එම්පීඑම්ජී ස්වංක්‍රිය අවිය අතින් ගෙන තමාගේ බරට වඩා පතොරම් වැල් කරවටා ඔතාගෙන සටන්බිමට පිවිසියේ ලක්මාතාවට කෙනෙහිලිකම් කරන්නට එන ලේ පිපාසිත බෙදුම්වාදී ත්‍රස්තවාදීන් හට හොඳ පාඩමක් උගන්වමියි යන උදාරතර සිතුවිල්ල පෙරදැරි කොටගෙනය.

දර්ශණ රුවන් දයානන්ද ඇතුළු "ඩී" කණ්ඩායමේ හටපිරිස් හෝරා දෙකකට ආසන්න කාලයක් වැය කරමින් උපක්‍රමශීලීව හා ඉතා රහසිගතව සතුරු භූමිය වෙත ළඟාවී ක්‍රමානුකූලව ස්ථානගතව සුපරීක්ෂාකාරීව ඉදිරි නියෝග ලැබෙනතෙක් සතුරු බංකර් නිරීක්ෂණය කරන්නට වූයේ, සතුරාගේ හැසිරීමෙන් රණබිමේ බුද්ධිමත් සෙබළකුට බොහෝ කරුණු කාරණා දැනගැනීමට හැකියාව තිබූ නිසාය. එහිදී දර්ශණ රුවන් රාජකාරී කරමින් සිටියේ තම කණ්ඩායමෙහි සෙබළුනුත්, ඒ අසලම සිටි පළමුවන විශේෂ බලකායේ සෙබළුනුත් සම්බන්ධ වන ස්ථානයේය. කෙමෙන් කෙමෙන් කාලය ගෙවීගොස් පසුදින හිරු පායා එනතෙක් බලාසිටි දර්ශණ ප්‍රමුඛ රණවිරුවන්හට නොසිතූ විරූ ලෙස ත්‍රස්තවාදීන්ගේ කාලතුවක්කු, මෝටාර් හා සුළු අවි ප්‍රහාරයකට මුහුණදීමට සිදුවිය. එම ප්‍රහාරය හේතුවෙන් තම සහෝදර සෙබළුන් එකා දෙන්නා පොළොව සිපගනිද්දී තව තවත් අධිෂ්ඨානශීලීත්වයෙන් හා නිර්භීතභාවයෙන් සතුරාට ප්‍රහාර එල්ල කළ දර්ශණ සතුරු බළමුළු විනාශ කිරීමට අතිමහත් ධෛර්යයකින් යුතුව තම අවියේ බැරලය ගිනියම් වනතෙක් වෙඩි වරුෂාවක් එල්ල කරන ලදී.

විශේෂ බලකා සෙබළුන් හා උරෙන් උර ගැටෙමින් ත්‍රස්තවාදීන්ට ප්‍රතිප්‍රහාර එල්ල කරමින් සිටි දර්ශණ අසල සිටි

විශේෂ බලකා සෙබළුන් තිදෙනකු හට තුවාල සිදුවී ඇති බව දැක එම සහෝදර සෙබළුන් තිදෙනා සටන්බිමේ පසුපසට රැගෙන ගොස් ආරක්ෂිත ස්ථාන කරා පිටත්කර යළිත් තම ස්ථානය වෙතට පැමිණ දිගින් දිගටම තම එම්පීඑම්ජී අවියෙන් සතුරන් වෙත වෙඩි උණ්ඩ එල්ල කරන්නට වූයේ තම උපන්බිමෙන් එකදු බිම් අඟලක් හෝ ත්‍රස්තයින්ට නොදෙමියි යන උදාරතර සිතුවිල්ලෙනි. එම මොහොතේ නැවත සංවිධානය වූ සතුරු සමූහයක් එක රොදට ප්‍රහාර එල්ල කරමින් හටපිරිස් ස්ථානගතව සිටි ප්‍රදේශයට ඇතුල්වීමට උත්සාහ කළ අවස්ථාවේ ජාතික අභිමානයෙන් හා වීරත්වයෙන් ඔදවැඩී තම මව්බිමේ නිදහස වෙනුවෙන් තම දිවිය කැප කර හෝ තම භූමි ප්‍රදේශය ආරක්ෂාකර ගැනීමේ අටියෙන් ක්ෂණිකව ක්‍රියාත්මක වූ අභීත විරුවාණන් විශේෂ බලකා සෙබළුන් සිටි දිශාවට ගොස් තම අත තිබූ අවියෙන් වෙඩිපිට වෙඩි ප්‍රහාර එල්ල කරමින් සිදුවීමට ගිය මහ විනාශය වැළැක්වීය. එම ප්‍රහාරයත් සමඟින් අඩපණ වූ සතුරා පලවා හැරීම සඳහා විශේෂ බලකායට අයත් සෙබළකුද සමඟ එක්වූ දර්ශණ රුවන් දයානන්ද දිගින් දිගටම වෙඩි ප්‍රහාර එල්ල කරමින් යුදබිමේ ඉදිරියටම ගමන් කරන්නට වූහ. තම මව්පියන් සහෝදර සහෝදරියන් මොහොතකට අමතක කර දැමූ මෙම ශ්‍රේෂ්ඨ විරුවා තම ජීවිතය පිළිබඳ තිබූ ආශාවන් සියල්ල අතහැර, සතුරු භූමිය තුළට ඇතුළුවී ප්‍රහාර එල්ල කරමින් මුළු සටන් භූමියම තම අණසකට යටත් කරගැනීමට සමත්විය. සතුරු බලමුළු සීසීකඩ විසිර හිස් යූ යූ අත දිවයද්දී දර්ශණ රුවන් දයානන්දගේ වීර ක්‍රියාවෙන් ලොමුඩැහැගැන්ව කටුව තුළ සැඟවෙන ඉදිබුවන් මෙන් සැඟවී සිටි ත්‍රස්තයකුගේ අවියකින් පිටව ආ ගිනියම්වූ උණ්ඩයකින් දර්ශණ රුවන් දයානන්දගේ හදවත පසාරු වී මාතෘභූමිය තම උණුසුම් රුධිරයෙන් තහවමින් පොළොව සිපගත්තේ අභීත සිංහල පුතකුගෙන් ලක්මෑණියන්ට ඉටුවිය යුතු යුතුකම් නොපිරිහෙලා ඉටු කරමිනි. දර්ශණ රුවන් දයානන්ද එසේ තම ජීවිතය උදාරතර පූජාවක් ලෙස ලක්මෑණියන්ට පූජා කළේ අනේක වාරයක් මතු උපදින සංසාරයන්හි ලක්මෑණියන්ගේ තුරුලේම උපදින්නට වාසනාව ලැබේවායි ප්‍රාර්ථනා කරමිනි.


සහෝදර සොල්දාදුවන් වෙත එල්ලවී තිබූ දැවැන්ත ත්‍රස්ත ප්‍රහාරය අඩපණ කිරීමෙහිලා සිය ජීවිතය ගැන නොතකමින් දර්ශණ විශාල මෙහෙයක් ඉටුකර තිබිණ. ප්‍රහාරය හේතුවෙන් දරුණු ලෙස තුවාල ලබා සිටි සොල්දාදුවන් බොහොමයකගේ ජීවිත අද වනවිට සුරක්ෂිතව ඇත්තේ එදා දර්ශණ නිර්භයව සතුරා ඉදිරියට යමින් කළ වික්‍රමය හේතුවෙනි. වසර විස්සක් වැනි කෙටිකාලයක් ජීවත්ව සිය තාරුණ්‍යයෙන් වසරකට මදක් වැඩි කාලසීමාවක් ලක්මවකගේ ඒකීයභාවය නගාසිටුවීම වෙනුවෙන් කැපකළ දර්ශණ රුවන් දයානන්දගේ නම වීරත්වය යන්නට සමාන වචනයක් ලෙස දැක්විය හැකිය.

වර්ෂ 2008 ක් වූ සැප්තැම්බර් මස 15 වන දින කිලිනොච්චිය - අක්කරායන්කුලම් මාර්ගය සතුරු ග්‍රහණයෙන් මුදවාගැනීම සඳහා දියත් කළ මෙහෙයුමට ස්වේච්ඡාවෙන් ඉදිරිපත් වූ තලගිටියා ගමරාළලාගේ දර්ශණ රුවන් දයානන්ද විරුවා තම ජීවිතයද පරදුවට තබා සිය සහෝදර සෙබළුන්ගේ ජීවිත ආරක්ෂා කිරීම පිණිස ත්‍රස්තවාදීන් අතරට ගොස් ඔවුන් විනාශකර දැමීමේ වීර වික්‍රමාන්විතය උදෙසා ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ජනාධිපති වූද, සන්නද්ධ සේනාවන්හි සේනාධිනායක වූද අතිගරු මහින්ද රාජපක්ෂ මැතිතුමා විසින් වර්ෂ 2012 ක් වූ මැයි මස 19 වන දින ගාලු මුවදොරදී පැවති තෙවන විජයග්‍රාහී පෙළපාලියේදී මෙම වීර රණවිරුවාගේ නාමය වෙනුවෙන් ඔහුගේ මෑණියන් වෙත "පරම වීර විභූෂණය" පිරිනමන ලදී.

ඔහුගේ පියා සුපුරුදු රැකියාවේ නියැලෙමින් රෝහලේ කම්කරුවකු වශයෙන් ශ්‍රීපුර දිසා රෝහලේ රාජකාරී කරනු ලබන අතර, ඔහුගේ වැඩිමහල් නැගණිය වන ටීජී දිනුෂිකා මධුවන්ති විවාහකය. ටීජී හර්ෂ ප්‍රසාද් සිය වැඩිමහල් සොහොයුරාගේ අඩිපාරේ යමින් 2014 වර්ෂයේ යුද්ධ හමුදාව වෙත බැඳී දැනට 6 වන ශ්‍රී ලංකා ජාතික ආරක්ෂක බලමුළුව සමඟින් රාජකාරී කරනු ලබයි. ටීජී මධුශානි 7 වන ශ්‍රී ලංකා පාබල හමුදාවට අයත් රණවිරුවකු වන සෙ/326380 ලාන්ස් කෝප්‍රල් පෙරේරා ඩබ්ලිව්ඒඑස් රණවිරුවා සමඟ විවාහ වී සිටින අතර, මේ වනවිට ඇයද එක්දරු මවකි. දර්ශණ රුවන් දයානන්දගේ බාල සොහොයුරා සහ සොහොයුරිය වන ටීජී දිනේෂ් සඳරුවන් සහ ටීජී සුසුනිකා නිමන්ති දැනට තම වීර සොහොයුරා සිප්සතර හැදෑරූ ත්‍රිකුණාමලය පදවි පලුගස්වංගුව මහා විද්‍යාලයේම සිප්සතර හදාරමින් සිටියි. දර්ශණ රුවන් දයානන්දගේ අභාවය සිහිවන සැමවිටකම දෙනෙතට කඳුළැලි මෙන්ම සිතට මහත් වේදනාවක් ගෙනදුන්නද, උපන් දේශය රැකගැනීම වෙනුවෙන් ප්‍රාණදානය පුදකළ තම පුතුගේ වීර රණකාමීත්වය පිළිබඳ සිතට ඉමහත් ආඩම්බරයක් ඇතිවන බැව් වීර මාතාවක් වන චන්ද්‍රා ඥානගුරු මහත්මිය ප්‍රකාශ කරයි.

**දර්ශණ රුවන් දයානන්ද මගේ වැඩිමල් පුතා. එයාට පවුල ගැනයි රට ගැනයි ලොකු හැඟීමක් තිබුණ කෙනෙක්. ශ්‍රී පුර ජීවත් වුන අපිට යුද්දේ භයානකකම හොඳින්ම දැනුනා. ඒ නිසාම තමයි පුතා හමුදාවට බැඳුනේ. රට වෙනුවෙන් සටන් කරල යුද බිමේදී පුතා මියගිය දවසේ ඉඳලා මට දැනුන දුක කියන්න වචන නෑ. ඒත් දැන් මම සතුටු වෙනවා රට වෙනුවෙන් මගේ පුතා දිවි පුදා නියම වීරයෙක් වුනා නේද කියලා . ----මව**

*යුද්ධ හමුදා මූලස්ථානය මගින් ප්‍රකාශිත "උත්තමාචාරය" ග්‍රන්ථ උපුටා ගැනීමකි.*





# යුද්ධ හමුදාවේ ධීර බලැති
# වීර දියණියෝ



අතීතයේ කාන්තාවගේ භූමිකාව සීමාවී තිබුණේ මවගේ සහ ගෘහණියගේ භූමිකාවට පමණි. නමුත් දැන් ඒ භූමිකාවලින් ඔබ්බට ගොස් ඔවුන් මේ වනවිට විවිධ රැකියාවන්හි නිරතව සිටිති. සැබැවින්ම කිවහොත් කාන්තාව මේ වනවිට පුරුෂයින් හා කරට කර විවිධ වෘත්තීන්හි නිරතව සිටිති. "තොටිල්ල පැදවන අත ලොවම පාලනය කරයි" යන කියමන අද වෙනස් මානයකට රැගෙන ගොස් ආණ්ඩුකරණයෙන් ඔබ්බට ගොස් දැඩි අවදානම් සහගත රැ කියාවන්හි නිරත දිරිය කතුන් වර්තමාන සමාජයේ විවිධ ක්ෂේත්‍ර තුළ අපට දක්නට ලැබේ. ඇය සිතුවිලි සහ ආත්ම ශක්තිය පෙරදැරිව ජීවිතය නමැති නෞකාව පදවන්නට අභියෝග සුරතට ගත් දිරිය දියණියකි.

ශ්‍රී ලංකා යුද්ධ හමුදාවේද මෙලෙස අභියෝගවලට අභියෝග කරන විහාරමහාදේවී පරපුරේ සාමාජිකාවෝ පිරිසක් සිටිති. තම දිවි දෙවැනි කොට මව්බිම සුරැකීමට පෙරට ආ ඔවුන් සිය ආදර්ශ පාඨය කර ගත්තේ "සවිබල සිත් අවිබල දෙන්" මැයෙනි. ආරම්භයේදී ඔවුන් කාර්යාලයීය රාජකාරි සඳහා පමණක් යොදවා සිටියද කාලයාගේ



ඇවැමෙන් ඔවුන් යුද භූමියේ රාජකාරි සඳහාද යෙදවිණ. මේ අන් කවරකුත් නොව 1979 වර්ෂයේ සැප්තැම්බර් 01 දින ආරම්භ කරනු ලැබූ ශ්‍රී ලංකා යුද්ධ හමුදා කාන්තා බලකායේ වීර සෙබළියන්ය. එවකට යුද්ධ හමුදාධිපතිව සිටි ජෙනරාල් දේශමාන්‍ය ජේඊඩී පෙරේරාගේ මැදිහත් වීමෙන් සහ මගපෙන්වීමෙන් පළමුවන ශ්‍රී ලංකා යුද්ධ හමුදා කාන්තා බලකාය පිහිටුවන ලදී.

එලෙස පිහිටවූ පළමුවන යුද්ධ හමුදා කාන්තා බලකායේ අරමුණ වූයේ කාර්යාල රාජකාරි කටයුතුවල යොදවා සිටි සහෝදර සෙබළුන් යුද බිමේ රාජකාරි සහ ක්ෂේත්‍ර රාජකාරි සඳහා මුදවා හැරීමය. එම බලකායේ පුහුණුවීම් සිදුකිරීම සඳහා බ්‍රිතාන්‍ය රාජකීය කාන්තා බලකායේ උපදේශිකාවක් වූ මේජර් ජේ එල් ලෝසන් දිවයිනට පැමිණීමත් බ්‍රිතාන්‍ය රාජකීය යුද්ධ හමුදාවේ මගපෙන්වීම් යටතේ නිලධාරීන් තිදෙනකුගෙන් සමන්විත ප්‍රථම කාන්තා කැඩෙට් නිලධාරිනීන් කණ්ඩායම බ්‍රිතාන්‍යයේදී පුහුණුව ලැබීමත් සමග කාන්තා බලකාය ආරම්භ විය.

ඒ අනුව ලුතිනන් කර්නල් කේසී වීරසේකර (විශ්‍රාමික) පළමු යුද්ධ හමුදා නිලධාරිනිය සහ ප්‍රථම කාන්තා අණදෙන නිලධාරිනිය ලෙස ඉතිහාසයට එක්වන අතර කෝප්‍රල් එම් එල් කේ ආර් විල්සන් (විශ්‍රාමික) පළමු කාන්තා සෙබළිය ලෙස එක් වෙයි.

ම්ලේච්ඡ ත්‍රස්තවාදය ව්‍යාප්තවීමත් සමග ඇති වූ ජාතික අවශ්‍යතාවයට උරදෙමින් මාතෘභූමියේ ස්වෛරීභාවය රකිනු වස් සෙබළුන් සහ උරෙනුර ගැටී ක්ෂේත්‍ර රාජකාරි ඉටුකිරීමේ අභිලාසයෙන් දෙවැනි ස්වේච්ඡා කාන්තා බලකායත් ඉන් අනතුරුව තුන්වන, හතරවන, පස්වන හා හයවන ස්වේච්ඡා ඒකක හා හත්වන නිත්‍ය කාන්තා ඒකකය ස්ථාපනය කිරීමත් සමග ශ්‍රී ලංකා යුද්ධ හමුදා කාන්තා බලකායේ මෙහෙවර තව තවත් පුළුල් විය.

කුරිරු ත්‍රස්තවාදය හේතුවෙන් කාන්තා බලකායේ නිලධාරිනියන් සහ සෙබළියන් සැලකිය යුතු ප්‍රමාණයක් තුවාල ලැබූ අතර වීරෝදාර සෙබළියන් විසිපස් දෙනකු දේශයේ නාමයෙන් තම අවසන් සුසුම් වාතලයට මුසු කළෝය. එලෙස යුද බිමේදී දිවිපිදූ වීරවරියන් අතර සැරයන් පීබීඑස් පුෂ්පමාලා, කෝප්‍රල්වරියන් වන එච් ආරියවතී සහ අයිඑම්බී පද්මා කුමාරි සහ ලාන්ස් කෝප්‍රල්වරියන් වන එච්.එම් රූපවතී, යූපීඩී කුමුදුනී, ආර්සී ස්වර්ණලතා, අයිඑන් සිල්වා, ආර්එම් අජන්තා, එස් ශ්‍රියානි දීපිකා, එන්ජී කලුවිල්ලආරච්චි, කේපීඑන් අබේසිංහ, එන්බීපීඑස්කේ ධර්මවර්ධන, යූඩී නයනා තුෂාරි, ආර්එම්ටීකේ දිලිනි රත්නායක, ඩබ්ලිව්පී විජේසුන්දර, ආර්එම්පී රත්නායක, පීආර්එස් මල්කාන්ති, එච්බීඩබ්ලිව් දමයන්ති, ඩීඑස්එස්පී ගුණතිලක, පීඑන් පියදාස, එම්කේජ් දිල්රුක්ෂි, ආර්එම් නිලංකා කුමාරි, එච්එම්එල් සෙව්වන්දි, එස්එම්පීකේඩී ගොඩකුඹුර, පීවීඩී විජේවර්ධන වෙති.

2009 පෙබරවාරි 09 වැනි දින විශ්වමඩු ධර්මපුරම් ප්‍රදේශයේ සිවිල් ජනතාව මුදාගැනීමේ මානුෂීය මෙහෙයුමේ යෙදී සිටියදී එල්ටීටීඊ ත්‍රස්තවාදීන්ගේ මරාගෙන මැරෙන බෝම්බ ප්‍රහාරයකට ලක්ව ජීවිතක්ෂයට පත්වූ කාන්තා සෙබළ ආර්එම් නිලංකා කුමාරි, කාන්තා සෙබළ එච්එම්එල් සෙව්වන්දි , කාන්තා සෙබළ



එස්එම්පීකේඩී ගොඩකුඹුරටත් ඔවුන් සමඟ එම ප්‍රහාරයට මුහුණ දුන් මේජර් ඩබ්ලිව්වීකේ වීරක්කොඩි, කාන්තා සෙබළ එම්ඩබ්ලිව්එන්කේ ධර්මසිරි, කාන්තා සෙබළ ශානිකා ද සිල්වා, කාන්තා සෙබළ එච්ජීස් රණතුංග යන අයටත් රණශූර පදක්කම් පිරිනමා ඇත. එසේම, මාංගළුන්තු ප්‍රදේශයේදී රැකසිට පහරදීමක් අතරතුර එල්ටීටීඊ නායකයන් ඇතුළුව එල්ටීටීඊ සාමාජිකයින් පිරිසක් සමඟ ඇතිවූ ගැටුම සාර්ථකව වාර්ථ කිරීම නිසා බලලත් නිලධාරී II පීආර්එස්එම් විජේසිංහ වෙත ද රණශූර පදක්කම පිරිනමා තිබේ.

එලෙස ශ්‍රී ලංකා යුද්ධ හමුදා කාන්තා බලකාය සිය දායකත්වය සපයද්දී යුද්ධ හමුදාවේ තවත් රෙජිමේන්තු රැසකට සිය මෙහෙවර ඉටුකර තිරය පිටුපස හිඳිමින් වීරවරියන් රැසක් මව්බිම වෙනුවෙන් තම සොඳුරු තරුණ විය කැප කළහ. යුද සමයේදී ශ්‍රී ලංකා යුද්ධ හමුදා පොදු සේවා බලකාය, ශ්‍රී ලංකා යුද්ධ හමුදා වෛද්‍ය බලකාය, ශ්‍රී ලංකා යුද්ධ හමුදා සංඥා බලකාය, ශ්‍රී ලංකා යුද්ධ හමුදා පොලිස් සේවා බලකාය, ශ්‍රී ලංකා යුද්ධ හමුදා සන්නද්ධ බුද්ධි බලකාය ආදියට බැඳී කාන්තා



නිලධාරිනියන් හා සෙබළියන් වශයෙන් ඉටුකළ සේවය සුළුපටු නොවේ. ඊට අමතරව මේ වනවිට ඉංජිනේරු සේවා බලකාය, කෘෂිකර්ම සහ පශු සම්පත් බලකාය සහ යුද්ධෝපකරණ බලකායත් කාන්තා නිලධාරීන් සහ සෙබළියන් මේ වනවිට සේවයේ යොදවා සිටී.

මේ වනවිට සක්‍රීය සේවයේ නියුතු ජ්‍යේෂ්ඨතම හමුදා නිලධාරිනිය වන්නේ විකිරණ රශ්මි විශේෂඥ වෛද්‍ය බ්‍රිගේඩියර් ඩීටීඑන් මුණසිංහයි. ඇය 1996 වර්ෂයේ දී ශ්‍රී ලංකා යුද්ධ හමුදාව සමඟ එක් වූවාය.

එපමණක් නොව ශ්‍රී ලංකා යුද්ධ හමුදාවේ කාන්තා නිලධාරිනියන් සහ සෙබළියන් මේ වනවිටත් එක්සත් ජාතීන්ගේ සාමසාධක රාජකාරීවල නිරතව සිටිති. වර්තමානයේ දෙවන (ස්වේච්ඡා) ශ්‍රී ලංකා යුද්ධ හමුදා පොදු සේවා බලකායේ අණදෙන නිලධාරිනිය ලෙස කටයුතු කරන මේජර් කේඑච්ඩී මෙන්ඩිස් සහ මේජර් එල්ආර්ටීඑන් ලියනගේ (විශ්‍රාමික) එක්සත් ජාතීන්ගේ සාම සාධක රාජකාරී සඳහා එක්වූ පළමු ශ්‍රී ලංකා යුද්ධ හමුදා නිලධාරිනියන් ලෙසින් ඉතිහාසයට එක්වෙයි.

ශ්‍රී ලංකා යුද්ධ හමුදා කාන්තා නිලධාරිනීන් සහ සෙබළියන් අභියෝගවලට අභියෝග කරන්නට උපන් හපන්කම් දක්වති. එලෙස අභියෝගවලට අභියෝග කරමින් ශ්‍රී ලංකා යුද්ධ හමුදාවේ සෙබළියෝ මේ වනවිට පැරෂුට් පැනීමේ ක්‍රීඩාවේ නිරතව සිටිති. ශ්‍රී ලංකා යුධ හමුදා පැරෂුට් ඉතිහාසයට තවත් පරිච්ඡේදයක් විවර කරමින් ශ්‍රී ලංකා යුද්ධ හමුදා කාන්තා බලකායට අයත් නිලධාරිනියකු සහ සෙසුනිලයින් 03 දෙනකු මූලික පැරෂුට් පාඨමාලාව සාර්ථකව හැදෑරූ අතර, එහිදී කපිතාන් වීඑම්එස්. විදානගමගේ (විශ්‍රාමික), කෝප්‍රල් ආර්ජීඑන් හේමන්ති (විශ්‍රාමික), කෝප්‍රල් ජේඑම් කහවල (විශ්‍රාමික) ශ්‍රී ලංකාවේ ප්‍රථම කාන්තා පැරෂුට් භටයින් ලෙස ඉතිහාසයට එක්වූ අතර කෝප්‍රල් ආර්ජීඑන් හේමන්ති (විශ්‍රාමික) පළමු නිදහස් ආර පැරෂුට් පාඨමාලාව හැදෑරූ සෙබළිය ලෙස ඉතිහාසයට එක් විය.

ආරක්ෂක මාණ්ඩලික ප්‍රධානී හා යුද්ධ හමුදාධිපති ගේ සංකල්පයකට අනුව ක්‍රියාත්මක කරන මානුෂවාදී බිම්බෙඩි කෙත් නිසැක කිරීමේ පුහුණුව සඳහා ශ්‍රී ලංකා යුද්ධ හමුදා කාන්තා බලකායේ නිලධාරිනියන් දෙදෙනකු සහ සෙබළියන් 28 දෙනකු වව්නියාව පිහිටි ඉංජිනේරු බලසේනා මූලස්ථානයේ පුහුණුවීම්වලට යොමු කරන ලදී. මූලික ක්ෂේත්‍ර ඉංජිනේරු පාඨමාලාවකින් අනතුරුව ඔවුන් මානුෂවාදී බිම්බෙඩි කෙත් නිසැක කිරීමේ පුහුණුව සඳහා යොමු කිරීමට නියමිතය. පුහුණුවෙන් පසුව ඔවුන් ක්ෂේත්‍ර පුහුණුව සඳහා යොමු කරන අතර ඔවුන් අනාගතයේ දී එක්සත් ජාතීන්ගේ සාම සාධක රාජකාරී සඳහා ද යොමු කිරීමේ හැකියාව පවතින බව ශ්‍රී ලංකා යුද්ධ හමුදාව පවසයි.

ශ්‍රී ලංකා යුද්ධ හමුදාවේ කාන්තා බලකාය නියෝජනය කරන මේ වනවිට ශ්‍රී ලංකා යුද්ධ හමුදාවේ කමාන්ඩෝ රෙජිමේන්තුවෙන් විශේෂ ආධාරක බණ්ඩ පුහුණු පාඨමාලාවේ සුවිශේෂී පුහුණුවක් ලබා සිටින සහ මේ වනවිට පුහුණු වෙමින් සිටින පිරිසක්ද ශ්‍රී ලංකා යුද්ධ හමුදාව සතුය. මෙරට උපාය මාර්ගික ස්ථාන, ඉහළ වටිනාකමක් ඇති ස්ථාන, විශේෂ පුද්ගල ආරක්ෂාව හා විශේෂිත මෙහෙයුම් රාජකාරීවල යෙදවීමේ අරමුණින් විශේෂ මෙහෙයුම් සිදුකිරීමට අවශ්‍ය කුසලතාවයෙන් සපිරි කාන්තා නිලධාරීන් සහ සෙබළියන් බිහිකිරීම වෙනුවෙන් මේ පුහුණුව සිදු කෙරේ. 2016 වර්ෂයේදී මෙම විශේෂ ආධාරක බණ්ඩ පුහුණු පාඨමාලාවේ පළමු පාඨමාලාව පවත්වා ඇති අතර,







යුද්ධ හමුදාධිපති ගේ උපදෙස් මත ආරම්භ කළ එහි දෙවැනි පාඨමාලාව මේ වනවිට කුඩාඔය කමාන්ඩෝ රෙජිමේන්තු පුහුණු පාසලේදී ක්‍රියාත්මකය. විශේෂ ක්‍රියාන්විත ආධාරක බණ්ඩ පාඨමාලාව සාර්ථකව හදාරනු ලැබූ නිලධාරිනියන් හා සෙබළියන් හට දුඹුරු පැහැති කාන්තා බලකාය සඳහා විශේෂිත හිස්වැස්ම යුද්ධ හමුදාපති විසින් ලබාදෙන අතර, පාඨමාලාව සාර්ථකව හැදෑරීම වෙනුවෙන් හිමි නිල ලාංඡනය නිල ඇඳුමෙහි පැළඳවීමෙන් පසු ඔවුන් පරිපූර්ණ පුහුණුව ලත් විශේෂ ක්‍රියාන්විත ආධාරක බණ්ඩ සාමාජිකාවන් ලෙස විසිර යනු ලැබේ.

එසේම, ශ්‍රී ලංකා යුද්ධ හමුදාවේ කාන්තා නියෝජනයන් විසින් ක්‍රීඩා ක්ෂේත්‍රයද දිග්විජය කර ඇත. මෙරට පළමු ඔලිම්පික් පදක්කම්ලාභිනිය වන කෙටිදුර ධාවනශූරී සුසන්තිකා ජයසිංහ ශ්‍රී ලංකා යුද්ධ හමුදාවේ සාමාජිකාවකි. එසේම, අවසන්වරට නේපාලයේ පැවැත් වූ දකුණු ආසියානු ක්‍රීඩා තරඟාවලියේ දී රන් පදක්කම් ත්‍රිත්වයක් දිනාගත් දිල්ෂි කුමාරසිංහත් ශ්‍රී ලංකා යුද්ධ හමුදා නියෝජනයකි. එසේම එම තරඟාවලියේදීම රන් පදක්කම් දිනූ නිලානි රත්නායක, සාරංගි සිල්වා, ලක්ෂිකා සුගන්ධි, නදීෂා ලේකම්ගේ, ලක්ෂාණි විදූෂාත් ශ්‍රී ලංකා යුද්ධ හමුදා නියෝජනයන්ය. මේ අතලොස්සක් පමණි.

තම මවට දියණියක් වූ තම දරුවන්ට මවක් වූ ඇය ඒ සියලු යුතුකම් පසෙකලා අවසන් මානුෂීය මෙහෙයුමේ දී ත්‍රස්තවාදී ග්‍රහණයෙන් මුදාගත් අහිංසක සිවිල් වැසියන් හට විටෙක මවක්ද, විටෙක සොහොයුරියක්ද, තවත් විටෙක හෙදියක්ද වෙමින් සිදුකළ ප්‍රශංසනීය මෙහෙවර සියලු ලක්වාසීන්ගේ පැසසුමට ලක්විය.



ලුතිනන් දිලංක ගුණතිලක,
ජනමාධ්‍ය අධ්‍යක්ෂ මණ්ඩලය
යුද්ධ හමුදා මූලස්ථානය

# දිවි සුරැකි විරු මෙහෙවර





ආරක්ෂක සේනා මූලස්ථානය (මුලතිව්) යටතේ ඇති 64 වන පාබල සේනාංකය වෙතින් පාලනය වන 642 වන පාබල බලසේනා බලප්‍රදේශයේ පිහිටි උරුන්බන්කුලම් ජලාශයේ සිවිල් වැසියන් 03 දෙනකු ඉකුත් අප්‍රේල් 05 වන දින දියේ ගිලී ඇත. එම දියේ ගිලුනු පුද්ගලයින්ගේ කෑගැසීමේ ශබ්දය ඇසී 642 වන පාබල බලසේනා හටපිරිස් එම ස්ථානයට ඉතා ඉක්මනින් පැමිණි අතර, එහිදී මේජර් එච්පීඑස්පී පීරිස් හා ලා/කෝ වෙලබඩගේ ඩබ්ලිව්එස් විසින් ජලයේ ගිලෙමින් සිටි පුද්ගලයින් දෙදෙනකු බේරාගනු ලැබූහ. දියේ ගිලුනු අනෙක් පුද්ගලයා හා ඔවුන් ගිය ඔරුව සමඟ අතුරුදහන් වී ඇති අතර, ඔඩ්ඩුසුඩාන් පොලීසිය හා සිවිල් ජනතාව සමඟ 642 වන පාබල බලසේනාවේ හටපිරිස් එකතුව පසුව ඔහුගේ මළ සිරුරද සොයාගන්නා ලදී.

# මිතුරාද හතුරාද



මා මගේ මිතුරන්ට බෙහෙවින් ණයගැතිය. එහෙත් සියල්ල සලකා බලන විට සතුරන්ට ඊට වඩා ණය ගැතිය. නියම පුද්ගලයා පණ ලබන්නේ දණ්ඩ කිරීමකින් විනා තුරුල්කර ගැනීමකින් නොවේ.

- ආන්ද්‍රේගයිඩ් -

# මාහැඟි පරිත්‍යාගයක්





55 වන පාබල සේනාංක බලප්‍රදේශයට අයත් වේම්බඩක්කේණි බලප්‍රදේශයේ තෝරාගත් පවුල්වල පාසල් ළමුන් 115 දෙනකු සඳහා රුපියල් 604,665.00 ක වටිනාකමින් යුත් පාසල් උපකරණ කට්ටල 115 ක්, තෝරාගත් පවුල් 50 ක් සඳහා වියළි සලාක ඇසුරුම් මළු 50 ක් සහ පොල් පැළ 150 ක් පරිත්‍යාග කිරීමේ වැඩසටහනක් ආරක්ෂක සේනා (යාපනය) ආඥාපති මේජර් ජෙනරාල් ඩීජීඑස් සෙනරත් යාපා ආර්ඩබ්ලිව්පී ආර්එස්පී එන්ඩීයූ ගේ ප්‍රධානත්වයෙන් ඉකුත් අප්‍රේල් 08 වන දින වේම්බඩක්කේණි සීසීටීඑම් විද්‍යාලයේ දී පවත්වන ලදී.

55 වන පාබල සේනාංකාධිපති බ්‍රිගේඩියර් එම්කේයූපී ගුණරත්න ආර්එස්පී එන්ඩීයූ පීඑස්සී අයිජී ගේ උපදෙස් මත 522 වන පාබල බලසේනාධිපති බ්‍රිගේඩියර් ආර්පී මුනිපුර ආර්ඩබ්ලිව්පී ආර්එස්පී ගේ අධීක්ෂණය යටතේ 23 වන ගැමුණු හේවා බළඇණියේ හා 1 වන යාන්ත්‍රික පාබල රෙජිමේන්තුවේ ශ්‍රම දායකත්වයෙන් මෙම වැඩසටහන සංවිධානය කරන ලදී. මෙම මාහැඟි කටයුත්ත සඳහා *Tropicoir Lanka* ආයතනයේ කළමනාකාර අධ්‍යක්ෂ දිනේෂ් ප්‍රනාන්දු මහතා විසින් මූල්‍ය දායකත්වය සැපයීය. මෙම අවස්ථාව සඳහා පච්චපලෙයි සහකාර ප්‍රදේශීය ලේකම්, අධ්‍යාපන අධ්‍යක්ෂ, 55 වන පාබල සේනාංකාධිපති, 551 වන පාබල බලසේනාධිපති, පලෙයි පොලිස් ස්ථානාධිපති, වේම්බඩක්කේණි සීසීටීඑම් විද්‍යාලයේ විදුහල්පති ඇතුළු ආචාර්ය මණ්ඩලය, රාජ්‍ය නිලධාරීන්, දෙමාපියන් හා යුද හමුදා සාමාජිකයින් පිරිසක් සහභාගී වූහ.

# හිසට සෙවණක්





ආරක්ෂක සේනා මූලස්ථානය (යාපනය) බලප්‍රදේශයේ ක්‍රියාත්මක හිසට සෙවණක් නිවාස ව්‍යාපෘතියේ තවත් එක් අදියරක් යටතේ යාපනය පේදුරුතුඩුව ප්‍රදේශයේ ඉදිකළ නව නිවසක් ආරක්ෂක සේනා (යාපනය) ආඥාපති මේජර් ජෙනරාල් ඩීජීඑස් සෙනරත් යාපා ආර්ඩබ්ලිව්පී ආර්එස්පී එන්ඩීයූ ගේ ප්‍රධානත්වයෙන් ඉකුත් මාර්තු 21 වන දින නිවාසලාභීන් වෙත පරිත්‍යාග කරන ලදී. ජේ/405, තුම්පලේ (නැ) හි පදිංචි එල්ටීටීඊ සංවිධානයේ සාමාජිකාවක්ව සිට පුනරුත්ථාපනය වූ නිරෝජන් යෝහම් මහත්මිය වෙනුවෙන් ඉදිකරන ලද මෙම නිවසේ ඉදිකිරීම් කටයුතු සඳහා මූල්‍ය දායකත්වය විශ්‍රාමික මේජර් ජෙනරාල් රවී රත්නසිංහම් ගේ සම්බන්ධීකරණයෙන් කොළඹ රාජකීය විද්‍යාලයේ 1980 (දමිළ මාධ්‍ය) කණ්ඩායම නියෝජනය කරමින් වෛද්‍ය වල්ලිපුරම් ශිවකුමාර් මහතා විසින් ලබාදෙන ලදී. 16 වන ශ්‍රී ලංකා සිංහ රෙජිමේන්තුවේ භටපිරිස් විසින් මෙම නිවසේ ඉදිකිරීම් කටයුතු සිදුකරනු ලැබූහ. මෙම උත්සව අවස්ථාවේදී ආඥාපති විසින් පාසල් දරුවන්ගේ අධ්‍යාපන කටයුතු සඳහා පාසල් උපකරණ හා වියළි සලාක පරිත්‍යාගයක්ද සිදුකරනු ලැබීය.

# සංවත්සර දිනය අභිමානවත්ව සමරයි



ආරක්ෂක සේනා මූලස්ථානය (වන්නි) හි 24 වන සංවත්සරය එහි ආඥාපති මේජර් ජෙනරාල් සීඩී රණසිංහ ආර්ඩබ්ලිව්පී ආර්එස්පී ගේ ප්‍රධානත්වයෙන් ඉකුත් මාර්තු 18 වන දින අභිමානවත් ලෙස පැවැත්විණ.

ආරක්ෂක සේනා මූලස්ථානයේදී පැවති එම සංවත්සර උළෙලට සමගාමීව සාංඝික දානයක් හා බුද්ධ ප්‍රතිමාවක් තැන්පත් කිරීමද ආඥාපතිගේ මූලිකත්වයෙන් සිදුවිය. එසේම, කඳවුරු සම්මාන මුරයක් සහ සම්මාන ආචාර පෙළපාළියක් ද සියලු නිල දිවා භෝජන සංග්‍රහයක් ද සංවත්සර දින පැවති වැඩසටහන් අතර කැපීපෙණුනි. තවද, අභිමංසල 1 හි නේවාසික ප්‍රතිකාර ලබන ආබාධිත රණවිරුවන් හට තේ පැන් සංග්‍රහයක් ද පිරිනැමුණි.





# නිරීක්ෂණ චාරිකාවක නිරතවෙමින්





ආරක්ෂක සේනා (වන්නි) ආඥාපති මේජර් ජෙනරාල් සීඩී රණසිංහ ආර්ඩබ්ලිව්පී ආර්එස්පී පම්පෙමඩු පිහිටි පුහුණු පාසලේ හි ඉකුත් මාර්තු මස 14 වන දින කඳවුරු සංචාරයක නිරත විය. කොවිඩ් 19 වසංගත තත්වය හේතුවෙන් එහි බළඇණි පුහුණු කිරීම් පාඨමාලා දිගුකාලීනව නවතා තිබූ බැවින් එම වසංගත තත්වය අඩුවීමේ ප්‍රවණතාව මත නැවත ඉකුත් පෙබරවාරි 14 වන දින බළඇණි පුහුණු කිරීම් පාඨමාලා ආරම්භ කරන ලදී. 8 වන විජයබාහු පාබල රෙජිමේන්තුව මේ වනවිටත් එහි පුහුණු කටයුතු අරඹා ඇත. එම සංචාරයේදී ආඥාපති විසින් එහි සියලු නිලයින් අමතා යුද හමුදාවේ ප්‍රතිරූපය තහවුරු කිරීම සඳහා පුහුණුව, විනය සහ යහපත් හැසිරීම්වල වැදගත්කම අවධාරණය කරන ලදී.

# "*Lake View Unnichchai*" නිවාඩු බංගලාව විවෘත කෙරේ








මඩකලපුව උන්නච්චිය ප්‍රදේශයේ ස්ථානගත 4 වන ගැමුණු හේවා බලඇණියේ සියලු නිලයින්ගේ දායකත්වය මත එම බලඇණි මුලස්ථාන පරිශ්‍රයේ සුන්දර පරිසරයක ඉදිකරන ලද "*Lake View Unnichchai*" නිවාඩු බංගලාව ඉකුත් මාර්තු මස 21 වන දිනය යෙදුනු සුබ මොහොතින් ආරක්‍ෂක සේනා (නැගෙනහිර) ආඥාපති හා ගැමුණු හේවා බලකායේ රෙජිමේන්තු අධිපති මේජර් ජෙනරාල් පීඑම්එල් චන්ද්‍රසිරි ආර්ඩබ්ලිව්පී ආර්එස්පී එන්ඩියූ ගේ සුරතින් විවෘත කරන ලදී. සුන්දර උන්නච්චිය වැව් තාවුල්ලේ පිහිටි කාමර තුනකින් සමන්විත මෙම "*Lake View Unnichchai*" නිවාඩු බංගලාව මඩකලපුව ප්‍රදේශයේ සංචාරය කරන යුද්ධ හමුදා සාමාජිකයින්ගේ පවුල්වල සාමාජිකයින් හා සිවිල් අයවලුන් සඳහා විවෘතව තැබෙනු ඇත.

# පාපැදි පරිත්‍යාග කිරීමක්

232 වන පාබල බලසේනාව සහ 12 වන ශ්‍රී ලංකා ජාතික ආරක්‍ෂක බළමුළුවේ භටපිරිස් විසින් කායන්කුඩා, තිකිලිවෙට්ටායි පාසලේ අඩු ආදායම්ලාභී පවුල්වල පාසල් සිසුන් 15 දෙනකු සඳහා පාපැදි පරිත්‍යාග කරන ලදී.

232 වන පාබල බලසේනාධිපති ගේ මගපෙන්වීම යටතේ, 12 වන ශ්‍රී ලංකා ජාතික ආරක්ෂක බළමුළුවේ අණදෙන නිලධාරී විසින් දිළිඳු පවුල්වල සිසුන් තෝරාගැනීමෙන් පසු පාපැදි පරිත්‍යාග කිරීමේ වැඩසටහන සංවිධානය කරන ලදී. මේ සඳහා ජනක සමරසේකර මහතා, ඕස්ට්‍රේලියාවේ වෙසෙන නිමාලි දිසානායක මහත්මිය සහ එක්සත් රාජධානියේ වෙසෙන උදය කුමාර මහතා එම පාපැදි මිලදී ගැනීමට මූල්‍ය අනුග්‍රහය ලබාදෙනු ලැබූහ.

ආරක්‍ෂක සේනා (නැගෙනහිර) ආඥාපති හා ගැමුණු හේවා බලකායේ රෙජිමේන්තු අධිපති මේජර් ජෙනරාල් පීඑම්එල් චන්ද්‍රසිරි ආර්ඩබ්ලිව්පී ආර්එස්පී එන්ඩියූ ප්‍රධානත්වය දැරූ මෙම අවස්ථාවට 23 වන පාබල සේනාංකාධිපති මේජර් ජෙනරාල් කේඑන්එන් කොස්වත්ත ආර්ඩබ්ලිව්පී ආර්එස්පී එන්ඩියූ ඇතුළු නිලධාරීන් සහ සෙසුනිලයන් පිරිසක් සහභාගී වූහ.






# සේනාංක සංචාරයක්





1 වන බලකායේ බලකාධිපති මේජර් ජෙනරාල් ඒකේජීකේයූ ඥානරත්න එන්ඩීසී පීඑස්සී සිය නව තනතුරේ රාජකාරි භාර ගැනීමෙන් පසු ඉකුත් මාර්තු 01 වන දින තම පළමු නිල සංචාරය ලෙස 58 වන පාබල සේනාංකයේ සංචාරය කරන ලදී.

එහිදී, එම සේනාංකයේ නිලධාරීන් සහ සෙසුනිලයින් ඇමතූ බලකාධිපති ජාතික ආරක්‍ෂාව ඉටුකිරීමේදී ප්‍රදේශයේ හටපිරිස්වලට මුහුණපෑමට සිදුවන අභියෝග සහ එහිදී ක්‍රියාකළ යුතු ආකාරය සිහිපත් කරන ලදී. තවද, එම කටයුතු කැපවීමෙන් ඉටුකිරීමේ වැදගත්කම සහ නිරන්තර පුහුණුව ලැබීම තුළින් ඔවුන්ගේ වෘත්තීය කුසලතා ප්‍රවර්ධනය කිරීමේ වැදගත්කමද අවධාරණය කළේය. මෙම අවස්ථාව සඳහා 58 වන පාබල සේනාංකාධිපති මේජර් ජෙනරාල් එස්ආර්බී අලුවිහාරේ ආර්ඩබ්ලිව්පී ආර්එස්පී එන්ඩීයූ පීඑස්සී ඇතුළු නිලධාරීන් පිරිසක් සහභාගී වූහ.

# පූජාසත්කාරක වැඩසටහනක්



57 වන පාබල සේනාංකය යටතේ ඇති 572 වන පාබල බලසේනා බලප්‍රදේශයේ ධර්මපුරම් හි පිහිටි නමඃශිවය වැඩිහිටි නිවාසයේ සිටින වැඩිහිටියන් 25 දෙනකු සඳහා දිවා ආහාර වේලක් ලබාදීමේ වැඩසටහනක් ආරක්‍ෂක සේනා (මුලතිව්) ආඥාපති මේජර් ජෙනරාල් ඩබ්ලිව්ජීඑස්එස් වනසිංහ ආර්එස්පී යූඑස්පී එන්ඩීයූ ගේ ප්‍රධානත්වයෙන් ඉකුත් අප්‍රේල් 13 වන දින සංවිධානය කරන ලදී. 57 වන පාබල සේනාංකාධිපති ගේ පූර්ණ අධීක්‍ෂණය යටතේ 14 වන ශ්‍රී ලංකා ජාතික ආරක්‍ෂක බලමුළුව විසින් මෙම වැඩසටහන ක්‍රියාත්මක කරන ලදී.



# සිවිල් සේවක මහතුන් වෙත පරිත්‍යාගයක්





ආරක්ෂක සේනා (මුලතිව්) ආඥාපති ගේ අදහසකට අනුව එම මූලස්ථානයේ රාජකාරි කරනු ලබන සිවිල් සේවක මහතුන් 19 දෙනකු සඳහා සිංහල හා දෙමළ අලුත් අවුරුද්ද වෙනුවෙන් රු. 5000.00 ක් වටිනා වියළි සලාක බෙදාදීමේ වැඩසටහනක් ඉකුත් අප්‍රේල් 11 වන දින එම ආරක්ෂක සේනා මූලස්ථාන ප්‍රධාන දේශන ශාලාවේදී පවත්වන ලදී. මෙම පරිත්‍යාග සඳහා එම මූලස්ථාන රෙජිමේන්තු සාජන්ට් (ආර්ඒස්) වෙතින් රු. 169,818.00 ක මුදලක් වැයදරා තිබිණි. ආඥාපති මේජර් ජෙනරාල් ඩබ්ලිව්ඒඑස්එස් වනසිංහ ආර්එස්පී යූඑස්පී එන්ඩීයූ ගේ ප්‍රධානත්වයෙන් පැවැත්වූ මෙම වැඩසටහනට එම මූලස්ථානයේ නිලධාරීන් සහ සෙසුනිලයින් රැසක් එක්වූහ.

# ශ්‍රී ලංකා සිංහ රෙජිමේන්තු අන්තර් ඒකක මලල ක්‍රීඩා තරඟාවලිය







ආරක්ෂක සේනා (බටහිර) ආඥාපති මෙන්ම ශ්‍රී ලංකා සිංහ රෙජිමේන්තුවේ රෙජිමේන්තු අධිපති මේජර් ජෙනරාල් කේ ලියනගේ ආර්ඩබ්ලිව්පී ආර්එස්පී එන්ඩීයූ ගේ මඟපෙන්වීම යටතේ ශ්‍රී ලංකා සිංහ රෙජිමේන්තු අන්තර් ඒකක මලල ක්‍රීඩා තරඟාවලිය එම රෙජිමේන්තුවට අයත් නිත්‍ය සහ ස්වේච්ඡා ඒකක 19 ක සහභාගීත්වයෙන් යුතුව ඉකුත් මාර්තු 26, 27 සහ 28 යන දිනයන්හිදී මහනුවර බෝගම්බර ක්‍රීඩාංගණයේදී පැවැත්විණ. එහිදී, 15 (සේවා) ශ්‍රී ලංකා සිංහ රෙජිමේන්තු අණදෙන නිලධාරී මේජර් ආර්එම්ජේබී රාජපක්ෂ ගේ අණදීම යටතේ ඇති එම ඒකක මලල ක්‍රීඩා කණ්ඩායම තරඟාවලියේ ශූරතාව දිනාගත්හ. ආරක්ෂක සේනා මූලස්ථානය (බටහිර) ආඥාපතිගේ සහභාගීත්වයෙන් අවසන් උත්සවයේ ක්‍රීඩකයින් වෙත කුසලාන සහතික පිරිනැමිණ.



# තවත් දේශනයක්




යුද්ධ හමුදාවේ තනතුරු හොබවනු ලබන සියලුම නිලයින් සඳහා ආරක්‍ෂක සේනා මූලස්ථාන මට්ටමින් පැවැත්වෙන දේශනවල තවත් අදියරක් ආරක්‍ෂක සේනා මූලස්ථානය (බටහිර) යටතේ රාජකාරි කරනු ලබන ලිපිකරුවන් සඳහා ඉකුත් මාර්තු 23 වන දින පැවැත්විණ. එම මූලස්ථානයේ රාජකාරීන්හි නියුතු මේජර් ජේජීසී ගලප්පත්ති විසින් එම දේශනය මෙහෙයවන ලදී.

# සුහදත්වය වර්ධනයට ක්‍රීඩා තරඟාවලියක්



ආරක්‍ෂක සේනා (මධ්‍යම) ආඥාපති මේජර් ජෙනරාල් එම්කේඑස් සිල්වා ආර්ඩබ්ලිව්පී ආර්එස්පී එන්ඩීයූ ගේ උපදෙස් හා මඟපෙන්වීම මත එම මූලස්ථානය යටතේ පාලනය වන ඒකකයන්හි සියලු නිලයින්ගේ සහභාගීත්වයෙන් සංවිධානය කෙරුණු ක්‍රීඩා තරඟාවලියක් ඉකුත් මාර්තු 29, 31 සහ අප්‍රේල් 01 සහ 02 යන දිනයන්හිදී දියතලාව මුතුකුමරු ක්‍රීඩාංගණයේදී පැවැත්විණ.

සියලුම නිලයින්ගේ සුහදත්වය වර්ධනය කිරීමේ අරමුණින් පැවති මෙම තරඟාවලියට ක්‍රිකට්, එල්ලේ, වොලිබෝල් හා නෙට්බෝල් යන තරඟ ඉසව් ඇතුළත් විය. තරඟාවලියේ ජය සංකේත ප්‍රදානය ආරක්‍ෂක සේනා (මධ්‍යම) ආඥාපති ගේ සුරතින් සිදුවිය.



# ආරක්ෂක සේනා මූලස්ථානය (මධ්‍යම) නව ගොඩනැගිල්ලක ප්‍රතිස්ථාපනය කෙරේ





ආරක්ෂක සේනා මූලස්ථානය (මධ්‍යම) 2013 මාර්තු 13 වන දින යුද්ධ හමුදා ස්වේච්ඡා පුහුණු පාසල තුළ ස්ථාපනය කෙරිණ. මහනුවර මාතලේ නුවරඑළිය, බදුල්ල, මොණරාගල, හම්බන්තොට යන දිස්ත්‍රික්ක මෙම ආරක්ෂක සේනා බලප්‍රදේශයට ඇතුළත් වන බැවින් වඩාත් මධ්‍යස්ථ ස්ථානය වශයෙන් එය දියතලාව ප්‍රදේශයේ ස්ථානගත වීම සඳහා තෝරාගැනීමට හේතුව විය. පසුව, ස්වේච්ඡා පුහුණු පාසලෙහි පුහුණු ධාරිතාවය වර්ධනය කිරීමේ අවශ්‍යතාවයත් ආරක්ෂක සේනා මූලස්ථානයකට තිබිය යුතු යටිතල පහසුකම් සහ ස්වාධීනව කටයුතු කිරීමට උචිත පරිසරයක් ඇතිකරලීමේ අවශ්‍යතාවයත් මත එය වඩාත් ගැළපෙන තැනකට රැගෙන යාමට කටයුතු කෙරිණ.

ඒ අනුව, 2022 මාර්තු 02 වන දින පටන් ආරක්ෂක සේනා මූලස්ථානය (මධ්‍යම) යුද්ධ හමුදා පුහුණු අණසක මූලස්ථානය ස්ථානගතව තිබූ භූමියේ නව ගොඩනැගිල්ලක ප්‍රතිස්ථාපනය කරන ලදී. ඒ නිමිත්තෙන් යුද්ධ හමුදා සම්ප්‍රදායන්ට අනුකූලව වැඩසටහන් රැසක් ක්‍රියාත්මක වූ අතර එහිදී, සෙත්පිරිත් සජ්ඣායනා මධ්‍යයේ ආඥාපති මේජර් ජෙනරාල් එම්කේඑස් සිල්වා ආර්ඩබ්ලිව්පී ආර්එස්පී එන්ඩීයූ ගේ ප්‍රධානත්වයෙන් නව මූලස්ථාන ගොඩනැගිල්ල විවෘත කිරීම සිදුවිය.

# ශ්‍රී ලංකා යුද්ධ හමුදා කෘෂිකර්ම හා පශු සම්පත් බලකායේ ප්‍රථම මන්ත්‍රණ සභාව





ශ්‍රී ලංකා යුද්ධ හමුදා කෘෂිකර්ම හා පශු සම්පත් බලකායේ ප්‍රථම මන්ත්‍රණ සභාව 2022 අප්‍රේල් 30 වන දින කරන්දෙණියේ පිහිටි එම රෙජිමේන්තු මධ්‍යස්ථානයේදී පැවැත්විණි. තාක්ෂණික හැකියාවෙන් අනූන වෘත්තීය කෘෂිකාර්මික බලකායක් ගොඩනැගීමේ දැවැන්ත ජාතික කර්තව්‍යයට සෘජුව උරදී සිටින එම බලකාය සිය ප්‍රථම මන්ත්‍රණ සභාව මෙලෙස පවත්වමින් තබා ඇත්තේ ඓතිහාසික පියවරකි. යුද හමුදා අධ්‍යක්ෂ ජෙනරාල් මූල්‍ය කළමනාකරණ හා කෘෂිකර්ම හා පශු සම්පත් බලකා කර්නල් සේනාවිධායක මේජර් ජෙනරාල් ඩබ්ලිව්බීඑස්එම් අබේසේකර ආර්එස්පී යූඑස්පී ගේ ප්‍රධානත්වයෙන් පැවති මෙම රැස්වීමේදී කෘෂිකර්ම හා පශු සම්පත් ක්ෂේත්‍රයේ වෘත්තීය ප්‍රගතිය, පුහුණුව සහ පරිපාලන අංශයන්ට අදාළ කරුණු පිළිබඳව ප්‍රධාන වශයෙන් සාකච්ඡාවට ලක් විය. රෙජිමේන්තුවේ ක්‍රියාකාරිත්වය විධිමත් කරමින් එහි වෘත්තීය ප්‍රමිතීන් ඉහළ නැංවීම පිළිබඳවද එහිදී විශේෂ අවධානයක් යොමු කරන ලද අතර, තරඟකාරී තේරීම් විභාග, රෙජිමේන්තු ක්‍රියාකාරකම් පැවැත්වීම සහ යටිතල පහසුකම් වැඩිදියුණු කිරීම පිළිබඳවද වැඩිදුරටත් සාකච්ඡා කරන ලදී. මෙම ඓතිහාසික අවස්ථාවට රෙජිමේන්තු මන්ත්‍රණ සභාවේ සෙසු සාමාජිකයින් ලෙස බ්‍රිගේඩියර් ඒකේ රාජපක්ෂ ආර්එස්පී, බ්‍රිගේඩියර් ජීබී ලියනගේ ආර්එස්පී, බ්‍රිගේඩියර් ආර්පීඑස් පද්මශාන්ත එල්එස්සී, බ්‍රිගේඩියර් පීකේඩබ්ලිව්එම්ජේඑස්බීඩබ්ලිව් පල්ලෙකුඹුර ආර්ඩබ්ලිව්පී ආර්එස්පී පීඑස්සී, කර්නල් එම් ඒ එස් වැලිගම යන නිලධාරීහු සහභාගී වූහ.

# සන්නාහ සන්නද්ධ බලකා සේවා වනිතා ශාඛාව





සන්නාහ සන්නද්ධ බලකා සේවා වනිතා ශාඛාවේ වාර්ෂික මහ සභා රැස්වීම 23 වන වරටත් ඉකුත් මාර්තු 20 වන දින රොක්හවුස් හිදී පැවැත්විණ. දොස්තර එන් කුමාරනායක හා මේජර් ජීඅයිඩීඩී ධර්මරත්න ආර්එස්පී යූඑස්පී යූඑස්ඒසීජීඑස්සී යන අයවලුන් විසින් එහිදී ඉතා හරවත් දේශන සිදුකළහ. එම වැඩසටහන අතරතුරදී මහන මැෂින් බෙදාදීමක්ද සිදුකෙරිණ. තවද, සන්නාහ සන්නද්ධ බලකා සේවා වනිතා ශාඛාවේ සභාපතිනි හර්ෂණී බෝතොට මහත්මිය විසින් නව සේවා වනිතා කාර්යාලය විවෘත කිරීමද සිදුකරනු ලැබුවාය.

# කාලතුවක්කු හමුදා සේවා වනිතා ශාඛාව



ශ්‍රී ලංකා කාලතුවක්කු හමුදා සේවා වනිතා ශාඛා සභාපතිනියගේ සම්බන්ධීකරණයෙන් බටවල පිහිටි ප්‍රජාපතී භික්ෂුණී ආරාමය වෙත වියළි සලාක සහ අත්‍යාවශ්‍ය භාණ්ඩ ලබාදීමේ වැඩසටහනක් පසුගියදා එම ආරාමයේදී සිදුකෙරිණ. මෙම අවස්ථාවට ශ්‍රී ලංකා කාලතුවක්කු හමුදා සේවා වනිතා ශාඛා සභාපතිනිය චාමා වනසිංහ මහත්මිය ඇතුළු එම සේවා වනිතා ශාඛාවේ සාමාජිකාවන් පිරිසක් සහභාගී වූහ.

# පාබල හමුදා සේවා වනිතා ශාඛාව





ශ්‍රී ලංකා පාබල හමුදා සේවා වනිතා ශාඛාවේ සභාපතිනියගේ මගපෙන්වීම යටතේ එම සේවා වනිතා ශාඛාව වෙතින් පවත්වාගෙන යනු ලබන ගැලන්ට් බේකරි ආයතනයට අයත් ගැලන්ට් යෝගට් ව්‍යාපෘතිය හා ගැලන්ට් පානීය ජල බෝතල් ව්‍යාපෘතියේ සේවයේ නියුතු සියලුම සිවිල් සේවක මහතුන් හට සිංහල හා හින්දු අලුත් අවුරුද්ද වෙනුවෙන් ත්‍යාග ප්‍රදානය කිරීම ඉකුත් අප්‍රේල් 11 වන දින ශ්‍රී ලංකා පාබල හමුදා දේශන ශාලාවේදී සිදුකෙරිණ. එම සේවා වනිතා සභාපතිනි ශිරෝමාලා කොඩිතුවක්කු මහත්මියගේ ප්‍රධානත්වයෙන් පැවති මෙම අවස්ථාවට එම රෙජිමේන්තු මධ්‍යස්ථාන සේනාවිධායක ඇතුළු සේවා වනිතා සාමාජිකාවෝ රැසක්ද එක්වූහ.

# ගැමුණු හේවා බලකා සේවා වනිතා ශාඛාව






ගැමුණු හේවා බලකායේ අභිමානවත් 34 වන සංවත්සර සැමරුමට සමගාමීව එම රෙජිමේන්තු සේවා වනිතා ශාඛාවේ සභාපතිනිය ඇතුළු සාමාජිකාවන්ගේ අදහසකට අනුව අත්‍යාවශ්‍ය වෛද්‍ය උපකරණ හා ශිෂ්‍යාධාර ලබාදීමේ වැඩසටහනක් ඉකුත් මාර්තු 19 වන දින එම රෙජිමේන්තුවේදී පැවැත්විණ. එහිදී, රත්නපුර ශික්ෂණ රෝහල, දැල පණගම ප්‍රාථමික වෛද්‍ය මධ්‍යස්ථානය, ගැමුණු හේවා රෙජිමේන්තු මූලස්ථාන බලඇණිය සහ ගැමුණු හේවා රෙජිමේන්තු වෛද්‍ය මධ්‍යස්ථානය වෙත අදාළ වෛද්‍ය උපකරණ බෙදාදෙන ලදී. මෙම අවස්ථාවට එම රෙජිමේන්තු සේවා වනිතා ශාඛාවේ සභාපතිනි ගීතා අතුකෝරල මහත්මිය ඇතුළු පිරිසක් සහභාගී වූහ.

# සිංහ රෙජිමේන්තු සේවා වනිතා ශාඛාව



ශ්‍රී ලංකා සිංහ රෙජිමේන්තු සේවා වනිතා ශාඛාවේ සාමාජිකාවන් පසුගිය ජනවාරි 30 වන දින පාන්ගොල්ල සුවනා නිකේතනය "අභිමංසල" වෙත පැමිණ එහි නේවාසිකව ප්‍රතිකාර ලබන රණවිරුවන්ගේ සුවදුක් විමසන ලදී. සිංහ රෙජිමේන්තු සේවා වනිතා ශාඛාවේ සභාපතිනි දර්ශනී ලියනගේ මහත්මියගේ ප්‍රධානත්වයෙන් එම ශාඛාවේ තවත් ජ්‍යේෂ්ඨ සාමාජිකාවන් කිහිපදෙනකු මෙම සංචාරයට එක් වූහ.

# විජයබාහු පාබල රෙජිමේන්තු සේවා වනිතා ශාඛාව





විජයබාහු පාබල රෙජිමේන්තු සේවා වනිතා ශාඛාවේ සභාපතිනි කුමුදු මානගේ මහත්මියගේ ප්‍රධානත්වයෙන් එම රෙජිමේන්තු සේවා වනිතා ඒකකයේ 32 වන සංවත්සර දිනය සැමරීම ඉකුත් මාර්තු 24 වන දින විජයබාහු පාබල රෙජිමේන්තු මධ්‍යස්ථානයේදී පැවැත්විණ. එයට සමගාමීව කොළඹ විශ්වවිද්‍යාලයේ දේශීය වෛද්‍ය ආයතනය මගින් දේශීය වෛද්‍ය කඳවුරක් ද එහිදී පවත්වන ලදී. තවද, අඩුආදායම්ලාභී පවුල්වල සිසුන් 07 දෙනකු සඳහා ශිෂ්‍යත්ව පිරිනැමීම සහ තැලසීමියා රෝගයෙන් පීඩා විඳින එම රෙජිමේන්තුවට අයත් සෙසුනිලයින් දෙදෙනකු සඳහා මූල්‍යාධාර ලබාදීමක්ද මෙහිදී සිදුකෙරිණ. මෙම අවස්ථාවට අධ්‍යක්ෂ ජෙනරාල් ප්‍රධාන මාණ්ඩලික මෙන්ම විජයබාහු පාබල රෙජිමේන්තු අධිපති මේජර් ජෙනරාල් එස්යූඑම්එන් මානගේ ඩබ්ලිව්ඩබ්ලිව්වී ආර්ඩබ්ලිව්පී ආර්එස්පී පීඑස්සී ඇතුළු එම සේවා වනිතා ශාඛාවේ සාමාජිකාවන් පිරිසක් සහභාගී වූහ.

# යාන්ත්‍රික පාබල රෙජිමේන්තු සේවා වනිතා ශාඛාව





යාන්ත්‍රික පාබල රෙජිමේන්තු සේවා වනිතා ශාඛාවේ 14 වන වාර්ෂික මහ සභා රැස්වීම එම රෙජිමේන්තු සේවා වනිතා ශාඛාවේ සභාපතිනි ධනූෂා වීරසූරිය මහත්මියගේ ප්‍රධානත්වයෙන් ඉකුත් මාර්තු 05 වන දින ශ්‍රී ලංකා පාබල හමුදා නිලධාරී නිවස්නයේදී පැවැත්විණ. සාමාජිකාවන් 50 දෙනකුගේ සහභාගීත්වයෙන් පැවති එම වැඩසටහනේදී අමා දිසානායක මහත්මිය විසින් "යුද්ධ හමුදා නිලධාරී භාර්යාවකගේ භූමිකාව" නමැති හරවත් දේශනයක්ද සිදුකරන ලදී.









යාන්ත්‍රික පාබල රෙජිමේන්තුවට අයත් රණවිරුවන්ගේ 2021 වර්ෂයේ 5 වසර ශිෂ්‍යත්ව විභාගය සමත් වූ දරුවන් 16 දෙනකු සඳහා ඔවුන් ඇගයීම වස් 6 ශ්‍රේණියට අදාළ සියලුම පාසල් උපකරණ බෙදාදීමේ වැඩසටහනක් ඉකුත් අප්‍රේල් 10 වන දින එම රෙජිමේන්තු සේවා වනිතා ශාඛාවේ සභාපතිනි ධනූෂා වීරසූරිය මහත්මියගේ ප්‍රධානත්වයෙන් යාන්ත්‍රික පාබල රෙජිමේන්තු නිලධාරී නිවස්නයේදී පැවැත්විණ. එම අවස්ථාවට එම සේවා වනිතා ශාඛාවේ සාමාජිකාවන් ඇතුළු දෙමාපියන් පිරිසක් සහභාගී වූහ.

# සන්නද්ධ බුද්ධි බලකා සේවා වනිතා ශාඛාව





ලෝක කාන්තා දිනයට සමගාමීව සන්නද්ධ බුද්ධි බලකා සේවා වනිතා ශාඛාව මගින් සංවිධානය කළ වැඩසටහන් මාලාවක් ඉකුත් මාර්තු 12 වන දින කරන්දෙණිය පිහිටි සන්නද්ධ බුද්ධි බලකා පාසලේදී පැවැත්විණ. එම සේවා වනිතා ශාඛාවේ සභාපතිනි මනෝරි සලේ මහත්මියගේ ප්‍රධානත්වයෙන් පැවති එම වැඩසටහනේදී රජිතා ජයසූරිය හා නවෝදි වෙඩික්කාර යන මහත්මීන් විසින් ඉතා හරවත් දේශනයන් සිදුකළ අතර, මෙම අවස්ථාව සඳහා සේවා වනිතා ශාඛාවේ සාමාජිකාවෝ රැසක් සහභාගී වූහ.

# වෛද්‍ය බලකා සේවා වනිතා ශාඛාව





වෛද්‍ය බලකා සේවා වනිතා ශාඛාවේ අනුග්‍රහයෙන් එම බලකා සාමාජිකයින්ගේ විශ්වවිද්‍යාල අධ්‍යාපනය හදාරනු ලබන දූ දරුවන් 10 දෙනකු හට වාර්ෂිකව රුපියල් 5000.00 බැගින් ශිෂ්‍යත්ව ලබාදීම වෛද්‍ය බලකායේ බලකාධිපති බ්‍රිගේඩියර් පීඑස්සී ප්‍රනාන්දු යූඑස්පී සහ වෛද්‍ය බලකා සේවා වනිතා ශාඛාවේ සභාපතිනි විශේෂඥ වෛද්‍ය ඒ නිල්මිණී ප්‍රනාන්දු මහත්මියගේ ප්‍රධානත්වයෙන් පසුගියදා යුද්ධ හමුදා රෝහල - නාරාහේන්පිට ශ්‍රවණාගාරයේදී සිදුකරනු ලැබූහ. මෙහිදී, යුද්ධ හමුදා සේවා වනිතා ඒකකය මගින් ශිෂ්‍යත්ව ලබාදීම සඳහා තෝරාගත් එම රෙජිමේන්තුවට අයත් දූ දරුවන් 17 දෙනකු හට ශිෂ්‍යත්ව පිරිනැමිණ.

# යුධෝපකරණ බලකා සේවා වනිතා ශාඛාව



යුධෝපකරණ බලකා සේවා වනිතා ශාඛාවේ වාර්ෂික මහසභා රැස්වීම පසුගියදා එම රෙජිමේන්තු දේශන ශාලාවේදී එහි සභාපතිනී චින්තාමනී වීරතුංග මහත්මියගේ ප්‍රධානත්වයෙන් පැවැත්විණ. එහිදී නව නිලධාරී මණ්ඩලය පත් කිරීමද, එම ශාඛාවේ ඉදිරි සැලසුම් හා ක්‍රියාකාරකම් පිළිබඳවද සාකච්ඡා කරන ලදී.

# විදුලි හා යාන්ත්‍රික ඉංජිනේරු බලකා සේවා වනිතා ශාඛාව






විදුලි හා යාන්ත්‍රික ඉංජිනේරු බලකා සේවා වනිතා ශාඛාව මගින් ඉකුත් මාර්තු 26 වන දින උඩවලව විදුලි හා යාන්ත්‍රික ඉංජිනේරු මූලික වැඩපලෙහිදී වැඩසටහන් මාලාවක් සංවිධානය කරන ලදී. එම සේවා වනිතා ශාඛාවේ සභාපතිනි නන්දනී සමරකෝන් මහත්මියගේ ප්‍රධානත්වයෙන් පැවති එම වැඩසටහනට ආඥාපති හකාස අණසක හා ශ්‍රීලවියාඉ බලකාධිපති මේජර් ජෙනරාල් එස්පීඒඅයිඑම්බී සමරකෝන් එච්ඩීඑම්සී එල්එස්සී ඇතුළු නිලධාරීන් රැසක්ද, එම සේවා වනිතා ශාඛාවේ ජ්‍යෙෂ්ඨ සාමාජිකාවන් පිරිසක්ද සහභාගී වූහ. එහිදී, එම රෙජිමේන්තු සාමාජිකයින්ගේ දූ දරුවන් 26 දෙනකු වෙනුවෙන් පාසල් උපකරණ බෙදාදීමත්, සේවා වනිතා අර්ධ නිවාස වැඩසටහන යටතේ සෙ/627869 බනි 1 ජේඒ සුරාජ් යන අය වෙත රුපියල් 200,000.00 ක මුදල් චෙක්පතක් පිරිනැමීමත්, සෙ/629455 සැරයන් චතුරංග ඩබ්ලිව්ඒආර් වෙත රුපියල් 350,000.00 ක මුදල් චෙක්පතක් පිරිනැමීමත් සිදුකෙරිණ. තවද, එම බලකායේ වසර 18 ක සේවා කාලයක් නිමකොට යුද්ධ හමුදාවෙන් ඉවත් වූ සෙ/2එම්00553 කෝප්‍රල් තිලකරත්න එම් යන කොනොනි හට නව නිවසක් ඉදිකිරීමට මුල්ගල් තැබීමද එහිදී සිදුවිය.

# ඉංජිනේරු සේවා බලකා සේවා වනිතා ශාඛාව



ඉංජිනේරු සේවා වෘත්තීය පාසලේ රාජකාරී කරනු ලබන එෆ්/9981 සිවිල් ජී සුමනතිස්ස යන සිවිල් සේවක මහතාගේ අංශභාග රෝගයෙන් පෙළෙන මවගේ පරිහරණය සඳහා එම සේවා වනිතා ශාඛාව වෙතින් පසුගිය මාර්තු 05 වන දින රෝද පුටුවක් පරිත්‍යාග කරන ලදී. ඉංජිනේරු සේවා වනිතා ශාඛාවේ සභාපතිනි දීපිකා ප්‍රශාන්ති චන්ද්‍රසේන මහත්මියගේ සුරතින් එම රෝදපුටු පරිත්‍යාගය සිදුවුවාය.

# පොලිස් හේවා බලකා සේවා වනිතා ශාඛාව






පොලිස් හේවා බලකා සේවා වනිතා ශාඛාවේ සභාපතිනි ඉනෝකා ඉලංගකෝන් මහත්මියගේ අදහසකට අනුව පසුගිය කාන්තා දිනය වෙනුවෙන් වූ හරවත් දේශනයක් මනෝවිද්‍යාඥ භාග්‍යා දේශප්‍රිය මහත්මිය විසින් එම බලකා කොනොනි සමාජ ශාලාවේදී ඉකුත් මාර්තු 20 වන දින පවත්වන ලදී. එම අවස්ථාවට එම රෙජිමේන්තු බලකාධිපති මෙන්ම ඉදිරි නඩත්තු පෙදෙස (මුලතිව්) ආඥාපති මේජර් ජෙනරාල් ඒඑල් ඉලංගකෝන්, සේවා වනිතා සාමාජිකාවන්, නිලධාරිනියන්, සෙසුනිල බිරින්දෑවරුන් සහ කාන්තා සෙබළියන් 50 දෙනකු සහභාගී වූහ. එහිදී, පැමිණි පිරිස වෙනුවෙන් රූපලාවණ්‍ය ද්‍රව්‍ය සහ මුදල් පසුම්බිය බැගින් පිරිනැමීමටද කටයුතු කර තිබීම විශේෂත්වයකි. මෙම උත්සවයේ සියලු සංවිධාන කටයුතු සහ අනුග්‍රාහක දායකත්වය 5 වන පොලිස් හේවා බලකාය වෙතින් සිදුකරන ලදී.

# පොදුසේවා බලකා සේවා වනිතා ශාඛාව

හදිසි රිය අනතුරකට ලක්ව මියයන ලද සෙ/702253 බනි 11 විශ්වජිත් එස්ජීජී බලලත් නිලධාරිගේ පවුලේ සාමාජිකයන්ගේ සුවදුක් සොයාබැලීම සඳහා පොදුසේවා බලකා සේවා වනිතා ශාඛාවේ සභාපතිනි එරංගා හේවාවසම් මහත්මිය ඇතුළු එම සේවා වනිතා ශාඛාවේ සාමාජිකාවන් පිරිසක් පසුගියදා එම නිවසට ගියහ. එහිදී, එම බලලත් නිලධාරිගේ අවුරුදු 12 ක් වයසැති පුතණුවන්ට සහ අවුරුදු 07 ක් වයසැති දියණිය වෙත පාසල් උපකරණ කට්ටලද බෙදාදුන් අතර, මාස 06 වයසැති දියණිය වෙනුවෙන් ත්‍යාග ලබාදීමටද කටයුතු කෙරිණ. තවද, ඔවුන්ගේ පවුලේ ආර්ථික මට්ටම ඉහළ නැංවීමේ අරමුණින් ඔහුගේ බිරිඳ වෙත පහන්තිර සකසන යන්ත්‍රයක්ද නොමිලේ ලබාදෙන ලදී. ඒ හා සමගාමීව ඔවුන් වෙත වියළි සලාක මළු පිරිනැමීමද, දරුවන්ගේ අනාගත අභිවෘද්ධිය වෙනුවෙන් නිලධාරී/සෙසුනිලයින්ගේ පරිත්‍යාග මුදලින් ඉතිරි කිරීමේ ගිණුම් 03 ක්ද ආරම්භ කර පවත්වා ගෙන යාමටද කටයුතු කරන ලදී. මෙම අවස්ථාව සඳහා එහි බලකාධිපති බ්‍රිගේඩියර් එච්ඒපීපීකේ හේවාවසම්, මධ්‍යස්ථාන සේනාවිධායක සහ නිලධාරීන්ද සහභාගී වූහ.





**සටනක වතගොත**

# රන්ගහවත්ත සටන

අතීතයේ කඩු, දුනු සහ ඊතලවලින් සටන් වැදුණු අපගේ මුතුන් මිත්තන් පෘතුගීසීන්ගේ ආගමනයත් සමග ගිනි අවි භාවිතයෙන් යුද්ධ කිරීමට හුරුවුණි. මෙම පරිවර්තනය ක්‍රි.ව 1520-1580 යන කාලපරිච්ඡේදය තුළ ඉතාමත් සීඝ්‍රයෙන් සිදුවිය. මෙම වකවානුව තුළ පෘතුගීසීන් සතුව තිබූ ගිනි අවි සමග ඔවුන්ට එරෙහිව කඩු, දුනු සහ ඊතලවලින් සටන් වැදීම අපහසු කරුණක් බව දේශීය නායකයන් වටහා ගැනීම මෙම පරිවර්තනයට ප්‍රධාන හේතුවකි. එවකට සීතාවක රාජධානියේ පාලනය කළ මායාදුන්නෙ රජු ඉතා දක්‍ෂ, එඩිතර රණ ශූරයකු වූ අතර, කිහිප විටකම පෘතුගීසි බලකොටුවලට පහර එල්ල කළත් සිංහල හමුදාව සතුව තිබූ පැරණි අවි ආයුධ නිසා ඔවුන්ට සාර්ථක වීමට නොහැකි විය. මේ හේතුවෙන් තම හමුදාව බලවත් හා කාර්යක්‍ෂම කිරීම සඳහා සීතාවක හමුදාව නවීන ආයුධවලින් සන්නද්ධ කිරීම කෙරෙහි රජුට දැඩි අවශ්‍යතාවක් ඇති වූ හෙයින් ඒ පිළිබඳව දැඩි අවධානයකින් යුතුව කටයුතු කළේය. ගිනි අවි භාවිතා කරමින් සීතාවක හමුදාව ලබා ඇති සාර්ථකත්වය සමග පෘතුගීසීන්ගේ ප්‍රබල අවියක් වූ කාලතුවක්කුවලට එරෙහිව සටන් කිරීම සඳහා වඩාත් කාර්යක්‍ෂම දිගදුර ප්‍රහාර එල්ල කළ හැකි ගිනි අවි නිෂ්පාදනය කිරීමට මෙන්ම විවිධ රණ උපක්‍රම යොදා ගනිමින් සතුරා මංමුලාකර ඔවුන්ට ප්‍රහාර එල්ල කිරීමට සිංහල හමුදාව සමත්විය. මෙහි ප්‍රතිඵලයක් ලෙස සීතාවක හමුදාව බැරලයක ඉදිරිපස ලී කණු දෙකක් මත සවිකළ කාලතුවක්කුවක් හා සමාන අවියක් නිර්මාණය කරන ලදී. එය "කොඩිතුවක්කු" ලෙස නම් කරන ලදී. සටන් වලදී "කොඩිතුවක්කු" අවිය සහ තවත් විවිධ අවි භාවිත කොට සටන්කර සීතාවක හමුදාව පෘතුගීසීන් සතුව තිබූ කාලතුවක්කු කිහිපයක් තම භාරයට ගැනීමට සමත්වුණි. ඉන් පසුව සීතාවක රාජධානිය සඳහා ඉන්දියානු ඉංජිනේරුවන්ගේ සහය ඇතිව ඊට සමාන කාලතුවක්කු තැනීමට රජුට හැකිවිය. ඉන්පසු මෙම කාලතුවක්කු දේශීය ශ්‍රමිකයින් යොදවා "ධච්චිගොඩල්ල, යබරලුව සහ කම්මල්ගොඩල්ල" යන ප්‍රදේශවල නිෂ්පාදනය කරන ලදී.

මායාදුන්න රජුගේ පුතු වූ ටිකිරි බංඩාර නොහොත් සීතාවක රාජසිංහ ද ඔහුගේ පියා මෙන්ම අති දක්‍ෂ රණ ශූරයකි. මේ නිසා වැඩිදියුණු කරන ලද අවි ආයුධ සමගින් ටිකිරි බංඩාර කුමරු සීතාවකට පහරදීමට පැමිණෙන පෘතුගීසි හමුදා විනාශ

කිරීමට මායාදුන්නේ රජු විසින් තීරණය කරන ලදී. ඒ අනුව මනා සැලසුමකින් අනතුරුව සුදුසු අවස්ථාව පැමිණි විගස වීකිරි බංඩාර කුමරු විසින් මෙහෙයවන ලද හමුදාව මුල්ලේරියාව ප්‍රදේශයේදී පෘතුගීසීන් හට දෙවන ප්‍රහාරය එල්ල කරන ලදී. මෙම සටන අදටත් කතාබහ වන මුල්ලේරියා මහ සටන නම් වේ. එහිදී මුල්ලේරියාවේදී ලද ජයග්‍රහණයත් සමග වීකිරි බංඩාරගේ කීර්තිනාමය බෙහෙවින් පතළ වූ අතර, ඔහු පසුව පළවන රාජසිංහ ලෙස මායාදුන්නේ රජුගෙන් පසු සීතාවක රාජ්‍යත්වයට පත්විය. මොහුද මායාදුන්නේ මෙන් විටින් විට පෘතුගීසීන් හට පහරදීම් සිදුකිරීමෙන් රාජසිංහ රජු පෘතුගීසී හමුදාවන්ට මහත් හිසරදයක් වුණි. මේ හේතුවෙන් පෘතුගීසීන් සීතාවකට විශාල ප්‍රහාරයක් එල්ල කිරීමට නැවතත් සැලසුම් දියත් කළහ.

සීතාවක රාජධානි සමයේ පෘතුගීසි යුද පහුරු දෙකකට සිංහල හමුදාව විසින් පහරදීමේ සිතුවමක් මෙම ලිපිය ආරම්භයේ ඔබට දැකගත හැක. එහි නිරූපණය වන්නේ පෘතුගීසි හමුදාව සීතාවක රාජධානියට පහරදීමේ අරමුණින් අවි ආයුධ සහ වෙඩි බෙහෙත් සවිකරන ලද ප්‍රහාරක පහුරු දෙකක් කැළණි ගඟ ඔස්සේ සීතාවක රාජධානිය දෙසට යාත්‍රා කිරීමේදී ප්‍රහාරයට ලක්වීමේ සිදුවීමකි. එම යුගයේදී රාජසිංහ රජු නොදැනුවත්ව සීතාවක රාජ්‍යයට ඉහළින් කපුටකුටවත් යා නොහැකි බවට කියමනක් ජනප්‍රවාදයේ ඇත. එමගින් රජු සතුව ඉතා ප්‍රබල බුද්ධි තොරතුරු සේවයක් තිබූ බව මනාව පැහැදිලි වේ. මෙම පෘතුගීසි සැලසුම ආරංචි වූ වහා රාජසිංහ රජු විසින් එවකට තනා තිබූ ලෝකඩ කාලතුවක්කුවක් කැලණි ගඟේ දකුණු ඉවුරෙහි රක්ගහවත්ත යන ප්‍රදේශයේ ස්ථානගත කර පෘතුගීසි ප්‍රහාරක පහුරු වෙත රජු විසින්ම කාලතුවක්කුව කුරුමානම් කර වෙඩි තබා එම ප්‍රහාරක පහුරු පෘතුගීසි හමුදාවේ සොල්දාදුවන් සමග විනාශකර කැලණි ගඟේ ගිල්වා දැමූ අයුරු චිත්‍රයෙන් නිරූපණය කරයි. මෙම ප්‍රහාරය සඳහා රජු විසින් රක්ගහවත්ත ප්‍රදේශය තෝරා ගැනීමට හේතු සාධක වූයේ එම ප්‍රදේශයේ තිබූ භූගෝලීය පිහිටීමත්, (ගඟ හොඳින් නිරීක්ෂණය කළ හැකි උස් තැනිතලා බිමක්) සිංහල හමුදාවට වාසිදායක අයුරින් උපක්‍රමශීලීව සතුරා හට පහර එල්ල කිරීමට තිබූ හැකියාවත් නිසා බව අදටත් එම ප්‍රදේශයේ ගවේෂණය කරන්නකුට දැකගත හැකිය.

මෙම සිතුවම ඉතාමත් ගවේෂණාත්මකව නිර්මාණය කර ඇති අතර, මෙහි දැක්වෙන සියලුම අවි ආයුධ සහ කාලතුවක්කු බැරලය, රජතුමාගේ සහ අනෙකුත් සිංහල සොල්දාදුවන්ගේ ඇඳුම් සියල්ලම 1500-1600 කාල වකවානුවට අයත් අවි ආයුධ හා ඇඳුම් ආයිත්තම්වලට අනුව නිරූපණය කර ඇත. මෙම සිතුවම නිර්මාණය කිරීම සඳහා මූලික වශයෙන් දැනට කොළඹ කෞතුකාගාරයේ සංරක්ෂණය සඳහා තබා ඇති "අලකේශ්වර යුද්ධය (ඒ.පී 4 දරණ පුස්කොළ පොත)" මූලාශ්‍ර කරගෙන ඇති අතර, එහි මෙම සිදුවීම මෙසේ සටහන් කර ඇත.

ඒ සිටි නොබෝ දවසකට පසු කෝට්ටේ සේනාවක් ප්‍රතිකාල් සේනාවත් ගනිනුත් ගොඩිනුත් යුද්ධයට එන කල රාජසිංහ මහරජාණෝ ලෝකඩ කාලතුවක්කුවක් ගෙන්වා කාලතුවක්කුව සූදානම් කොට වෙඩි බෙහෙත් හා යකඩ උණ්ඩ දමා තානිච්චි කොට උන්වහන්සේම කුරුමානම් බලා පත්තු කළ උණ්ඩ කස්තේලුවට වැදී පොල් කඳනුත් ගසාගෙන කලාසිකාරයෝ කීපදෙනකුත් ප්‍රතිකානුත් කීපදෙනකුන්ටත් වැදී පඩච්ච බිඳ ගිලිහී දිය උඩුවේය. ඒකල කස්නෙලුව ගඟ පහළට ඇදගෙන ගියහ.

මීට අමතරව මෙම සිදුවීම සබැඳිව එවකට පෘතුගාලයේ සිටි ලේඛයකු වූ *Diago De Couto* විසින් පෘතුගීසි හමුදාව විසින් පෘතුගාලයට එවන ලද සංදේශ ලිපි සහ ලංකාවේ සිටි පෘතුගාලයට පැමිණි පෘතුගීසි සෙබළුන්ගෙන් ගත් තොරතුරුවලට අනුව ඔහු විසින් එළි දක්වන ලද *"THE HISTORY OF CEYLON THE EARLIST TIMES TO 1600 AD"* යන ජර්නලය මෙම සිදුවීම සබැඳිව පහත පරිදි සටහන් කර ඇති බව නිරූපණය කරයි.

***208 JOURNAL, R.A.S (CEYLON). [Vol.XX***

***pots of powder, fire-bombs, and other contrivances and materials, to go by the river and invest the tranqueira, and he with all the army crossed over from the other side, leaving orders for the foists to tow the castles until they were alongside of the tranqueira. And the signal having been given at the hour of attack, the foists began to row up the river with the castles : and when they were already near the tranqueira, they fired upon them with a camello1, which struck the foist that was in front in the prow, and the ball went tearing its way through the middle of it as far an the poop, killing more than twenty sailors whom it took in line who were hauling at certain roqueiras2, and knocked them all to pieces. Upon this the vessels stopped, and Dom Jorge ordered to signal to them to turn about, which he also did, because he knew that all that were in the castles were certain to have been terrified by that mishap3.***

තවද *"Time Line Of Muskets And Cannons In Sri Lanka"* යන වෙබ් පිටුවේ මෙම රක්ගහවත්ත සටන පිළිබඳව මෙසේ සටහන් වන අතර, මෙය සඳහා මහනුවර යුගයේ ලියැවුණු "රාජාවලිය" නම් ග්‍රන්ථය මූලාශ්‍ර කර ඇති බවද සටහන් වේ.

*The Portuguese Planned to attack Seethamaka Rajasinghe who has camps at Rakgahawatte by advancing on either bank of Kelani river and bringing a cannon mounted on a castle built on two Padda - boats. Seethawaka Rajasinghe was a very cautious and tactical leader who anticipated the threats that he might have to face. Once he was aware of the advance of Portuguese along the river, he was ready for them, he ordered a bronze canon to be mounted on the right bank and charge with a ball, and as the flacting castle came in to view, Seethawaka Rajasinghe himself aimed and fired the gun and with such good fortune that it taked the towing boat and killed 20 sailors.*

පෙර රජ දවසේ පටන් යුද ජයග්‍රහණ සඳහා කාලතුවක්කුව භාවිතා කර ඇති බැව් මෙමගින් මනාව පැහැදිලි වෙන කරුණක් බැව් ඉතා සාඩම්බරයෙන් යුතුව සටහන් කරන්නෙමු.

රෙජිමේන්තු මධ්‍යස්ථානය
කාලතුවක්කු හමුදා රෙජිමේන්තුව

# සුහද ක්‍රිකට් තරඟාවලියක්





ශ්‍රී ලංකා යුද්ධ හමුදාව සහ සිවිල් වැසියන් අතර සුහදතාවය වැඩිදියුණු කරගැනීම සඳහා වූ සුහද ක්‍රිකට් තරඟාවලියක් ඉකුත් මාර්තු 27 වන දින 56 වන පාබල සේනාංක ක්‍රීඩා පිටියේදී පැවැත්විණ. මෙම අවස්ථාවට 56 වන පාබල සේනාංකාධිපති මේජර් ජෙනරාල් එල්ඩීඑස්එස් ලියනගේ ආර්එස්පී යූඑස්පී පීඑස්සී එච්ඩීඑම්සී සමගින් වව්නියාව දකුණු ප්‍රාදේශීය ලේකම් පීඑම්ජීකේ කුමාර මහතා සහභාගී වූහ.

# මාහැඟි පරිත්‍යාගයක්





54 වන පාබල සේනාංකාධිපති මේජර් ජෙනරාල් යූඩී විජේසේකර ආර්ඩබ්ලිව්පී ආර්එස්පී යූඑස්පී ආර්සීඩීඑස් පීඑස්සී ගේ අදහසකට අනුව එම බලප්‍රදේශයේ ජීවත්වන අඩු ආදායම්ලාභී සිංහල සහ දමිළ පවුල්වල පාසල් දරු දැරියන් 100 ක් සඳහා රුː 6000.00ක් පමණ වටිනාකමකින් යුතු පාසල් උපකරණ කට්ටල බෙදාදීමේ වැඩසටහනක් 543 වන පාබල බලසේනාධිපතිගේ අධීක්ෂණය මත 2022 මාර්තු මස 19 වන දින මන්නාරම් නගර සභා සංස්කෘතික ශාලාවේදී පැවැත්විණ. මෙම වැඩසටහන සඳහා ප්‍රසාද් ලොකුබාලසූරිය මහතාගේ ප්‍රධානත්වයෙන් තිලංක මෙන්ඩිස්, නදීක ජයවර්ධන, උදාර මැදුරප්පෙරුම, සමන්ති විජේවර්ධන, කුමුදු ගුණවර්ධන, හිමත් කිත්සිරි සහ නදුන් බංඩාර යන මහත්ම මහත්මීන්ගේ සම්බන්ධීකරණයෙන්, ශ්‍රී ජයවර්ධනපුර විශ්වවිද්‍යාලයීය ආදි විද්‍යාර්ථ මිතුරු කැල, කොළඹ 07 රාජකීය විද්‍යාලයීය ආදි ශිෂ්‍ය මිතුරු කැල සමගින් සකල ශ්‍රී ලංකාවාසී මිතුරු කැල විසින් මූල්‍ය දායකත්වය දරන ලදී. මෙම අවස්ථාව සඳහා 54 වන පාබල සේනාංකාධිපති 543 වන පාබල බලසේනාධිපති, කර්නල් සම්බන්ධීකරණ නිලධාරී 54 වන පාසේමු ඇතුළු නිලධාරීන් සහ ආදි ශිෂ්‍ය සංගමය නියෝජනය කරමින් ප්‍රසාද් ලොකුබාලසූරිය මහතා ඇතුළු මහත්ම මහත්මීන් පිරිසක් සහභාගී වූහ.

# ඉගෙනුමට අත්වැලක්





3 (සේවා) විජයබාහු පාබල රෙජිමේන්තු බලප්‍රදේශයට අයත් තේවිපුරම් ග්‍රාමසේවා වසමෙහි ශිව ශක්ති පෙරපාසලේ ඉගෙනුම ලබන පෙරපාසල් ළමුන් 26 දෙනකු සඳහා පොත් කට්වල බෙදාදීමේ වැඩසටහනක් ඉකුත් අප්‍රේල් 09 වන දින සිදුකෙරිණ. එම අවස්ථාව සඳහා 3 (සේවා) විජයබාහු පාබල රෙජිමේන්තුවේ නිලධාරීන් සහ සෙසුනිලයින්, ළු දරුවන්, දෙමව්පියන් සහ ගුරුභවතුන් ඇතුළු පිරිසක් සහභාගි වූහ.

# සංචාරයක මතක සටහන්





10 (සෙව්) ඉංජිනේරු සේවා රෙජිමේන්තුවෙහි පාලන කටයුතු නිවැරදිව සහ ක්‍රමවත් ලෙස සිදුකිරීම සොයා බැලීමේ අරමුණින් වූ පාලන පරීක්ෂාවක් ඉකුත් මාර්තු 23 වන දින ඉංජිනේරු සේවා බලකා මධ්‍යස්ථාන සේනාවිධායක බ්‍රිගේඩියර් ඊඒඩීකේ එදිරිසිංහ ගේ ප්‍රධානත්වයෙන් පැවැත්විණ. 10 (සෙව්) ඉංජිනේරු සේවා රෙජිමේන්තුවේ අණදෙන නිලධාරි මේජර් ආර්පීඒ රෝහණ යූඑස්පී විසින් මධ්‍යස්ථාන සේනාවිධායක උණුසුම් අයුරින් පිළිගැනීමෙන් අනතුරුව හමුදා සම්ප්‍රදායානුකූල කඳවුරු සම්මාන මුරයක්ද පරිනමන ලදී. එම සංචාරය තුළ එම ඒකකයෙහි නවතමයෙන් ඉදිකරන ලද සෙසුනිල භට නිවාසය විවෘත කිරීම මධ්‍යස්ථාන සේනාවිධායක අතින් සිදුවීමද විශේෂය.

# සංවත්සර දිනය සමරමින්





2009 වර්ෂයේ මාර්තු 30 වැනි දිනක මල්ලාවි ප්‍රදේශයේදී ස්ථාපිත වූ 17 (සෙව්) ශ්‍රී ලංකා පාබල හමුදාවේ 13 වන සංවත්සරය පසුගියදා සැමරිණ. ඊට සමගාමීව යුද්ධයෙන් දිවිපිදූ සහ තුවාල ලැබූ රණවිරුවන්ටද, සේවයේ නියුතු සහ විශ්‍රාම ලැබූ සියලු රණවිරුවන්ටද, ඔවුන්ගේ පවුලේ අයවළුන්ටද, සිවිල් සේවක මහතුන්ට සහ ඔවුන්ගේ පවුලේ ඥාතීන් වෙත සෙත්පතා බෝධිපූජා පිංකමක් ඉකුත් මාර්තු 27 වන දින පවත්වන ලදී. තවද, එම ඒකකයේ අණදෙන නිලධාරි ලුතිනන් කර්නල් ඒඒඑන්බී අතුරුගිරි ආර්එස්පී වෙත කඳවුරු මුරයක් පිරිනැමීම, රුක් රෝපණය සහ නවීකරණය කරන ලද බනි/සැරයන් නිවස්න ගොඩනැගිල්ල විවෘත කිරීමද සංවත්සර දිනයේ සුවිශේෂී තැනක් ගත් අවස්ථාවන් විය.

# අලුත් සහල් මංගල්‍යයක්





19 වන ශ්‍රී ලංකා පාබල හමුදාවට අයත් මුලංකාවිල් ග්‍රාම සේවා වසමේ මුලංකාවිල් ගොවිජන සේවා මධ්‍යස්ථානය තුළදී අලුත් සහල් මංගල්‍යයක් වෙනුවෙන් අලුත් සහල් එක්රැස් කිරීමේ විශේෂ උත්සවයක් පැවැත්විණ.

2022 අප්‍රේල් 03 වන පැවති අලුත් සහල් මංගල්‍යය වෙනුවෙන් මහ කන්නයේදී නෙලාගත් වී අස්වැන්නේ අග්‍රඵලය එලෙස ජය ශ්‍රී මහා බෝධිය වෙත පූජා කිරීම සඳහා 651 වන පාබල බලසේනා මූලස්ථාන බලප්‍රදේශයේ ගොවි ජනතාව විසින් ලබාදී තිබිණ. මෙම විශේෂ උත්සවය සඳහා කෘෂිකර්ම හා රාජ්‍ය අමාත්‍යාංශය, ගොවිජන සේවා දෙපාර්තමේන්තුව සහ 651 වන පාබල බලසේනාවේ නිලධාරී හා සෙසුනිලයින් සහභාගී වූහ.



# සුනිල් බණ්ඩාර

**තොප්පිගල ප්‍රදේශයේ පිහිටි "පන්කුණාවේලි" කඳවුරෙහි සේවය කළ අවධිය මා හට බොහෝ සංවේදී මතක සටහන් රැසක් එක්කළ කාලපරිච්ඡේදයකි. එය මාගේ මතකයේ හැටියට 1993 වසර තරම් ඈතට දිවෙන්නකි. ප්‍රධාන මාර්ගයෙන් කිලෝමීටර් 7 ක් පමණ ඇතුළට වන්නට පිහිටා තිබූ අති දුෂ්කර කඳවුරක් වූ එය ඝණ කැළෑවෙන් වටව හුදෙකලාව පැවතුණි. ත්‍රස්තවාදී තර්ජන බහුලව පැවති එකල කඳවුරේ ආරක්ෂාව වෙනුවෙන් බොහෝ කැප වන්නට එහි සිටි භටපිරිස්වලට සිදුවුහ. 4 වන ගජබා රෙජිමේන්තුවට අයත්ව තිබූ එම කඳවුරෙහි මා ඇතුළු සෙබළු 35 දෙනකුද යාව රාජකාරි කරනු ලැබූහ.**

ආධුනික සෙබළ සුනිල් බණ්ඩාර එම කඳවුරෙහි මා හට අමතක නොවන චරිතයකි. ඔහු පදිංචිව සිටියේ පොලොන්නරුව හිඟුරක්ගොඩ ප්‍රදේශයේය. බොහෝ ක්‍රියාශීලී නිර්භීත ගති ඇති අයකු වුවද එක්තරා කාලසීමාවකදී මා ඔහු තුළින් දුටුවේ බොහෝ උදාසීන ස්වරූපයකි. හැකි සෑම අවස්ථාවකදීම අන් අයගෙන් වෙන්ව සිටින්නට උත්සාහ කළ ඔහු නිතරම කල්පනාවෙන් පසුවිය. පැවැති ක්‍රියාන්විත තත්වය හමුවේ එහි අපට නිරතුරු කඳවුරෙන් පිටත කැලෑබද ප්‍රදේශයන්හි රාත්‍රිය ගත කරන්නට සිදුවූ වාර අනන්තය. මා සමඟ රාජකාරී කළ එවන් අවස්ථාවලදී සෙබළ සුනිල් බණ්ඩාර ඇසිපිය නොහෙළා මුළු රැයම පහන් කළ අයුරු දැකගත හැකි විය. එහිදී, මා හට නිරීක්ෂණය වූයේ ඔහු කිසියම් ඉදිගිඩියාවකින් පෙළෙන බවකි. ජීවිත අවදානමක් සහිත වූ එම පරිසරය තුළ සියයට සියයක්ම රාජකාරිය පිළිබඳව අවධානයෙන් පසු නොවීම තුළ සිදුවිය හැකි බිහිසුණු තත්වය පිළිබඳ මා හොඳින් අවබෝධ කොට සිටි බැවින් මෙම සෙබළා පිළිබඳ වැඩිපුර අවධානය දෙන ලදී. එක්තරා අවස්ථාවකදී ඔහු මා හමුවට කැඳවා බොහෝ කාරුණික ලෙස මම ඔහුගෙන් කරුණු විමසීය. මුලදී කිසිත් ගැටලුවක් නොමැති බව ප්‍රකාශ කළද පසුව මාගේ බලකිරීම මත ඔහු පවසා සිටියේ මා හද රිදුම් දුන් පුවතකි. එනම්, ඔහුගේ දිගුකාලීන පෙම අවසන්ව ඇති බවයි. තම පෙම්වතියගේ නිවෙසින් ඇයව වෙනත් අයෙකුට විවාහ කරදෙන්නට සූදානම් වන පුවතකි. ඔහු ආධුනික සෙබලකු වූ බැවින් වසර 5 ක් ගතවන තුරු විවාහ වීමටද එවකට වෘත්තිය තුළ අවසර නොවීය. එසේම, ඒ වනවිට ඔහු පසුවූයේ වසර 21 ක් තරම් වූ වයසේය. එබැවින්, එවන් අවධියක විවාහයකට යාමට ඔහුට හැකියාවක්ද නොතිබිණ. කෙසේ වුවද ඔහු සියල්ල විඳදරා ගනිමින් තම දිගුකාලීන පෙමට සමුදී තිබුණි. එහෙත් ඔහුගේ සිත තුළ අවි ගැටෙන හුදකලා බිමේදී බුර බුරා නැගි විරහ ගින්නේ රස්නය මා හටද දැණින.

පෙම්කළ අය විරහව ගැන දනිති. ප්‍රේමයෙන් පරාජිත වූවෝ විරහ වේදනාව හඳුනති. එකී ධර්මතාවය සමාජයේ සෙසු අයට සේම හමුදා සෙබළාටද පොදුය. එදවස රණබිමෙහි දිවි නොතකා සටන් වැදි තම විරු පෙම්වතුනට සිය පෙම්වතියෝ සෙවණැල්ල සේ දහිරිය ශක්තිය දුන්හ. සෙත් පැතූහ. කෙදිනක හෝ ඔවුහු නිවාඩු ලැබ ගමට එනතෙක් ඇඟිලි ගනිමින් සිටියහ. සමාජයේ

පැවති සාමාන්‍ය තත්වය එසේ වුවද ඉඳහිට තැනක වසර ගණන් පෙම්බැඳී සෙබළ පෙම්වතා අතැර දමා වෙනතක් බැඳු ප්‍රේමවන්තියන්ද නැත්තේ නොවේ.

නමුත් ආධුනික සෙබළ සුනිල් බණ්ඩාර ගේ කතාව එසේ නොවූවද ඔහුට විරහ වේදනා අත්විඳින්නට සිදුව ඇත. එහිදී, ඔහු එය දරා ගත්තේ බොහෝ උපේක්ෂා සහගතවය. එහි තවත් විශේෂත්වයක් වූයේ විසිහතර පැය පුරා ගිනි අවි අත දරා ජීවිත සමඟ පොරබඳන අතරතුර පවා ඔහු සිය අභිමි පෙම්වතිය දෙස බැලූ මානුෂීය මුහුණුවරය. මම ඔහුගේ කතාව ඔස්සේ බොහෝ දුර ගියෙමි. එවකට 2/ලුතිනන් වරයකු ලෙස නව යොවුන් වියේ පසුවූ මාද ප්‍රේමයේ මිහිර විඳිමින් සිටි බැවින් එය මගේද කතාවක් ලෙස හැගිණ. එහිදී, ආධුනික සෙබළ සුනිල් බණ්ඩාර මා හමුවේ කී දෙය මගේ දෙසවනෙහි රැව් පිළිරැව් දෙන්නට විය. "අපිට එකතුවෙන්න බැරිවුණාට අපි දෙන්නා හදවත්වලින් කවදාවත් දුරස් වෙන්නෙ නැහැ සර්"

මෙලෙස කෙමෙන් කෙමෙන් කාලය ගතවන්නට විය. මාස කීපයක ඇවෑමෙන් මා හට එම ප්‍රදේශයේම වෙනත් කඳවුරකට මාරු වන්නට සිදුවූ අතර එහිදී සෙබළ සුනිල් බණ්ඩාර පිළිබඳව වූ මතකය ද වියැකී ගියේය. එතැන් පටන් තවත් වසර එක හමාරක් පමණ ගත වෙද්දී මා මඩකලපුව "පුනානි" කඳවුරේ සේවයට එක් විය. ඒ වන විට ප්‍රදේශයේ යුද ගැටුම් උත්සන්නව පැවති හෙයින් දිනපතා ත්‍රස්තවාදීන් සේම හමුදා සාමාජිකයන්ද මියයෑම, තුවාල වීම සුලභ කරුණක්ව තිබිණ. රැයක් ගෙවී තවත් දිනකට එළැඹෙද්දී බොහෝ සමීප හිතවතුන්ගේ නික්මයාම් නිරතුරුව අසන්නට ලැබුණේ හද දවාලමිනි.

මේ අතර කාලයේ කඳවුරේ අවශ්‍යතාවයක් සඳහා දිනක් මා හට පොලොන්නරුව හා හිඟුරක්ගොඩ නගර වෙත යාමට සිදුවිය. එහිදී, හිඟුරක්ගොඩ නගරයට යන අතරතුර එම ප්‍රදේශයේ වූ කනත්තක් අසලදී මෑතකදී භූමදානය කරන ලද හමුදා සාමාජිකයකුගේ සොහොනක් නෙත ගැටුණි. පර නොවූ මල්වඩම් සේම දෙපස ඇද තිබූ අලුත් පැහැය නොගිලිහුණු ගොක්කොළ ද ඒ වන විටත් මඳ සුළඟට සැලෙමින් තිබිණ. පෙර දිනක එම සොහොන අද්දරට විශාල ජනතාවක් එක් රොක්ව සිට ඇති බවට වූ සලකුණු ද එහි එමට විය. ඒ ආසන්නයේම ඡායාරූපයක් ද සහිතව ඉටි කොලයක අඳින ලද විශාල ප්‍රමාණයේ නාම පුවරුවක් එහිදී නෙත ගැටුණේ මා වික්ෂිප්ත කරවමිනි. වාකරේ ප්‍රදේශයේ දී ත්‍රස්තවාදී ප්‍රහාරයකට ලක්ව ලාන්ස් කෝප්‍රල් සුනිල් බණ්ඩාර මියගිය බවට එහි සඳහන්ව තිබිණ. ඊට දෙවසරකට පමණ එපිටදී හමුවූ ආධුනික සෙබළ සුනිල් බණ්ඩාර පිළිබඳ ඒ මොහොතේ මා මතකයට ආවේ දිය යට දූ රබර් බෝලයක් වහා ඉහළට මතු වන්නා සේය. මා මොහොතකට වාහනෙන් බැස ඔහුගේ සොහොන සමීපයට පා නැඟීය.

සොහොන දෙපස පෙරළෑ නැවුම් පස් අතර සුනිල් බණ්ඩාරගේ සුවඳ තැවරී ඇති සෙයකි. සිය ප්‍රේමයේ විරහව අත්විඳි සමයේ පෙර දිනකදී ඔහු වරක් මා සමඟ කී යමක් ඒ මොහොතේ ද මාගේ දෙසවනෙහි රැව් පිළිරැව් දෙන්නට විය. "අපිට එකතු වෙන්න බැරි වුනාට අපි දෙන්නා හදවත්වලින් කවදාවත් දුරස් වෙන්නෑ සර්" රිදුනු හිත් දරාගෙන රට සුවපත් කළ සුනිල් බණ්ඩාර වැන්නවුන් කොතෙක් වේදැයි මට සිතුණි. කටුක යුදබිමේ විඳි නේකවිද දුෂ්කරතා මැද පුද්ගලික ජීවිතවල දුක්ඛ දෝමනස්සයන්ද දරා ගනිමින් ජීවිත අවදානම අතරේ වුව රට සුරැකීම පිණිස වූ සිය මූලික අරමුණටම කැපව මහපොළොව සිපගත් දහස් ගණන් විරුවන් මේ බිමේ කොතෙක් නම් වැළලී ඇත්ද.

ඉහත සිදුවීමට මේ වනවිට 29 වසක් ගතව තිබුණද සෙබළ සුනිල් බණ්ඩාර ගේ පෙම්වතිය බිරිඳක ලෙස අද කොහේ හෝ තැනක යහතින් ඉන්නවා විය හැක. දෛවයේ හාස්කමකින් මෙන් ඇයට මේ සටහන කියවීමට ලැබෙන්නට ද ඉඩ තිබේ. එය එසේ වුවහොත් නිසැකවම ඇය සුනිල් බණ්ඩාරට කතා කරනු ඇත. ළය විනිවිද ගිය වෙඩි උණ්ඩයකට වඩා හිත පසාකරගෙන ගිය ප්‍රේම විරහවේ රිදුම වැඩි බව එහිදී ඔහු ඇයට කියාවි. එදිනට සුනිල් බණ්ඩාර ගැන මම දන්නා මතකද ඇයට කියන්නට මඟ බලා හිඳිමි.



සටහන:
ලුතිනන් කර්නල්
ප්‍රවීන් චමින්ද එදිරිසිංහ

**සොහොන දෙපස පෙරළෑ නැවුම් පස් අතර සුනිල් බණ්ඩාරගේ සුවඳ තැවරී ඇති සෙයකි. සිය ප්‍රේමයේ විරහව අත්විඳි සමයේ පෙර දිනකදී ඔහු වරක් මා සමඟ කී යමක් ඒ මොහොතේ ද මාගේ දෙසවනෙහි රැව් පිළිරැව් දෙන්නට විය. "අපිට එකතු වෙන්න බැරි වුනාට අපි දෙන්නා හදවත් වලින් කවදාවත් දුරස් වෙන්නෑ සර්" රිදුනු හිත් දරාගෙන රට සුවපත් කළ සුනිල් බණ්ඩාර වැන්නවුන් කොතෙක් වේදැයි මට සිතුණි. කටුක යුදබිමේ විඳි නේකවිද දුෂ්කරතා මැද පුද්ගලික ජීවිතවල දුක්ඛ දෝමනස්සයන්ද දරා ගනිමින් ජීවිත අවදානම අතරේ වුව රට සුරැකීම පිණිස වූ සිය මූලික අරමුණටම කැපව මහපොළොව සිපගත් දහස් ගණන් විරුවන් මේ බිමේ කොතෙක් නම් වැළලී ඇත්ද.**

# හිසට සෙවණක්









කොළඹ විපස්සනා භාවනා මධ්‍යස්ථානයේ පූජ්‍ය උඩුදුම්බර සෝභිත නාහිමියන්ගේ ආධාර මත සහ 5 වන ශ්‍රී ලංකා ජාතික ආරක්ෂක බළමුළුවේ අණදෙන නිලධාරී මේජර් එම්වී ප්‍රනාන්දු ගේ අධීක්ෂණය යටතේ එම ඒකක හටපිරිස්හි ශ්‍රම දායකත්වයෙන් තන්තිරිමලය, තම්බියාව ප්‍රදේශයේ පදිංචි අඩු ආදායම්ලාභී පවුල් 04 ක් සඳහා අංග සම්පූර්ණ නව නිවාස ඉදිකරදෙන ලදී. එම නිවාස විවෘත කිරීම සහ කළුවිල කරුණාශීලී මෙහෙණි ආරාමයේ අභිනවයෙන් ඉදිකරනු ලැබූ නාන කාමරය හා වැසිකිළි පද්ධතිය සඟසතු කොට පූජාකිරීමේ උත්සවය ඉකුත් අප්‍රේල් 17 වන දින ආරක්ෂක සේනා (වන්නි) ආඥාපති සහ 212 වන පාබල බලසේනාධිපතිගේ ප්‍රධානත්වයෙන් සිදුකරන ලදී. මෙම අවස්ථාවට එම ප්‍රදේශයේ රාජ්‍ය නිලධාරීන් ඇතුළු පිරිසක්ද සහභාගී වූහ.

ආරක්ෂක සේනා (මධ්‍යම) ආඥාපතිගේ සම්බන්ධීකරණයෙන් කොළඹ මියුසියස් විද්‍යාලයේ 1980 උසස් පෙළ කණ්ඩායමේ සාමාජිකාවන්ගේ මූල්‍ය දායකත්වය මත රුපියල් 3,000,000.00 ක් පමණ වටිනා නව නිවසක් ආබාධිත දරුවන් සිටින නිවසක් නොමැති අයකු වන අක්කර 20, හිනුක්ගල, දේවනුව ලිපිනයෙහි පදිංචි ඩබ්ලිව්එම් මදූෂා ප්‍රසාදි ධර්මපාල සහ ඔහුගේ පවුලේ අය හට ඉකුත් අප්‍රේල් 11 වන දිනට යෙදුණු සුබ මොහොතින් භාරදෙන ලදී. මෙම නිවස ඉදිකිරීම සඳහා මාස 04 ක් වැනි කෙටි කාලයක් තුළ 111 වන පාබල බලසේනාධිපතිගේ උපදෙස් පරිදි 10 වන ගජබා රෙජිමේන්තුව, 2(සේවා) ශ්‍රී ලංකා සිංහ රෙජිමේන්තුව, 1 වන රයිෆල් බලකාය සහ 17 වන ඉංජිනේරු සේවා රෙජිමේන්තු සෙබළුන්ගේ ශ්‍රම දායකත්වය හිමිවූහ.

නිවස භාරදීමේ අවස්ථාව සඳහා 111 වන පාබල බලසේනාධිපති, කොළඹ මියුසියස් විද්‍යාලයේ 1980 උසස් පෙළ කණ්ඩායමේ සාමාජිකාවන් ඇතුළු පිරිසක් සහභාගී වූහ.






සන්නද්ධ බලසේනාධිපති බ්‍රිගේඩියර් පීඒඑම් පීරිස් ආර්එස්පී යූඑස්පී පීඑස්සී ගේ අධීක්ෂණයෙන් 5 වන විමර්ශන රෙජිමේන්තුවේ අණදෙන නිලධාරී ලුතිනන් කර්නල් ඩබලිව්ඒඩබලිව්ටී සුජිත් ආර්ඩබලිව්පී පීඑස්සී ගේ මඟපෙන්වීම යටතේ එම ඒකකයේ හටපිරිස් හි ශ්‍රම දායකත්වයෙන් මැල්සිරිපුර ප්‍රදේශයේ පදිංචි සඳමාලි යන අයවළුන් වෙනුවෙන් ඉදිකරන ලද නිවසක් ඉකුත් අප්‍රේල් 02 වන දිනට යෙදුණු සුබ මොහොතින් භාරදෙන ලදී. මෙම නිවස ඉදිකිරීම සඳහා මූල්‍ය දායකත්වය දානපතියකු වූ රොහාන් ගුණසේකර මහතා විසින් සිදුකරන ලදී.

# හදිසි ප්‍රතිකාර ඒකකයට ඇඳන් පරිත්‍යාගයක්





543 වන පාබල බලසේනාධිපතිගේ අධීක්ෂණය යටතේ 11 වන ශ්‍රී ලංකා කාලතුවක්කු හමුදා බල ප්‍රදේශයේ පිහිටි තලෙයිමන්නාරම ප්‍රාදේශීය රෝහලේ නවතමයෙන් ඉදිකරන ලද හදිසි ප්‍රතිකාර ඒකකය වෙත දැඩි සත්කාර ඒකක ඇඳන් පරිත්‍යාග කිරීමේ වැඩසටහනක් ඉකුත් මාර්තු 16 වන දින එම රෝහලේදී සිදුකරන ලදී. මෙම සත්කාරය සඳහා මූල්‍ය දායකත්වය 543 වන පාබල බලසේනාධිපති සහ 4 වන සංඥා බලකායේ අණදෙන නිලධාරීගේ සම්බන්ධීකරණයෙන් යූපීඑස් රොද්‍රිගෝ මහතා විසින් දරන ලදී. මෙම අවස්ථාව සඳහා 543 වන පාබල බලසේනාධිපති, 11 වන ශ්‍රී ලංකා කාලතුවක්කු හමුදාවේ සහ 4 වන ශ්‍රී ලංකා සංඥා බලකායේ අණදෙන නිලධාරීන්, වෛද්‍යවරුන් ඇතුළු රෝහල් කාර්ය මණ්ඩලය එක්වූහ.

# සිසු දරු දැරියන් වෙනුවෙන් චෙස් පුහුණු වැඩමුළුවක්






ආරක්ෂක සේනා (යාපනය) ආඥාපතිගේ උපදෙස් පරිදි ශ්‍රී ලංකා යුද්ධ හමුදා චෙස් කමිටුවේ සහයෝගය ඇතිව යාපනය අර්ධද්වීපයේ පාසල් සිසු දරු දැරියන් අතර චෙස් ක්‍රීඩාව ප්‍රචලිත කිරීමේ අරමුණින් 51 වන පාබල සේනාංකයේදී චෙස් ක්‍රීඩාව පිළිබඳ දෙදින වැඩමුළුවක් ඉකුත් මාර්තු 12 සහ 13 යන දිනයන්හිදී පවත්වන ලදී. 51 වන පාබල සේනාංකාධිපති මේජර් ජෙනරාල් එම්ඩබ්ලිව්ඩබ්ලිව්ඩබ්ලිව්එම්සීබී වික්‍රමසිංහ ආර්ඩබ්ලිව්පී ආර්එස්පී එන්ඩීයූ ගේ අධීක්ෂණය යටතේ පැවති මෙම වැඩමුළුවේදී පාසල් දූ දරුවන් හට චෙස් ක්‍රීඩාව පිළිබඳ මූලික දැනුම, චෙස් ක්‍රීඩාවේ නීතිරීති පිළිබඳව චෙස් ජාතික විනිසුරු සංජුල රවිනාත් මහතා සහ ශ්‍රී ලංකා යුද්ධ හමුදා චෙස් කමිටුවේ උපදේශක මණ්ඩලය විසින් උපදේශනය සිදුකරන ලදී. දමිළ මාධ්‍යයෙන් පැවති මෙම වැඩමුළුව සඳහා ප්‍රදේශයේ පාසල් 10 ක් නියෝජනය කරමින් දූ දරුවන් 62 දෙනකු සහභාගී වූහ.

# සෙබළුන් වෙත පහසුකම් සලසමින්





රෙජිමේන්තු මධ්‍යස්ථානය ශ්‍රී ලංකා ජාතික ආරක්ෂක බළමුළුව, 4 වන ශ්‍රී ලංකා ජාතික ආරක්ෂක බළමුළුව සහ ශ්‍රී ලංකා ජාතික ආරක්ෂක බළමුළුවේ සරඹ කණ්ඩායමේ දායකත්වයෙන් මාස 04 ක් වැනි කෙටි කාලයක් තුළදී ඉදිකරන ලද සෙසුනිල හට නිවාසයක් ශ්‍රී ලංකා ජාතික ආරක්ෂක බළමුළුවේ සරඹ කණ්ඩායමේ ප්‍රයෝජනය සඳහා ඉකුත් අප්‍රේල් 16 වන දින 4 වන ශ්‍රී ලංකා ජාතික ආරක්ෂක බළමුළුවේ අණදෙන නිලධාරී ලුතිනන් කර්නල් එස්එම්පී බංඩාර විසින් විවෘත කරන ලදී.



# මේ තරම් හොඳින් සිංහල භාෂාව උච්චාරණය කරන එකම විදේශීය නළුවා මමයි

## රංගන ශිල්පීඃ ක්‍රිස් හෙන්රි හැරිස්

ප්‍රංශ ජාතික පියකුට දාව බ්‍රිතාන්‍ය ජාතික මවකගේ කුසින් ජර්මනියේ දී මෙලොව එළිය දුටු ඔහු සිය කුඩා අවධිය ගත කරනුයේ අමෙරිකාවේ කැලිෆෝනියා ප්‍රාන්තයේය. භද්‍ර යෞවනයට එළඹෙද්දී ජුන් වේර්තුර් (*Jeune wertrer*) නම් ප්‍රංශ චිත්‍රපටියකින් රංගනයට අත්පොත් තැබූ හෙතෙම ඉන් අනතුරුව කොලිවුඩ්, බොලිවුඩ් හා ශ්‍රී ලාංකීය චිත්‍රපටවල විවිධ චරිතයන් නිරූපණය කර තිබේ. එමෙන්ම කලකට ඉහත දී මේ රට පුංචි තිරයේ විකාශය වූ "ධවල කඩුල්ල" නමැති ටෙලි නාට්‍යයේ දක්වන ලද සුවිශේෂී රංගන කුසලතාවය හේතුවෙන් රයිගම් ටෙලි සම්මාන උළෙලේදී සම්මානයට පාත්‍රවූ එකම විදේශීය නළුවා වූයේ ද ඔහුමය. එමෙන්ම මෑත කාලයේදී ශ්‍රී ලංකාව තුළ රූගත කරන ලද *bombay velvet* නමැති බොලිවුඩ් චිත්‍රපටියේ පෘතුගීසි ජාතික ජෙනරාල්වරයකු ගේ චරිතයට ජීවය ලබා දුන්නේද ඔහුමය. ක්‍රිස් හෙන්රි හැරිස් (*Chris Henri Harriz*) නමැති ඇමරිකානු ජාතික රංගන ශිල්පියා පුවත්පත් පිළිසඳරක් වෙනුවෙන් අප හා එක් වූයේ මේ අයුරිනි.

**ප්‍රශ්නය :-** විදේශීය නළුවකු වන ඔබ ශ්‍රී ලාංකීය චිත්‍රපටිවලට සම්බන්ධ වූයේ කෙසේද?

**පිළිතුරු:-** මා ඇමරිකාවේ පදිංචි වී සිටියදී මගේ පෙම්වතිය වූයේ ශ්‍රී ලාංකීය තරුණියක්. මා ඇයව විවාහ කර ගත් පසු, මීට වසර විස්සකට පමණ ඉහතදී ශ්‍රී ලංකාවට පැමිණියා. එමෙන්ම එම කාලසීමාව තුළදී, ශ්‍රී ලාංකීය ජනතාවගේ සිතුම් පැතුම්, ඔවුන්ගේ සංස්කෘතිය හා ආහාර රටා ආදිය පිළිබඳව මැනවින් අවබෝධ කරගැනීමට පමණක් නොව, සිංහල භාෂාවද ඉතා මැනවින් හැසිරවීමටද මට හැකි වුණා. මා දන්නා තරමින් සිංහල භාෂාව මේ තරම් ව්‍යක්ත අයුරින් උච්චාරණය කරන එකම විදේශීය නළුවා මා විය යුතුයි.

**ප්‍රශ්නය :-** මේ දක්වා ඔබ සම්බන්ධ වී ඇති දේශීය හා විදේශීය නිර්මාණ පිළිබඳ ව යමක් සඳහන් කළොත්?

**පිළිතුර :-** මෙරට රූපවාහිනී නාලිකාවකින් විකාශය වූ "මහතලා හටන" මගේ රංගන ජීවිතයේ සුවිශේෂී සංධිස්ථානයක් ලෙස මා දකිනවා. අධිරාජ්‍යවාදී සුදු ජාතිකයකු ලෙස එහි චරිත නිරූපණයක යෙදුන මා බොලිවුඩ් චිත්‍රපටයක් වෙනුවෙන් ප්‍රථම වරට දායක වූයේ රජිනි කාන්තගේ රොබෝ (*RoBo*) චිත්‍රපටිය වෙනුවෙන්, එම චිත්‍රපටයේ රජිනිකාන්ත් මෙන්ම සුරූපී බොලිවුඩ් නිළි අයිශ්වර්යා රායි ද සමගින් රංගනයේ නිරතවීමට මට අවස්ථාව උදා වුණා. එමෙන්ම පසුගිය කාලසීමාව තුළ ස්වාධීන රූපවාහිනී නාලිකාව තුළ විකාශය වූ "රන්ගිර" නමැති ටෙලි නාට්‍යයේ මිලානෝ නමැති විදේශීය මහාචාර්යවරයා ගේ චරිතයත් මා ඉතා කැමැත්තෙන් දායක වුණු නිර්මාණයක් ලෙස හැඳින්විය හැකියි. එමෙන්ම බර්ට්‍රම් නිහාල් අධ්‍යක්ෂණය කළ "අමරපුර" ටෙලි නාට්‍යයේ බෞද්ධ භික්ෂුවක ලෙස මා කළ චරිත නිරූපණයටත් මෙරට ජනතාවගෙන් විශාල ප්‍රතිචාරයක් මට ලැබුණා. ඒ වගේම ප්‍රවීණ රංගන ශිල්පී සනත් ගුණතිලකයන් අධ්‍යක්ෂණය කරන

ලද "සිහිනය අතරින්" නමැති චිත්‍රපටයේ මා ප්‍රධාන චරිතයක් නිරූපණය කළා. තවද, දීපා මේතා අධ්‍යක්ෂණය කළ "*midnight children*" නමැති චිත්‍රපටයට මෙන්ම ඇමරිකාවේ රූපවාහිනී නාටක මාලාවක් වන "*Bad boys of Boston*" සඳහාද මගේ රංගන දායකත්වය ලබාදී තිබෙනවා .

**ප්‍රශ්නය :-** ඔබ හොලිවුඩ් සහ බොලිවුඩ්හි නිපදවන ලද දැවැන්ත චිත්‍රපටවල රංගනයෙන් දායක වූ නළුවෙක්. එම චිත්‍රපට හා සසඳා බැලීමේදී, ශ්‍රී ලාංකීය චිත්‍රපට වෙනුවෙන් ඔබට ලැබුණු ගෙවීම් පිළිබඳව රංගන ශිල්පියකු වශයෙන් ඔබ තෘප්තිමත්ද?

**පිළිතුර :-** මෙරට සිදුකරන ශ්‍රී ලාංකීය නිර්මාණ වෙනුවෙන් මගේ රංගන දායකත්වය ලබාදෙන්නේ ඊට ලැබෙන මුදල පිළිබඳ සිතා නොවෙයි. ඇත්තෙන්ම කියනවා නම් සුවසේ ජීවත් වීමට අවශ්‍ය ප්‍රමාණයටත් වඩා අති විශාල මුදල් සම්භාරයක් හොලිවුඩ් සහ බොලිවුඩ් චිත්‍රපටවල රංගනයේ නිරත වීමෙන් මා උපයාගෙන තිබෙනවා. ඒ වගේම මා ශ්‍රී ලාංකීය නිර්මාණයක් වෙනුවෙන් දායක වන්නේ එහි තිර පිටපත කියවා බලා ඒ පිළිබඳව මා සෑහීමකට පත් වනවානම් පමණයි. ඒ අනුව ප්‍රේක්ෂකයාගේ විඥානය මොට කරන කිසිදු චිත්‍රපටයකට හෝ ටෙලි නාට්‍යයකට මා දායක වන්නේ නැහැ. එහෙත් අඩු පිරිවැයක් යටතේ නිපදවන උසස් මට්ටමේ කලා නිර්මාණයක් වෙනුවෙන් මට ආරාධනාවක් ලැබුන හොත්, එහි නිෂ්පාදකවරුන්ට දැරිය හැකි මට්ටමේ මුදලකට මගේ රංගන දායකත්වය ලබාදුන් අවස්ථා එමටයි. ඒ අනුව මෙරට ප්‍රේක්ෂකයන්ගේ රස වින්දනය වෙනුවෙන් ඉදිරියේදී සිදුකරන කලා නිර්මාණයකට මගේ රංගන දායකත්වය නො අඩුවම ලැබේවි.

**ප්‍රශ්නය :-** ශ්‍රී ලාංකීය නිර්මාණ වෙනුවෙන් එසේ තේරීමක් කරන ඔබ, හොලිවුඩ් හා බොලිවුඩ් චිත්‍රපටවල රඟපාන්නේත් එසේ චරිතයන් තෝරා බේරා ගෙනද?







**පිළිතුර :-** කොහෙත්ම නැහැ. බොලිවුඩ් හා හොලිවුඩ් නිර්මාණයන් වලදී මා අනිවාර්යයෙන්ම මගේ ගාස්තුව ලබා ගන්නවා. එහි දී මා කටයුතු කරන්නේ වෘත්තීය මට්ටමින් පමණයි. නිදසුනක් වශයෙන් බොලිවුඩ්හි නිපදවන චිත්‍රපටියක් ඉන්දියාවේ ප්‍රාන්ත කිහිපයක ප්‍රදර්ශනය කරනවාද? ඔවුන් එම චිත්‍රපටයේ ගීතමය ජවනිකාවකට පමණක් කොපමණ මුදලක් වැය කරනවාද? ඔවුන් එසේ නිර්භයව මුදල් වැය කරනුයේ එසේ වැය කරන ලද මුදල මෙන් සිය ගුණයක මුදලක් නැවත උපයාගත හැකි නිසයි. එම රටවල සිනමාව යනු අති විශාල කර්මාන්තයක්. හොලිවුඩ්වලත් එසේමයි. ඉතින් ශ්‍රී ලංකාවේදී සිදු කරන කලා නිර්මාණ වෙනුවෙන් චරිත තෝරා බේරා ගනිමින් රංගනයේ නිරත වීමට මට හැකියාවක් ඇත්තේ අද ආර්ථික වශයෙන් ඉතාමත් ස්ථාවර තත්වයක මා සිටින නිසයි. හොලිවුඩ් හා බොලිවුඩ්හි නිෂ්පාදනය වූ දැවැන්ත චිත්‍රපටවලට සම්බන්ධ වීමට ලැබීමෙන් මගේ ඉලක්කයන් කරා පහසුවෙන් ළඟා වීමට මට හැකියාවක් ලැබුණා.

**ප්‍රශ්නය :-** ඔබ රිදී තිරය මෙන්ම පුංචි තිරයටත් එකසේ ඇල්මක් දක්වන නළුවෙක්ද?

**පිළිතුර :-** නළුවෙක් වශයෙන් මම වඩාත් ඇල්මක් දක්වන්නේ රිදී තිරයටයි. එනමුත් ඒ නිසාවෙන් කිසිවිටකත් පුංචි තිරය ප්‍රතික්ෂේප කිරීමට මා පෙළඹෙන්නේ නැහැ. මීට කලකට ඉහතදී ස්වර්ණවාහිනී නාලිකාව මගින් විකාශය වූ "බණ්ඩාර දෙයියෝ" නමැති කොටස් 50 කින් සමන්විත මාලා නාටකයක, යටත් විජිත සමයෙහි මෙරට අලි දඩයමේ යෙදුණු සුදු ජාතික මේජර්වරයකුගේ චරිතයක් තුළින්ද ශ්‍රී ලාංකීය ප්‍රේක්ෂක ජනතාවගේ අවධානය දිනාගැනීමට මට හැකි වුණා. ප්‍රවීණ අධ්‍යක්ෂකවරයකු වන සරත් ධර්මසිරි අධ්‍යක්ෂණය කරන ලද මෙම මාලා නාටකයේ ප්‍රවීණ රංගන ශිල්පී ජැක්සන් ඇන්තනී සමගින් රංගනයේ නිරත වීමට ලැබීම මා ලද භාග්‍යයක් වශයෙන් හැඳින්විය හැකියි.



සටහන
ලුතිනන් දමින්ද සෙනරත්
ශ්‍රීලියපොදුසෙබ,
ජනමාධ්‍ය අධ්‍යක්ෂ මණ්ඩලය
යුද්ධ හමුදා මූලස්ථානය



# කුසට අහරක්
## යුද්ධ හමුදා මෙහෙවරක්

ශ්‍රී ලංකා යුද්ධ හමුදාව ලොව පුරා ප්‍රචලිතව සිටිනුයේ උසස් මානුෂික ගුණාංගයන්ගෙන් පිරිපුන් මෙන්ම ඉහළ ගණයේ මාහැඟි විනයානුකූල ශික්ෂණයන්ගෙන් යුක්ත සුවිශේෂී මානව හිතවාදීන්ගෙන් පරිපූර්ණ කණ්ඩායමක් වශයෙනි. එවැනි වෘත්තීය හමුදාවක සාමාජිකයින් වීම පමණක්ම අප හට සමස්ත ජාතියේම භක්තිය හා ආදරය නිතැතින්ම හිමිවන දේශයේ මුරදේවතාවන් යන ගෞරවණීය ආමන්ත්‍රණයන්ගෙන් පිදුම් ලැබීමට හේතු වී ඇත. ඒ තරම් මාහැඟි වටිනාකමක් අප වෙත ලැබී ඇත්තේ අප රණවිරුවන් ලෙස ජීවිත පරිත්‍යාගයෙන් මව්බිමේ භෞමික අඛණ්ඩතාවය හා ස්වෛරීභාවය ආරක්‍ෂා කරගැනීම වෙනුවෙන් මෙන්ම රටේ සිදුවන ඕනෑම ව්‍යසනයකදී තම ජීවිතයට සිදුවන අනතුරු ගැන නොසලකා මහජනතාවගේ ජීවිත දේපළ ආරක්‍ෂාව වෙනුවෙන් පෙරට එන සැබෑ වීරයන් කවුරුන්ද යන්න ඔවුන් හොඳින්ම දන්නා නිසාවෙනි.

එදා 2006 වර්ෂයේදී නැගෙනහිර මාවිල්ආරු සොරොව්ව වසා දහස් ගණන් ගොවි ජනතාවගේ කුඹුරු බිම්වලට ජලය ලබාදීම වැළකූ කුරිරු ත්‍රස්තවාදීන්ගේ අමනෝඥ ක්‍රියාවට එරෙහිව මානුෂීය මෙහෙයුමක් මගින් පිළිතුරු දුන් අප රණවිරුවන් 2009.05.18 වන දින නන්දිකඩාල් කලපුවේදී ඒ ම්ලේච්ඡ ත්‍රස්තවාදය අවසන් කළේ දශක ගණනාවක් අපගේ ආදරණීය මව්බිම වසාලූ අඳුරු සෙවනැලි සහමුලින්ම මකා දමමිනි. කිසිදු දිනෙක සහෝදර වෙනත් ජාතීන්ට එල්ල නොවූ අප රණවිරුවන්ගේ අවි නොනවත්වා රුදුරු ත්‍රස්තවාදීන් පසුපස හඹා ගොස් නන්දිකඩාල් කලපුවේදී සටහන් කළේ වසර 30 ක් පුරා කිසිදා පරාජයට පත් කළ නොහැකි බවට වහසි බස් දෙඩවූ තවත් ලේ පිපාසිතයින් පිරිසකගේ ජනඝාතක යුද්ධයට නැවතීමේ සලකුණයි.

එදා නන්දිකඩාල් හා වඩ්ඩුවාකල් කලපු තීරයන් මගින් ත්‍රස්තවාදී ග්‍රහණයෙන් මිදී හමුදා පාලන ප්‍රදේශයට පැමිණි අපගේ සහෝදර දමිළ ජනතාව හට තමාගේ බත් පැකට්ටුව වතුර බෝතලය ලබාදී ඔවුන්ගේ කුසගින්න නිවා දැමීමට කටයුතු කළේද ඔවුන්ට අවශ්‍ය වෛද්‍ය ප්‍රතිකාර ලබාදී සුවපත් කළේද අපගේ ආදරණීය රණවිරුවන්ය. දින ගණන් ත්‍රස්තවාදීන් බලහත්කාරයෙන් රඳවා ගෙන සිට විවිධ ශාරීරික හා මානසික පීඩාවන්ට ලක්ව සිටි දමිළ සොයුරු සොයුරියන්ගේ දරුවන් තම ලැමට තොවා ගෙන ඇප උපස්ථාන කළ අප කාන්තා බලකා රණවිරුවරියන්ගේ සජීවී දසුන් අන්තර්ජාතික මාධ්‍ය කලඹමින් පැතිර ගියේ අප හමුදාවේ මානුෂික ගුණාංග මුළු ලොවටම පෙන්වා දෙමිනි.

එසේම කොවිඩ් 19 වසංගතය උච්ච අවස්ථාවට පත්ව සිටි අවස්ථාවන්හිදී සිවිල් ජනතාව නිරෝධායන මධ්‍යස්ථාන ගත කිරීම පිණිස තමා පුද්ගලිකව පරිහරණය කළ ඇඳ කොට්ට මෙට්ට පවා පරිත්‍යාග කිරීමට තරම් උතුම් සිතුවිලි සහිත අප හමුදාව ලෝකයේ හොඳම මානුෂීය හමුදාව ලෙස පිදුම් ලබන්නට තවත් සුදුසුකම් කුමටද. ලොවක් බිය ගැන්වූ එම වසංගතය හමුවේද නිර්භීතව ඉදිරියට පැමිණ නිරෝධායනය හා එන්නත්කරණය සඳහා දැවැන්ත දායකත්වයන් සපයා අද ශ්‍රී ලාංකික ජනතාව නිදහසේ කල්ගත කරනු බලා නිහඬව සතුටු වන පිරිස රණවිරුවන්මය.

එදවස මානුෂීය මෙහෙවර වර්තමානයේදී වෙනත් මුහුණුවරකින් දියත් කිරීමට ආරක්‍ෂක සේනා මූලස්ථානය (මධ්‍යම) වෙතින් කටයුතු යොදා ඇත. ඒ අනුව ආරක්‍ෂක මාණ්ඩලික ප්‍රධානී හා යුද්ධ හමුදාධිපති ගේ උදාර සංකල්පයක් ක්‍රියාවට නංවමින් ආරක්‍ෂක සේනා ආඥාපති මේජර් ජෙනරාල් එම්කේඑස් සිල්වා ආර්ඩබ්ලිව්පී ආර්එස්පී එන්ඩීයූ ගේ උපදෙස්, මගපෙන්වීම හා සෘජු අධීක්‍ෂණය යටතේ ක්‍රියාත්මක වන මෙම වැඩපිළිවෙල නම් කර ඇත්තේ "කුසට අහරක් යුද්ධ හමුදා මෙහෙවරක්" යනුවෙනි.

අප කවුරුත් දන්නා පරිදි දියතලාව සෙබළුන්ගේ උපන් බිමයි. අතීතයේ සිට යුද්ධ හමුදා මධ්‍යස්ථානයක් වශයෙන් ක්‍රියාත්මක දියතලාව නගරය මේ වනවිට කඳවුරු කිහිපයක් ස්ථානගත යුද්ධ හමුදා නගරයක් *(Garrison city)* ලෙස හැඳින්වේ. "කුසට අහරක් යුද්ධ හමුදා මෙහෙවරක්" යනුවෙන් වූ මෙම වැඩපිළිවෙල යටතේ සිදුකරනුයේ දියතලාව නගරාසන්නයේ පිහිටි කඳවුරුවල රාජකාරී නියුතු නිලධාරීන් හා සෙසුනිලයින්ගේ දිවා ආහාරය සකස් කිරීමේදී අමතර ආහාර පාර්සල් කිහිපයක් වෙන්ව සකස් කර යුද්ධ



හමුදා සුබසාධක වෙළඳසැල (දියතලාව) අසල විශේෂයෙන් සකස් කර ඇති වීදුරුවලින් නිර්මිත කබඩයක තබා ආර්ථික අපහසුතාවන්ගෙන් පෙළෙන මහජනතාව වෙත පරිභෝජනය පිණිස ලබාගැනීමට අවස්ථාව සලසාදීමයි. 2022.02.02 වන දින මෙම ක්‍රියාවලිය ආරම්භ වූ දින සිට මේ දක්වා ප්‍රදේශයේ දුගී යාචක ජනතාව එදිනෙදා සුළු රැකියාවක් සිදුකර ජීවිකාව සපයා ගන්නා මෙන්ම තරමක් දුර බැහැර සිට දියතලාව රෝහල වෙත පැමිණෙන අසරණ මිනිසුන්ගේ කුසගින්න නිවාලන මහෝෂයක් බවට පත්වී ඇත්තේ යුද්ධ හමුදාවේ මානුෂීය ගුණය ලොවටම විදහා දක්වමිනි.

මේ දිනවල රටේ පවතින ආර්ථිකමය ගැටලු හා සාමාජීය දුෂ්කරතා මත අඩු ආදායම් ලබන පහළ ස්ථරයට අයත් අපගේ ආදරණීය මහජනතාව කෙටිකාලීනව හෝ යම් දුෂ්කරතාවයකට පත්ව සිටින බව අප කවුරුත් පිළිගත යුතු සත්‍යයකි. කවදත් ශ්‍රී ලාංකික ජනතාව වෙත දුකක් කරදරයක් වූ විට පළමුව ඉදිරිපත් වන දේශයේ මුර දේවතාවන් වන රණවිරුවන් මේ සිදුකරනුයේද තමාට ලැබී ඇති ආහාරයෙන් කොටසක් අසරණ ජනතාවගේ කුසගිනි නිවීමට දරණ ඉතාමත් මානුෂීය ගණයේලා සැලකිය හැකි උත්තම පරිත්‍යාගයක් වුවද එය සත්‍ය වශයෙන්ම අපහට හැකි මට්ටමේ ඉතා කුඩා උත්සාහයක් පමණක් බවද සැලකිය යුතුය. මෙය සමාන කළ හැක්කේ අඳුරට දොස් පවරනවාට වඩා එක් කුඩා පහනක් හෝ දැල්වීම යන පැරණි ආප්තෝපදේශයට පමණි.

සෑම දිනකම මධ්‍යාහ්න 1200 පමණ සිට යුද්ධ හමුදා සුබසාධක වෙළඳසැල අභියස කුසට අහරක් බලාපොරොත්තුවෙන් පෙළගැසී සිටින අපගේම සහෝදර ජනතාව මෙන්ම ආසේමු (මධ්‍යම) කාර්ය මණ්ඩලය යුහුසුලුව ඔවුන් හට ආහාර පාර්සල් බෙදාහැරීමට ක්‍රියාකරනු දැකීම මේ වනවිට සුන්දර දියතලාව නගරය හරහා ගමන් ගන්නා සියලුදෙනාටම හුරුපුරුදු දර්ශනයක් වී ඇත. ආහාර ලබාගන්නා සිවිල් ජනතාව කිසිදු ජාති ආගම් භේදයකින් තොරව යුද්ධ හමුදාව වෙත දක්වන සංවේදී ප්‍රතිචාරයන් ඉතා හැඟුම් බරවූ අවස්ථාවන් ද ඇත.

ආරම්භයේදී දිනකට ආහාර පාර්සල් 30 - 35 අතර ප්‍රමාණයක් අතර ප්‍රමාණයක් මහජනතාව අතර බෙදාදුන්නද අද දින වන විට එය දිනකට 40 - 45 අතර ප්‍රමාණයක් දක්වා වර්ධනය කරගැනීමට හැකියාව ලැබී ඇත. එසේම 2022.02.02 දින සිට 2022.04.24 දින දක්වා මේ වන විට ආහාර පාර්සල් 2763 ක ප්‍රමාණයක් මහජනතාව අතරේ බෙදාදීමට හැකියාව ලැබී තිබීම ඉතා සතුටට කරුණකි. මෙම සත්ක්‍රියාව රජයේ නිවාඩු දින හෝ වෙනත් කිසිදු දිනයක නොනවත්වා කර ගෙන යාම ප්‍රදේශයේ සෑම මට්ටමකම සිවිල් ජනතාවගේ මහත් ප්‍රසාදයට ලක්වී ඇති අතර කඳවුරු වෙතින් ලබාදෙන ආහාර පාර්සල්වලට අමතරව ඇතැම් ජ්‍යෙෂ්ඨ නිලධාරීන් පවා තම පුද්ගලික මුදලින් ආහාර මිලදීගෙන මෙම ස්ථානයට පරිත්‍යාග කරනුයේ මෙවැනි උත්තරීතර කාර්යයක මාහැඟි ආනිසංස පිළිබඳව ඇති අවබෝධය මෙන්ම යුද්ධ හමුදා සාමාජිකයන්ගේ පරාර්ථකාමී හා උත්තම ගුණාංගයන් පිළිබඳව සැමට ආදර්ශයක් ලබා දෙමිනි.

මෙම උතුම් කාර්යය අඛණ්ඩව සිදුකිරීමට අවැසි ශක්තිය හා ධෛර්යය ආසේමු (මධ්‍යම) කාර්ය මණ්ඩලය වෙත ලැබේවා යන්න සියලුදෙනාගේ ප්‍රාර්ථනාව වනවා මෙන්ම ආහාර පාර්සල් දෛනිකව සැපයීම මගින් මෙම ප්‍රජා සත්කාරය ඉටු කිරීමට අපරිමිත දායකත්වයක් ලබා දෙන සෙව්පුපා (දිය), 1 ගැහේබ 7 ශ්‍රීලංසංබ, 17 ඉසේරෙ, 8 ශ්‍රීලයුසේබ, 7 ශ්‍රීලයුහපොහේබ, 2 (සෙව්) ශ්‍රීලවියාඉ, 3 (සෙව්) ශ්‍රීලයුකාබ, යුහරෝ (දිය) යන කඳවුරුහි රාජකාරී නියුතු සියලු නිලධාරී/සෙසුනිලයන් වෙත උපහාරය හිමිවනු නොඅනුමානය.



මේජර් පේවීබී කාංචන -17(සෙව්)විපාරෙ
නිලධාරී අණදෙන
යුද්ධ හමුදා සුභසාධක වෙළඳසැල
(දියතලාව)

# යුද සාහිත්‍යය දේශනයක්





යුද්ධ හමුදා අංශ, ආයතන තුළ හා සිවිල් සමාජය අතර යුද සාහිත්‍යය ප්‍රචලිත කිරීම වෙනුවෙන් යුද හමුදා මනෝවිද්‍යාත්මක මෙහෙයුම් අධ්‍යක්‍ෂ මණ්ඩලයේ මෙහෙයවීමෙන් දීපව්‍යාප්තව සිදුකෙරෙන දේශන මාලාවේ තවත් අදියරක් ඉකුත් අප්‍රේල් 28 වන දින වත්තල රණවිරු සම්පත් කේන්ද්‍රයේදී පැවැත්විණ. එම දේශනය මනෝවිද්‍යාත්මක මෙහෙයුම් අධ්‍යක්‍ෂ මණ්ඩලයේ රාජකාරියෙහි නියුතු ලුතිනන් කර්නල් සුජිත් චමින්ද එදිරිසිංහ විසින් මෙහෙයවන ලදී. තිස්වසක් පුරා මෙරට පැවති ත්‍රස්තවාදය මුලිනුපුටා දැමීමේ ඓතිහාසික සටනට සෘජු ලෙස දායක වූ විරුවන් අගයමින් එකී මතක හා අත්දැකීම් පිළිබඳ නව පරපුර දැනුවත් කරමින් යුද සාහිත්‍යයක් මෙරට තුළ බිහිකිරීම මෙම වැඩසටහනෙහි අරමුණයි.





# හැමදාමත් අපි රට වෙනුවෙන්

රටේ පවතින සමාජ, ආර්ථික, දේශපාලනික ප්‍රශ්න සෙසු ජනතාවට වගේම හමුදාවටත් එක විදිහට දැනෙනවා. නමුත්, හමුදාව එවැනි ප්‍රශ්නවලදී ක්‍රියාකරන ආකාරය වෙනස්. සමස්තයක් ලෙස කුමන බලපෑම් හමුවේ වුනත් රණවිරුවො කිසිවිටෙකත් තමන්ගේ මූලික අරමුණින් බැහැර වෙන්නේ නැහැ. ඇතැම් සුළු පිරිස් වැරදි අර්ථකතන දැක්වූවත්, හමුදාවේ මෙහෙවරට පක්ෂ පාට භේදයක් නැහැ. රට සුරකින එක හමුදාවේ පරම වගකීම. ඒ වගේමයි ස්වභාවික විපත් වලදී ජනතාව ඉන් මුදවා ගෙන ජන ජීවිතය යහපත්ව පවත්වා ගැනීම වෙනුවෙන් හැකි සෑම දෙයක්ම කිරීමටත්, හමුදාව පසුබට වෙන්නේ නැහැ. හමුදාවෙ මේ කැපවීම අද ඊයෙ ඇරඹුනු දෙයක් නෙමෙයි. ඒ වගේමයි ඒක පුරුදුවෙන්න කරන දේකුත් නෙමෙයි. ඒ අකාලික මෙහෙවරක්.












අද වන විට අපේ රටේ ඇතිවී තිබෙන ආර්ථික අවපාතය හමුවේ රටක් ලෙස ගොඩඒමට විවිධ පාර්ශව උත්සාහ දරමින් සිටින බව පේනව. ඒ සඳහා තීන්දු තීරණ ගැනීමේ බලය ඇත්තේ දේශපාලන බල අධිකාරියටයි. හමුදාව ලෙස අපි කරන්නෙ රට තුළ ඊට සුදුසු සාමකාමී වටපිටාව ඇතිකරන එකයි. ඒ නිසාමයි ජන ජීවිතවල එදිනෙදා කටයුතුවලදී මේ තරම් හමුදාව සහයට එන්නෙ. හමුදාව කවදාවත් අත්තනෝමතික ලෙස කටයුතු කරන්නෙ නැහැ. සිය පුහුණුවේදී ලබන විනය, ඉවසීම, දරාගැනීම ආදී හැම ගුණාංගයක්ම හමුදාව ප්‍රායෝගිකව ඔප්පු කරල පෙන්වන කාලයක් මේ.





# කාබනික පොහොර නිෂ්පාදනයට වැඩසටහන් රැසක්





68 වන පාබල සේනාංකයේ නිලධාරීන්, සෙසුනිලයින් සහ ශ්‍රීලවියාඉ කාර්මිකයින් විසින් කාබනික පොහොර නිෂ්පාදනය කිරීම සඳහා ගස් කොළ අතු කුඩු කිරීමට යොදාගත හැකි *"Agri Shreder"* නමැති යන්ත්‍රයක් නිර්මාණය කරන ලදී. එම යන්ත්‍රය ක්‍රියාත්මක කිරීමේ මංගල අවස්ථාව 68 වන පාබල සේනාංකාධිපති බ්‍රිගේඩියර් ආර්ඩබ්ලිව් පොන්නම්පෙරුම ආර්එස්පී විසින් ඉකුත් අප්‍රේල් 08 වන දින සිදුකරන ලදී.





රට තුළ ආහාර සුරක්‍ෂිතභාවය ඇති කිරීම උදෙසා හරිත කෘෂිකර්ම පර්යේෂණ මධ්‍යස්ථානයේ උපදෙස්වලට අනුව කාබනික පොහොර භාවිතය ජනතාව අතර ප්‍රචලිත කර ප්‍රවර්ධනය කිරීම සඳහා මහනුවර දිස්ත්‍රික් සම්බන්ධීකරණ නිලධාරී 11 වන පාබල සේනාංකාධිපති මේජර් ජෙනරාල් පීඑස්කේ සංජීව ආර්ඩබ්ලිව්පී ආර්එස්පී යූඑස්පී ගේ මගපෙන්වීම යටතේ ගොවීන් දැනුවත් කිරීමේ වැඩසටහනක් සංවිධානය කරන ලදී.

එයට සමගාමීව 2022 මාර්තු 28 වන දින ගලගෙදර, බදුලගොඩ, අළුදෙණිය හා හතරලියද්ද ගොවිජන සේවා මධ්‍යස්ථානයන්හි බයෝ නැචුරල් ෆුඩ් සහ බයෝ ෆර්ට් යන ආයතන සම්බන්ධතාවයෙන් යුතුව දැනුවත් කිරීමේ වැඩසටහන් පවත්වන ලදී. මෙහිදී වී වගාවන් සඳහා එම ආයතනයන්හි කොම්පෝස්ට් පොහොර, ජෛව දියර පොහොර හා දියර පොහොර යොදන ආකාරය පිළිබඳ ඉදිරිපත් කිරීම් හා පැහැදිලි කිරීම් සිදුකරන ලද අතර, ඉන් අනතුරුව ගොවීන් මුහුණපාන ගැටලු සබැඳිවද සාකච්ඡා කරන ලදී.



142 වන පාබල බලසේනාවට අයත් පානළුව, වටරැක ප්‍රදේශයේ ස්ථානගත 10 වන ශ්‍රී ලංකා ජාතික ආරක්‍ෂක බළමුළුවේ භටපිරිස් විසින් නිෂ්පාදනය කරන ලද කාබනික පොහොර කිලෝග්‍රෑම් 16000 ක තොගයක් ලංකා පොහොර සමාගම වෙත ලබාදීම ඉකුත් මාර්තු 25 වන දින සිදුකරනු ලැබීය. 10 වන ශ්‍රී ලංකා ජාතික ආරක්‍ෂක බළමුළුවේ අණදෙන නිලධාරී මේජර් ජීඑස්එස් ගලගෙදර ගේ ප්‍රධානත්වයෙන් ඒකක මූලස්ථානයේදී ලංකා පොහොර සමාගමේ ප්‍රාදේශීය අලෙවි නියෝජිත (බස්නාහිර පළාත භාර) ආර්පී මධුර ප්‍රියන්ත මහතා වෙත අදාළ පොහොර තොගය සංකේතාත්මකව භාරදෙන ලදී.

මෙම අවස්ථාවට 10 වන ශ්‍රී ලංකා ජාතික ආරක්‍ෂක බළමුළුවේ නිලධාරීන් සහ සෙසුනිලයින් පිරිසක් සහභාගී වූහ.



# හිරමණ්ඩාරී හොන්ඩවාහිනී

## කෙටි කතාව

මම නෙත් හැර ඔරලෝසුව දෙස බැලුවෙමි. තවත් නිදාගත්තොත් ගෙදර වැඩ පරක්කු වෙනව. මම නළල පිරිමදිමින් සිතුවෙමි.

රෑ දෙගොඩහරියක් වෙනකල් මැජික් පෙට්ටියේ බහුබූත බලනවා. උදේට නැගිට ගන්න බෑ. මම යහනින් නැගිට්ටේ පසෙක සුවසේ නිදන සැමියා දෙස බලමිනි.

"තාත්ති... මෙන්න තේ එක". අනතුරුව මම වතුර වීදුරුවත් කෝපි බඳුනත් ඇඳ ලඟ ටීපෝව මත තබා ආලින්දයට පැමිණියෙමි.

මාලු පැංකියේ ලොකුම රන් මාලුවා මැරී උඩ පාවෙමින් සිටී. අපරාදේ... මාළුන්ට කෑම ටික දමමින් මම සිතුවෙමි. ආයු හරින්නට කාලය නම් ආවෙ නෑ.

"මොකද අනේ ඔයාට වෙලා තියෙන්නේ. මේ කාලේ ගිනියමට හැමදාම උදේට කිරි කෝපි බොන්න හොඳද?" සැමියා කෝපි කෝප්පය රැගෙන ආලින්දයට පැමිණෙමින් ඇසුවේය.

අද දවසේ පළමු චෝදනාව....

"ඇයි... මම පුංචි කාලේ ඉඳලම උදේට නැගිටලා බොන්නෙ කිරි කෝපි එකක්". මා එසේ කීවේ සිතින් පමණකි. එය ගුණදායක කතාවකි.

හෙට ඉඳල ඔයාට තේ හදන්නම්කෝ... මින් මතු ඉල්ලුවොත් විනා සැමියාට කෝපි නොලැබෙන බව සහතික කරමින් මම කීවෙමි.

උදේ තේ බඳුන් සෝදා දමා මම අතුගාන්නට වුනෙමි. මිනිත්තු දහයකින් අතුගාන්න පුළුවන්. ගෙයක් වුනානම් මොකද? අතුගාමින් මම සිතුවෙමි.

පව්... මම එහෙම හිතන එක දැන් කාලෙ අපි මේ වගේ ගෙවල් කොහොම හදන්නද?

උදයේ තේ පානයේදී දෙවැනි චෝදනාව එල්ල විය.

"ඉඳිආප්ප තියන දවසට හොද්දක් හදන්න දන්නෙ නැද්ද? වැඩක් කියල කරව ගන්නවත් බෑ".

ඇතැමුන්ට හොදි නැතුව ඉඳිආප්ප කෑ නොහැක්කේ හිරවෙන නිසාය.

"මෙයා හැමදාම අතුගානව. බලන්න

**නමින් අගමැතිනි වුවද මට පාලනය කිරීමට ඇත්තේ ගෘහ කර්මාන්ත අංශය, වැඩකට නැති සංස්කෘතික අමාත්‍යාංශය හා බැණුම් අසන අධ්‍යාපන අමාත්‍යාංශය පමණකි. මුදල් ක්‍රම සම්පාදන, විදේශ කටයුතු, ගමනාගමන මේ හැම දෙයකම නිෂේධ බලය ජනාධිපති සැමියා සතුකොට ගෙන ඇත.**

බාත්රූම් එකෙත් තියෙන මකුළු දැල්...." නාන කාමරේ දෙසට යමින් සැමියා පැවසීය.

අද චෝදනා එල්ල වෙනවා ඉක්මන් වැඩියි. මම සිතුවෙමි.

රටකින් ආවට පසු සැමියාට කුමක්දෝ විපරීතයක් සිදුවී ඇති බවක් මට සිතෙයි. දූවිලි පොදක්, කුණු රොදක් පෙනෙන්නට බැරිය. මැද පෙරදිග මන්දිරවල පවිත්‍රතාවය එහි සේවිකාවන් ඉතා පිළිවෙලට පිරිසිදුවට වැඩ කරන බව ඔහු පුන පුනා කියා ඇත.

ලබන සැරේ ඔයා එනකොට අපේ ගෙදරටත් එක්කෙනෙක් ගේනවද? මම අහිංසකව ඇසුවෙමි.

සැමියා මා දෙස ඔරවා බැලිය.

"වැඩ කරවා ගන්න නෙමෙයි අනේ... වැඩ ඉගෙන ගන්න".

"ගෙදරට බඩු ගේන්න ඕනෑ කිව්වා නේද? ලැස්ති වෙන්න යනවා නම්". දිවා භෝජනය නිමා වූ පසු සැමියා මෝටර් බයිසිකලය පිස දමමින් කීවේය.

මම හනිකට ගවුමක් ඇගලා ගතිමි.

පැණි ටිකකුත් ගනිමු. මම ප්ලාස්ටික් බඳුන බෑගය තුළට දමා ගතිමි.

මේ කරදරේනෙ කරන්න බැරි. ආණ්ඩුව හදන්නේ බලහත්කාරයෙන් අපේ ඔලුව බේරලා දෙන්න. අපේ ඔළුව කොහේ හප්පගත්තාම ආණ්ඩුවට තියෙන රුදාව මොකක්ද මම තොල් මතුරමින් හෙල්මට් එක අතට ගත්තෙමි.

නමින් අගමැතිනි වුවද මට පාලනය කිරීමට ඇත්තේ ගෘහ කර්මාන්ත අංශය, වැඩකට නැති සංස්කෘතික අමාත්‍යාංශය හා බැණුම් අසන අධ්‍යාපන අමාත්‍යාංශය පමණකි. මුදල් ක්‍රම සම්පාදන, විදේශ කටයුතු, ගමනාගමන මේ හැම දෙයකම නිෂේධ බලය ජනාධිපති සැමියා සතුකොට ගෙන ඇත.

ශ්‍රේෂ්ඨත්වය වටහා දෙනු සඳහා ගමනාන්තය දක්වා ඔහු මුනිවත රකිති. මගේ අසුනේ ගමන් ගන්නේ වෙන ගැහැනියක නම්...?

මොනවද ගන්න ඕනෑ කීවේ. සාප්පු සංකීර්ණය අද්දර බයිසිකලය නැවැත්වූ සැමියා ප්‍රශ්න කළේය.

අල, පිරිප්පු, රතුලූනු, උම්බලකඩ, හාල්මැස්සන්, මිරිස්, සූදුරු, ගම්මිරිස්, අබ, සුදුලූනු... මම ලැයිස්තුව කියාගෙන ගියෙමි.



**කොතනක හෝ වරදක් සිදුවී ඇත. කොතරම් චෝදනා ඉදිරිපත් කළත් මා තනතුරෙන් ඉවත් කළ නොහැක. එහෙත් ජනාධිපතිගේ පරමාධිපත්‍යයට දෝෂාභියෝගයක් එල්ල කිරීම සුදුසු යැයි මට විටෙක සිතේ. ජනාධිපතිගේ බලතල අඩුකළ යුතුය. ව්‍යවස්ථාව වෙනස් කළ යුතුය.**

එකක් හෝ අමතක වුනොත් තවත් චෝදනාවකි.

කොච්චර ඕනද? සැමියා කඩකාරයා හා කතාව.

හෙල්මට් එක සහ බෑග් එක අතේ තබාගෙන මම වටපිට බැලුවෙමි. බඩු සියල්ල බෑගයේ තැන්පත් විය.

තව මොනවද ගන්න තියෙන්නෙ? බයසිකලය ළඟට එමින් සැමියා විමසීය.

පැණි ටික අරගෙන ඉඳිමුද? මම ප්ලාස්ටික් බඳුන එළියට ගත්තෙමි.

ඔයා බයිසිකලේ ගාව ඉන්න. මම අරගෙන එන්නම්. සැමියා ප්ලාස්ටික් බෝතලය අතට ගත්තේය.

බෑග්එක මෝටර් සයිකලයේ සීට්එක මත තබා හෙල්මට්එක අතට ගත් මම පාර අයිනට වී බලා සිටියෙමි. නිවාඩු දිනයක් හෙයින් නගරයේ වැඩිපුර සෙනඟ නැත. එහෙයින්දෝ පාරට වී බලා සිටින මා කැපී පෙනී ඇත. මිනිස්සු හැරී මා දෙස බලති. කඩවල් ඇතුලේ සිටි මිනිස්සුද පාරට විත් මාදෙස බලා සිටිති. මම බයිසිකලේ කණ්ණාඩියෙන් මුහුණ දෙස බැලුවෙමි. මුහුණ පෙරසේමය.

පැය කාලක් ගතවී ඇත. පළතුරු කඩය ජේනතෙක් මානයේ ඇත. සැමියා මුදලාලි සමගින් ආර්ථික පසුබිම ගැන සාකච්ඡාවක්ද? මද වේලාවකින් ඔහු එන බව පෙනුනි. එහෙත් රැගෙන එන හැටියෙන් එහි පැණි ඇති බවක් නොපෙනේ.

"ඇයි පැණි නැද්ද?" මම ඇසුවෙමි.

පැණි තියෙනවා. මේකට දාන්නේ කොහොමද? ඔහු බඳුනෙහි මූඩිය ඉවත්කර පෙන්වීය. මාසයකට ඉහතදී සෝදා වේලා තැබුවද බෝතලය පුස් කා ඇත. වරද මා අතය. එය එන්නට පෙර විවෘත කර නොබැලුවෙමි. එහෙත් මෙය වරද පෙන්වා දී තර්ක කරමින් සිටින්නට තැනක් නොවීය.

මේකට දාන්න බැරි නම් වෙන බෝතලයකට පැණි ගන්න. එහෙම

නැත්නම් මේක හෝදලා මේකටම ගන්න.

කියන්න නම් ලේසියි. වැඩක් හරියට කරන්න දන්නේ නෑ. යොවනයේ දුටු ඔහුමද මේ... නන්දා මාලනී තේ කඩයක සිට සින්දුවක් කියනු ඇසේ.

සැමියා බෝතලය රැගෙන ආපසු ගියේය. මා මහමඟ බයිසිකලය ළඟ තනිව සිටීම ඔහුට ප්‍රශ්නයක් නොවේ. සැමියා ගියපසු කඩවල් ඇතුලේ සිටි මිනිස්සු ආපසු පැමිණ බලා සිටිති.

නවත් පැය කාලකට පමණ පසු පැණි පිරවූ බෝතලය රැගෙන සැමියා පැමිණියේය.

තව මොනවද ඕනෑ.

දානේ ළඟ හින්දා තව හිරමණයක් ගන්න වේවි. ප්ලාස්ටික් බේසමක් ඕනෑ. හේවිසි ගහන අයට කෑම ගෙනියන්න කාඩ්බෝඩ් පෙට්ටියක් ඕනෑ.

එනවා යන්න තෝරලා බලලා ගන්න. මෙතනදී සැමියා මට ආරාධනා කළේය.

එහෙත් බයිසිකලය මත ඇති බඩු බෑගය කවුරුන් හෝ ගෙන ගියොත් එහි වරදද මා වෙත පැවරෙනු ඇත. වරින් වර සාප්පුව තුළින් එළියට එමින් මම බයිසිකලය දෙස බලමි. තවත් පැය කාලක් ඇතුළතදී හිරමණයත් බේසමත් කාඩ්බෝඩ් පෙට්ටියත් මා අතට ලැබුණි.

බඩු බෑගය ලගේජ් කැරියරයේ තබා බැඳගැනීමට සැමියා කාරුණික වී ඇත. ජනාධිපතිතුමාට ජය වේවා සිතින් පතමින් මම බලා සිටියෙමි. අවට මිනිසුන්ද බලා සිටින්නේ හිරමණය, බේසම හා හිස් සන්ලයිට් පෙට්ටිය රැගෙන මා බයිසිකලයට නගින්නේ කවර ආකාරයකින් දැයි සිතමින් වෙන්නට ඇත.

ඊයේ ටීවී එකෙන් බැලූ චීන සර්කස් සිහිකරමින් මම බයිසිකලයට නැග්ගෙමි.

බේසම පලිහක් මෙන් පපුවට තදවී ඇත. හිරමණය ගිටාරයක් මෙන් නැත. වීණාවක් මෙන් ඇකයේය.

වීණාධාරී හංසවාහිනී... සරසවි ගීයක් මම තොල් මතුලෙමි. පෙට්ටියේ කොනක් අතකින් අල්ලාගත් මම අනික් අතෙහි වූ ලේන්සුව හා නිදන කාමරයේ යතුර දෙස බැලුවෙමි. සරසවි දේවියට මෙන් මටද අත් හතරක් ඇත්තේ නම් යෙහෙකි. අභාග්‍යයකට මට ඇත්තේ අත් දෙකක් පමණකි.

මෝටර් බයිසිකලය අසුවේ වේගයෙන් යයි. තාරුණ්‍යයට ඔරොත්තු දෙන වේගය මැදිවියට ඔරොත්තු නොදෙන තරම්ය.

"අනේ ඔච්චර හයියෙන් යන්න ඕනද?" මම බයාදුවෙන් ඇසුවෙමි. රජයේ නීති පද්ධතිය නිසා ඔළුව බේරෙනු ඇත. එහෙත් අතපය?

හවස තේ වෙලාවට නිවසට පැමිණි මම හෙල්මට් එක ගලවා පසෙක තබා දවල් තම්බා ගිය කඩල තෙම්පරාදු කර පොල් දැමීමි. අනතුරුව තේ වත්කොට තේ පානය සඳහා සැමියා කැඳවීමි.

"මොකද අනේ මේ කඩල තම්බලා නැත්තේ?" සැමියා ඇසීය. එය චෝදනා අංක හතර විය.

"තැම්බිලා මදිද පොඩි අම්මෙ?" කාර්යභාර නියමයක් නැති ඇමතිගෙන් මම විමසුවෙමි.

"සමහර ඒවා තැම්බිලා මදි තමා" ජනාධිපතිතුමාගේ කිසිදු දොසක් නොදකින මහළු ඇමතිවරිය පැවසුවාය.

"ඇයි ඔයාට තේරෙන්නේ නැද්ද පොඩි අම්මගෙන් අහන්නේ?"

"නැතේ." මම කෙටියෙන් පිළිතුරු දුනිමි. නොතැම්බුනද කඩල බදුන නිමා වී ඇත.

කොතනක හෝ වරදක් සිදුවී ඇත. කොතරම් චෝදනා ඉදිරිපත් කළත් මා තනතුරෙන් ඉවත් කළ නොහැක. එහෙත් ජනාධිපතිගේ පරමාධිපත්‍යයට දෝෂාභියෝගයක් එල්ල කිරීම සුදුසු යැයි මට විටෙක සිතේ. ජනාධිපතිගේ බලතල අඩුකළ යුතුය. ව්‍යවස්ථාව වෙනස් කළ යුතුය.

මාමා ගෙනා පොත් ටික පුංචිරාළට කියලා ගෙන්නවා ගන්නද? අනතුරුව සැමියා සංස්කෘතික ප්‍රශ්නයක් නැගීය.

නෑ අනේ...

ඔයාට ඕක ගෙන්නවා ගන්න මතක් වෙන්නේ නැද්ද? ඔය ගෙදර පොත් තියන්න පුළුවන්යැ.

දැන් මෙතන වැරැද්ද ඔයාට අමතක වුන එකයි. මට අමතක වුන එකයි. මම සිතින් පැවසුවෙමි.

උදේ හිටන් රෑ වෙනකල් මොනවා හරි ලියනවා. ඒක විතරයි හරියට කරන්නේ. වෙන දේවල් ගැන කිසිම විමසිල්ලක් නැහැ.

එහෙම නම් කොහොමද මේ ගෙදර වැඩ සිද්ද වෙන්නේ. මම සිනාසෙමින් ඇසුවෙමි.

ඔයා රස්සාවේ හිටිය නම් මෙලහකට රුපියල් දහ දොළොස්දාහක පඩියක් ගන්නවා. කොහේද? අනතුරුව සැමියා කීය.

"ගෑනු ඉගෙන ගත්තට සමහර වෙලාවට හරි මෝඩයි අනේ" මම කීවෙමි.

"ඔය කිවේ..."

හැබෑටම ආයේ ඔයා යන්නේ කවදාද?

ඒ මොකද, මාව මැද පෙරදිග වහල් සේවයට ආයෙමත් යවන්නද? සැමියා විමසීය.

"ඔයා වහල් සේවයක් කළායැ"

ඒ රටවල ඉන්නේ මහ පර ජාතියක්. උන්ට විදේශිකයෝ විශේෂයෙන් ආසියාතිකයෝ මැටි පොල්කුඩු ගානයි.

අපේ විතරනේ ඒ තත්වය වෙනස් අපිට විදේශිකයෝ හරි ඉහළයි. රට ජාතිය ආගම බල්ලට දානව.

පීටර් ශාක්ගේ ඇරයුමෙන් ස්විට්සර්ලන්තයට ගිය අපේ මහාචාර්යවරයෙක් සිහිකරමින් මම කීවේය.

"අපේ උන්ට සල්ලි තමා ආගම... මේ සැරේ මම යනව නම් යන්නේ ඇමෙරිකාවට හරි ජපන් රටට හරි..." හැබැයි ලක්ෂ තුනක් විතර ඕනෑ.

ලක්ෂ තුනක් තියෙනවනම් යන්න ඕනයැ. මම කියන්නට ගියෙමි.

ඇයි නැත්තෙ...? මට තේරී ගී සිහිවිය.

හැන්දෙන් මිදුනෙමි. විටි විටි අනුකරණයෙන් තෙල් තාච්චියෙන් මිදුනෙමි. රහත් උත්තමාවෝත් නිබ්බුත පද කීහ.

දෝෂාභියෝගයක් ව්‍යවස්ථා වෙනස් කිරීමක් අවශ්‍ය නැත. මම ලොතරැයියක් මිලයට ගන්නෙමි.

ඇදුනොත් ලක්ෂ හයක්ම දෙනවා රටවල් දෙකටම යන්න...

*චින්ද්‍ර අතාකිරන්න ගේ "තරලොව් තොල්මින්" කතාවෙනි.*

# කණිෂ්ඨ උපදේශක පාඨමාලා අංක - 97





යුද්ධ හමුදාවෙහි ලාන්ස් කෝප්‍රල් සහ කෝප්‍රල් නිලයේ අයවලුන්ගේ යුද්ධ හමුදා දැනුම වර්ධනය කිරීම හා උපදේශක හැකියාව උසස් තත්වයට ගෙන එමින් කාර්යශූර දක්ෂ කණිෂ්ඨ උපදේශකයින් බිහිකිරීම අරමුණු කරගෙන සටන් පුහුණු පාසල - අම්පාර වෙතින් පවත්වන ලද කණිෂ්ඨ උපදේශන පාඨමාලාව - අංක 97 ඉකුත් අප්‍රේල් 05 වන දින සාර්ථකව අවසන් විය. එම පාඨමාලාව සඳහා යුද්ධ හමුදාවේ සියලු රෙජිමේන්තු මධ්‍යස්ථාන යටතේ ඇති නිත්‍ය/ස්වේච්ඡා ඒකක වෙතින් සිසු සිසුවියන් 46 දෙනකු සහභාගී වූහ. එහි සමාප්තිය සනිටුහන් කරමින් අවසන් දේශන සහ නිල ලාංඡන පැළඳවීම එම පුහුණු පාසලෙහි සේනාවිධායක බ්‍රිගේඩියර් ජේඑම්ආර්එන්කේ ජයමාන්න ආර්ඩබ්ලිව්පී විසින් සිදුකරනු ලැබීය. එහිදී, එම පාඨමාලාවේ මුළු ලකුණු ප්‍රතිශතයෙන් 78% ක විශිෂ්ට සාමාර්ථයක් ලබාගනිමින් 4 වන විශේෂ බලකායට අයත් සෙ/382550 කෝප්‍රල් ශමෝද් කුමාර එම්ඒඑල් සමස්ත පාඨමාලාවේ පළමුවන ස්ථානය හිමිකර ගන්නා ලදී.

# වෘත්තීය පුහුණු පාඨමාලා අරඹමින්





වත්තල පිහිටි රණවිරු සම්පත් කේන්ද්‍ර වෘත්තීය පුහුණු මධ්‍යස්ථානය ශ්‍රී ලංකා වෘත්තීය පුහුණු අධිකාරිය හා ඒකාබද්ධව වෘත්තීය පුහුණු පාඨමාලාවන් පවත්වාගෙන යනු ලබන යුද්ධ හමුදාවේ ප්‍රමුඛතම පුහුණු පාසලකි. එහි ඉකුත් අප්‍රේල් 25 වන දින ආරම්භ කරන ලද "දැව තාක්‍ෂණ (ගොඩනැගිලි) ශිල්පී" පාඨමාලාව හා "විද්‍යුත් උපකරණ තාක්‍ෂණ ශිල්පී" පාඨමාලාවේ ආරම්භක දේශනය එහි සේනාවිධායක බ්‍රිගේඩියර් ඩීසීසීඩීආර් වෛද්‍යසේකර ආර්එස්පී විසින් සිදුකරන ලදී.

# මූලික පරීක්ෂණ උසාවි පැවැත්වීම සබැඳි වැඩමුළුවක්





ඉංජිනේරු සේවා බලකායට අයත් ඒකක හා ආයතනයන්හි සේවයේ නියුතු නිලධාරීන් හා නීති අංශ ලිපිකරුවන්ගේ මූලික පරීක්‍ෂණ උසාවි පැවැත්වීම සබැඳි දැනුම වර්ධනය කරනු වස් දේශනයක් නීතිසේවා අධ්‍යක්‍ෂ මණ්ඩලයෙහි මේජර් එන්ආර්එස්එම්ආර්ජ් ගිරාගම විසින් සිදුකරන ලදී. ඉකුත් මාර්තු 24 වන දින ඉංජිනේරු සේවා රෙජිමේන්තු දේශන ශාලාවේදී පැවති එම දේශනයට ඉංජිනේරු සේවා බලකා මධ්‍යස්ථාන සේනාවිධායක බ්‍රිගේඩියර් ඊජීඩීකේ එදිරිසිංහ ඇතුළු නිලධාරීන් සහ සෙසුනිලයින් රැසක් සහභාගී වූහ.

# අකුරැ කියන්නට දිරි දී





ආරක්ෂක සේනා මූලස්ථානය (වන්නි) බලප්‍රදේශයට අයත් 54 වන පාබල සේනාංක පුස්තකාලයේ ප්‍රයෝජනය සඳහා කලණි චන්දිමාල් මහතාගේ පූර්ණ අනුග්‍රහයෙන් පුස්තකාල පොත් 100 ක් පරිත්‍යාග කිරීම ඉකුත් අප්‍රේල් 22 වන දින සිදුකරන ලදී. එහි සේනාංකාධිපති මේජර් ජෙනරාල් යූඩී විජේසේකර ආර්ඩබ්ලිව්පී ආර්එස්පී යූඑස්පී ආර්සීඩීඑස් පීඑස්සී ගේ ප්‍රධානත්වයෙන් සේනාංක දේශන ශාලාවේදී පැවති උත්සවයකදී අදාළ පොත් පිරිනැමිණ.

# මාහැඟි පරිත්‍යාගයක්





ආරක්ෂක සේනා මූලස්ථානය (මධ්‍යම) යටතේ ජීවත්වන අඩු ආදායම්ලාභී පවුල් වෙනුවෙන් වියළි සලාක මළු 100 ක් ලබාදීමේ වැඩසටහනක් ඉකුත් අප්‍රේල් 11 වන දින මොණරාගල, බඩල්කුඹුර නිශ්ශංක මධ්‍ය මහා විද්‍යාලයේදී පැවැත්විණ.

ආරක්ෂක සේනා (මධ්‍යම) ආඥාපතිගේ සම්බන්ධීකරණයෙන් හා මගපෙන්වීම යටතේ ඇමෙරිකා එක්සත් ජනපදයේ පදිංචි පරිගණක විද්‍යා මහාචාර්යවරයකු වන අනුර පීරිස් මහතා ඊට අනුග්‍රාහකත්වය දැක්විය. 7 වන ශ්‍රී ලංකා සංඥා බලකායේ ශ්‍රම දායකත්වයෙන් සිදුවූ මෙම මාහැඟි කටයුත්තට 121 වන පාබල බලසේනාධිපති බ්‍රිගේඩියර් ඩීයූඑන් සේරසිංහ ආර්ඩබ්ලිව්පී ආර්එස්පී ඇතුළු ප්‍රදේශවාසීන් පිරිසක් සහභාගී වූහ.



12 (සේවා) ශ්‍රී ලංකා කාලතුවක්කු හමුදා ඒකක බලප්‍රදේශයේ පදිංචි අඩු ආදායම්ලාභී ගොවි පවුල් දෙකක් වන කුණම් ශෂිකුමාර සහ කුමාරවේල් ප්‍රදීපන් යන අයවලුන් වෙත ඔවුන්ගේ වගා කටයුතු කිරීම සඳහා මහත් අඩුපාඩුවක්ව පැවති ජල මෝටර් 02 ක් බෙදාදීමේ වැඩසටහනක් ඉකුත් අප්‍රේල් 05 වන දින කුරායි ප්‍රදේශයේදී පැවැත්විණ.

54 වන පාබල සේනාංකාධිපතිගේ උපදෙස් අනුව 541 වන පාබල බලසේනාධිපතිගේ අධීක්ෂණය යටතේ සිදුකළ මෙම වැඩසටහන සඳහා මූල්‍ය දායකත්වය වවුනියාව නොව වටවල තේ පුද්ගලික ආයතනය විසින් දරන ලදී. මෙම අවස්ථාවට 54 වන පාබල සේනාංකයේ සිවිල් සම්බන්ධීකරණ නිලධාරී, 12 (සේවා) ශ්‍රී ලංකා කාලතුවක්කු හමුදාවේ අණදෙන නිලධාරී, වටවල තේ පුද්ගලික සමාගම නියෝජනය කරමින් එහි වෙළඳ නාම ප්‍රවර්ධක හිරන්ත සමීර මහතා ඇතුළු පිරිසක් සහභාගී වූහ.



> **විශිෂ්ටතාවයට පත්ව ඇති පුද්ගලයෝ නොවෙනස්වන සුළු ආකල්ප, හැසිරීම් සහ පළපුරුදුකම්වලින් හිරවී නොසිටිති. අපි අපේම හිරගෙවල් තනාගෙන ඒවායේ මුරකරුවන් බවට පත්වෙමු. අපට හිරගෙවල් තැනීමට හැකිනම් ඒවා කඩාබිඳ දැමීමටද පුළුවන. අප ඉගෙනීමට කැමති නම් සැමතැනම ඒ සඳහා අවස්ථා ඇත.**

# නාකි වියේ ගෙටත් උසේ...

ඉතාලියෙහි පුරාණයෙහි විසූ ලියනාර්ඩෝ ඩාවින්චි මිහිමත පහළ වූ පුදුමතම මිනිසෙකි.

අහස් යානය, පැරෂුටය ආදී නව නිර්මාණ කිහිපයකට සැලසුම් ඇන්ද චිත්‍ර ශිල්පය, සාහිත්‍ය ආදී නව බොහෝ අංශවලින් දස්කම් පෑ විද්‍යාඥයෙකි.

ඔහු මියගියේ ඉතා මහලු වයසට පත්වය. එහෙත් ඔහුගේ බුද්ධි වර්ධනය සැලසුනේ වඩා වඩා මහළු වන අතරය.

ඊටත් වඩා පුදුමය නම් එකල දේශපාලනය ගැන උනන්දුවක් දැක්වූ ඩාවින්චි මහළුවන්නට වන්නට අනෙක් අය මෙන් ප්‍රතිගාමියෙක් වූයේ නැත. මහළු වැඩි වූ තරමට ඔහුගේ අදහස්ද ප්‍රගතිශීලී වන්නට පටන් ගත්තේය.

සමහර අය ජීවිතාන්තය දක්වාම නව නිර්මාණ බිහි කරමින් උනන්දුවෙන් හා උද්යෝගයෙන් කටයුතු කරගෙන යන අතර, තවත් සමහරකු එසේ නොවී අකාර්යක්ෂම වන්නේ කුමන හේතුවක් නිසාද?

තම ජීවිත කාලයෙන් භාගයක් ගතවීමට ප්‍රථම අඹලන් තත්වයට පැමිණෙන මිනිසුන් ගැන අපි දනිමු. මා සඳහන් කරන්නේ මුදුනට නැගීමට අසමත් වන අය ගැන නොවේ. අපි සැමදෙනාටම එම ස්ථානයට ළඟාවිය නොහැක. මා කතා කරන්නේ ඉගෙනීම වර්ධනය හා නිර්මාණශීලීත්වය නැතිකරගත් පුද්ගලයන් ගැනය. ඔවුහු කාලයාගේ ඇවෑමෙන් සමගම නොවෙනස්වන සුළු ආකල්ප සහ අදහස් උදහස් ඇත්තෝ බවට පත්වෙති.

ඇත්ත වශයෙන්ම අපි වැඩි දෙනෙක් අපේ ජීවිත කාලය ඉදිරියට යැමත් සමග අපේ බලාපොරොත්තු අපේ පරමාර්ථ හා ජීවිතයේ විවිධත්ව පටු කර ගනිමු.

එහෙත් මෙවැනි හැඟීම් ඇතිකරගැනීමේ ඇති භයානකත්වය දනී නම් අපට එම හැඟීම්වලට විරුද්ධව පියවර ගැනීමට හැකිවේ. එකතැන හිරවීම, ප්‍රතික්ෂේප කිරීමට පුළුවන. ඉගෙනීම තරුණ වියේ අයට පමණක් සීමා වී ඇත යන මිථ්‍යා විශ්වාසයද ප්‍රතික්ෂේප කිරීමට පුළුවන. ඔබ අවබෝධයක් ඇති තැනැත්තකු බවට පත්වීමෙන් පසුව ඉගෙන ගන්නා දෙය වඩාත් වටින්නේය.

## ජීවිත කාලයම

අපි අපගේ මුළු ජීවිත කාලයම ඉගෙනීමේ යෙදී සිටිමු. අපි ජීවිතයේ ලබන ජයග්‍රහණ හා පරාජයන් තුළින් ඉගෙන ගනිමු. ඔබ යම් කරදරකාරී තත්වයකට මුහුණ දුන් විට මෙය මට උගන්වන්න සූදානම් වන්නේ කුමක්දැයි ඔබෙන් විමසන්න. එවැනි පාඩම් සැමවිටම ප්‍රීතිදායක ඒවා නොවෙන්නට පුළුවන. රැල්ෆ් වෝල්ඩෝ එමර්සන් ඔහුගේ රචනයක මෙසේ ලියා ඇත. අයහපත් කාල පරිච්ඡේදයක විද්‍යාත්මක වටිනාකමක් ගැබ් වී ඇත. හොඳින් අධ්‍යනය කරන්නකු මෙවැනි අවස්ථා මගහැරිය යුතු නොවේ.

## ආත්ම අනුකම්පාව

විශිෂ්ටතාවයට පත්ව ඇති පුද්ගලයෝ නොවෙනස්වන සුළු ආකල්ප, හැසිරීම් සහ පළපුරුදුකම්වලින් හිරවී නොසිටිති. අපි අපේම හිරගෙවල් තනාගෙන ඒවායේ මුරකරුවන් බවට පත්වෙමු. අපට හිරගෙවල් තැනීමට හැකිනම් ඒවා කඩාබිඳ දැමීමටද පුළුවන. අප ඉගෙනීමට කැමති නම් සැමතැනම ඒ සඳහා අවස්ථා ඇත. ජීවිතයේ පෞද්ගලික හා පොදු යන සෑම අංශයකටම දැනෙන ක්‍රියාවකින්ම ඉගෙනීමට දැ එමට ඇත.

ඔබ තලතුනා කෙනකු බවට පත් වූ පසුව ඉගෙන ගන්නා දෙයෙහි ආරංචි සහ දක්ෂතාවන් ගැබ්වන්නේ කලාතුරකිනි. ඔබට වෙනස් කළ නොහැකි දෙය ඒ ආකාරයෙන්ම පිළිගැනීමට ඔබ

හැඩගැසේ. ආත්ම අනුකම්පාව මඟහැරීමට ඔබ ඉගෙන ගනී. බොහෝ මිනිසුන් ඔබට පක්ෂ හෝ විරුද්ධ නොවන බවත්, ඔවුන් ඔවුන් ගැනම සිතන බවත් ඔබට පැහැදිලි වේ. ඔබ කොතෙක් ඔවුන් සතුටු කිරීමට වෙර දැරුවත් සමහරු ඔබට කවදාවත් කැමති නොවන බව ඔබට දැනගන්නට ලැබේ. මේ කරුණ මුලදී වේදනා ගෙන දෙන්නක් වුවත් නියම තත්වය අවබෝධවීමෙන් පසුව එය සුළු දෙයක් ලෙස ඔබ පිළිගනී.

ඔබේ වගකීම් අතර ඔබ ගැන සිතීමට කාලයක් වෙන්කර ගැනීම වැදගත් වේ. ස්වයං අධ්‍යයනය ඥාණවන්තභාවයේ පටන්ගැන්ම සමහරුන්ට නොලැබී යන්නේ ඔවුන් වැඩිවියට පත්වෙත්ම ඇතිකරගන්නා ආත්ම වංචාව නිසාය. මැදිවියට පැමිණි විට අපි බොහෝ දෙනෙක්ම අප කෙරෙන් පැන දුවන්නෝ බවට පත්වෙමු. එහෙත් තමන් තමාට බොරුකාරයකු නොවී සිටීමේ පුදුම සහගත වටිනාකමක් ඇත.

ඔබ විසින් ඉගෙන ගන්නා දේ අතර විශිෂ්ට ස්ථානයක් ගන්නා දෙයක් නම් ඔබට වගකිව යුත්තේ ඔබම බවය. අනෙක් අයට දොස් පැවරිය නොහැක. ඔබේ ජීවිත නෞකාවේ නියමුවා ඔබමය.

ඔබ දිගටම ඉගෙන ගැනීමට අදහස් කරන්නේ නම් මේ සඳහා ඔබට උපකාර වන හොඳම මිතුරන් වන්නේ බලවත් කැමැත්ත සහ උද්‍යෝගයයි.

## නාකි විසේ

සමහර අය කෙසේ හෝ තම ජීවිතයේ අවසානය දක්වාම ඉමහත් උද්‍යෝගයෙන් හා උනන්දුවෙන් කටයුතු කිරීමෙහි නියැලෙති. ඔවුහු තම ජීවිතයේ වටිනාකම අවබෝධ කරගත් සෑම දෙයක් ගැනම උනන්දුව දක්වන නව සොයාගැනීම් කරන, සෑම දෙයකටම නිර්භීතව මුහුණදෙන පුද්ගලයෝ වෙති.

## නියම ප්‍රීතිය

තමන් ආදරය කරන අයට හෝ සහෝදර ජනතාවට හෝ තමන්ගේ වැඩ කටයුතුවලට හෝ වෙනස් යහපත් කටයුත්තකට හෝ ආගමික සංස්ථාවකට හෝ තමන්ගේ ආත්ම ශක්තියේ ප්‍රමාණයටත් වඩා සේවය කිරීමට තදින් බැඳී සිටීමෙන් තමාගේ ජීවිතයේ නියම ප්‍රයෝජන තෙලාගත හැකි වේ. බර්නාඩ් ෂෝ නමැති චින්තකයා වරක් මෙසේ කියා ඇත. ඔබ විසින් ඉතා වැදගත් ලෙසත් වටිනාකමින් යුත් ලෙසත් සලකනු ලබන දෙයකට ඔබගේ කාලය ශ්‍රමය සහ ධනය යෙදවීමෙන් ජීවිතයේ නියම ප්‍රීතිය ළඟාකර ගත හැකිවන්නේය.

1984 ඔක්තෝබර් "මිහිකත" ඇසුරිනි.

# දෙස රැකුමට එක්වූ තාරුණ්‍යය





යුද්ධ හමුදාවට අලුතින් බඳවාගන්නා ලද ආධුනික සෙබළුන් 412 දෙනෙකු බලඇණි පුහුණු පාසල - වාසවිලාන් හි මාස 04 ක සාර්ථක පුහුණුවකින් පසු ඉකුත් අප්‍රේල් 09 වන දින විසිර ගියහ. යුද්ධ හමුදා ආධුනික සෙබළුන් බඳවාගැනීමේ දෙවන අදියර යටතේ උතුරු හා නැගෙනහිර ප්‍රදේශයන්හි මුස්ලිම්, දමිළ හා සිංහල තරුණයින් එලෙස මෙම පාඨමාලාව හැදෑරූහ. ඔවුන් යුද්ධ හමුදාවේ අනාගත අභියෝගයන්ට මුහුණදීම සඳහා ශාරීරිකව හා මානසිකව ශක්තිමත් කරමින් වෘත්තීය සෙබළුන් ලෙස මනා පුහුණුවක් ලබාදීම පාඨමාලා කාලසීමාව තුළ සිදුකර ඇත.

මෙම පාඨමාලාවේ විසිරයාමේ උත්සවය සඳහා ප්‍රධාන ආරාධිත අමුත්තා ලෙස 51 වන පාබල සේනාංකාධිපති මේජර් ජෙනරාල් එම්ජ්ඩබ්ලිව්ඩබ්ලිව්ඩබ්ලිව්එම්සීබී වික්‍රමසිංහ ආර්ඩබ්ලිව්පී ආර්එස්පී එන්ඩියූ පීඑස්සී සහභාගී විය. එහිදී සෑම අතින්ම අතිශූර සෙබළා ලෙස සෙ/2127197 ආධුනික සෙබළ ජයවර්ධන පීඑස්පී සම්මාන දිනාගත් අතර, හොඳම වෙඩික්කරු ලෙස සෙ/2021වීඑෆ්ආර්ඩී/09899 ආධුනික සෙබළ සාගර ජීඒඩී හා හොඳම ශාරීරික යෝග්‍යතාවය සහිත සෙබළා ලෙස සෙ/2021වීඑෆ්ආර්ඩී11411 ආධුනික සෙබළ ජයසේන ඒපීජ්ටී සම්මාන හිමිකරගත්හ.



# ඉතිහාසයක සුළමුල
## ශ්‍රී ලංකා සංඥා බලකා පුහුණු පාසල

ආරම්භයේ සිටම, සංඥා බලකාය ශ්‍රී ලංකා යුද්ධ හමුදාවේ සන්නිවේදන අවශ්‍යතා සපුරාලීමේ කාර්ය විශිෂ්ට ලෙස ඉටු කර ඇත. මෙය ශ්‍රී ලංකා සංඥා බලකායේ කාර්ය මණ්ඩලයේ නිපුණතාවය, හැකියාව සහ කැපවීම මත සිදුවුනු අතර, ඒ සඳහා මනා පුහුණුව බෙහෙවින් ඉවහල් විය. සංඥා බලකායේ සියලු නිලධාරීන් සහ සෙසුනිලයන් හට ඒකකයට ආවේණික විෂයන් හා ශිල්පීය ක්‍රමවේද හැදෑරීම සඳහා 1964 දී 1 වන සේවා බලකාය යටතේ සංඥා පුහුණු අංශය නිර්මාණය වූ අතර, පසුව එය සංඥා රෙජිමේන්තුව යටතේ අංග සම්පූර්ණ සහ ක්‍රියාකාරී සංඥා පාසලක් බවට පරිණාමය විය.

1992 ජනවාරි මාසයේදී සංඥා පුහුණු පාසල මහනුවර බූවැලිකඩ මනරම් කඳු මුදුනක ස්ථාපනය වූ අතර, මෙම පුහුණු පාසල එළිමහන් සහ ශ්‍රවණාගාර පන්ති කාමර, යුධ බාධක තරණය කිරීමේ පුහුණු ප්‍රදේශය සහ ශාරීරික පුහුණු ප්‍රදේශයකින් සමන්විත විය. මෙම පුහුණු පාසලේ පහසුකම් කාලයාගේ ඇවෑමෙන් ක්‍රමාණුකූලව වර්ධනය විය. එලෙස, ඉන්දීය රජය විසින් පරිත්‍යාග කරන ලද සන්නිවේදන විද්‍යාගාරය විවෘත කිරීම පාසල් ඉතිහාසයේ සුවිශේෂී සිදුවීමක් විය. විද්‍යාගාරය විවෘත කිරීම 2018 මැයි 15 වන දින ප්‍රධාන ආරාධිත අමුත්තා ලෙස ඉන්දීය යුද්ධ හමුදා මාණ්ඩලික ප්‍රධානී ජෙනරාල් බිපින් රාවත් යුවයිඑස්එම් ඒවීඑස්එම් වයිඑස්එම් එස්එම් වීඑස්එම් ඒඩීසී ජ්‍යෙෂ්ඨ නිලධාරීගේ සහභාගීත්වයෙන් පැවැත්විණි. ඇමරිකානු ඩොලර් මිලියනයක් වටිනා මෙවැනි නවීන සන්නිවේදන විද්‍යාගාරයක් සංඥා පුහුණු පාසල සතුවීම සංඥා බලකායට පමණක් නොව මුළු ශ්‍රී ලංකා යුද්ධ හමුදාවටම ආඩම්බර විය හැකි කරුණක් විය.

සංඥා බලකායට ආවේණික වූ වෘත්තීමය පාඨමාලා වෙත නව මුහුණුවරක් එක් කරමින් 2020 වර්ෂයේ සිට නව පාඨමාලා පහත දක්වා ඇති පරිදි හඳුන්වාදෙන ලදී.

අ. සංඥා බලකායේ නිලධාරීන් සඳහා සයිබර් ආරක්ෂාව පිළිබඳ කෙටි පාඨමාලාව.

ආ. සංඥා බලකායේ නිලධාරීන් සඳහා සංවෘත පරිපථ ආරක්ෂක කැමරා පිළිබඳ කෙටි පාඨමාලාව.







ඇ. සංඥා බලකායේ නිලධාරීන් සඳහා පරිගණක ජාලකරණය පිළිබඳ කෙටි පාඨමාලාව.

ඈ. වෙනත් ඒකක සෙනීන් සඳහා ග්‍රැෆික් නිර්මාණකරණය සහ වීඩියෝ සංස්කරණය කිරීමේ පාඨමාලාව.

යුද්ධ හමුදාධිපති විසින් ඉදිරිපත් කරන ලද යුද්ධ හමුදා ඉදිරි උපායමාර්ගික සැලැස්මට අනුගත වෙමින් සංඥා පුහුණු පාසල් ඉතිහාසය වෙත නව පරිච්ඡේදයක් එක් කරමින් තෘතීයික හා වෘත්තීය අධ්‍යාපන කොමිෂන් සභාවට අනුබද්ධිතව සියලුම හමුදා නිලධාරීන් සඳහා ජාතික වෘත්තීය නිපුණතා සහතික 5 වන මට්ටම යටතේ තොරතුරු සන්නිවේදන තාක්ෂණ ඩිප්ලෝමා පාඨමාලාවක් ආරම්භ කරන ලදී. තවද, පුහුණු පාසලේ පුහුණුවීම් කටයුතුවල නියැලෙන සියලුම සිසුන්ගේ දැනුම වර්ධනය කිරීම වෙනුවෙන් වැදගත් දේශණ පැවැත්වීම සඳහා පරිණත යුද්ධ හමුදා නිලධාරීන් මෙන්ම කීර්තිමත් සිවිල් දේශකයන් හා කථිකාචාර්යවරුන්ද නිරන්තරයෙන් සහභාගී කරගැනීම සිදුකරනු ලබයි.

රාජකාරීන් සිදුකිරීමේ කාර්යක්ෂමතාවය කෙරෙහි පුහුණුව ඍජුවම බලපාන බව මනාව වටහා ගනිමින් මෙම පුහුණු පාසල නිරන්තරයෙන් තම සේවයෙහි ගුණාත්මකභාවය ඉහළ දැමීම සඳහා වෙර දැරීම තුළින් යුද්ධ හමුදාවේ ප්‍රධානතම තොරතුරු හා සන්නිවේදන තාක්ෂණය පිළිබඳව පුහුණු ආයතනය බවට පත් වී ඇත.

ශ්‍රී ලංකා සංඥා බලකා පුහුණු පාසල

# ENGLISH Vision...

***English Vision*** පාඩම් මාලාව ඔස්සේ ***Art of the language*** (භාෂාවේ කලාව) අධ්‍යයනය සඳහා "රණවිරුවා" මාසික සඟරාව මගින් ඔබ හමුවට ගෙන එන තවත් එක් සරල ඉංග්‍රීසි වාක්‍ය රටාවක භාවිතය පිළිබඳව මෙම මස කලාපය තුළින් අවධානය යොමු කරමු.

## Be used to

යම් කිසි ක්‍රියාවක් හෝ යම් දෙයක් කිරීම සබැඳිව හොඳින් **"අත් දැකීම් ඇති බව, පළපුරුද්ද ඇති බව"** ප්‍රකාශ කෙරෙන වාක්‍යය රටාවක් වශයෙන් මෙම වාක්‍යය රටාව හඳුන්වාදිය හැක.

***Fomular*** :- සූත්‍රය

**Subject + Be used to + Verb (ing) + Object + Rest.**
සබ්ජෙක්ට් + බී යූස්ඩ් ටූ + වර්බ් (අයිඑන්ජී) + ඔබ්ජෙක්ට් + රෙස්ට්.
කර්තෘ + අත්දැකීම් ඇති බව, පළපුරුද්ද ඇති බව + ක්‍රියාපදය (**ing** ස්වරූපය) + කර්මය + ඉතිරිය.

***Ex*** / උදා :-

1. He is used to playing cricket.
   හී ඊස් යූස්ඩ් ටු ප්ලේයින්ග් ක්‍රිකට්.
   ඔහුට ක්‍රිකට් ක්‍රීඩා කරන එක හොඳින් හුරු දෙයක්.

2. She is used to dancing at the parties.
   ෂී ඊස් යූස්ඩ් ටු ඩාන්සින්ග් ඇට් ද පාටීස්.
   ඇයට පාටිවල නටන එක හොඳින් හුරු දෙයක්.

3. I am used to reading books.
   අයි ඈම් යූස්ඩ් ටු රීඩින්ග් බුක්ස්.
   මම පොත් කියවන්න පුරුදුවෙලා ඉන්නේ.

4. He is used to telling lies.
   හී ඊස් යූස්ඩ් ටු ටෙලිං ලයිස්.
   ඔහු බොරු කියන්න පුරුදුවෙලා ඉන්නේ.

***Nota Bene*** / සැ.යු :-

මෙම වාක්‍යය රටාව භාවිතා කිරීමේදී පහත කරුණු පිළිබඳව සැලකිලිමත් විය යුතුය.

- **Subject :-** කර්තෘ පදය ඒකවචන හා බහුවචන රූප උපකාරක ක්‍රියා පද සමග ව්‍යාකරණානුකූලව භාවිත වේ.
- **Be used to:-** "අත්දැකීම් ඇති බව, පළපුරුද්ද ඇති බව" ආදී වශයෙන් අර්ථය ගැනීම සඳහා මෙම වාක්‍යය ඛණ්ඩය කිසිදු වෙනසකින් තොරව වාක්‍යයට භාවිත කළ හැක.
- **Verb :-** ක්‍රියා පදය වාක්‍යයේ භාවිත කිරීමේදී (ing) ස්වරූපයේ ක්‍රියා පදයක් ලෙස භාවිත කළ යුතුය.
- **Object :-** කර්ම පදය වශයෙන් කර්තෘ කරන ක්‍රියාවට භාජනය වන හා බලපෑම් ලබන පුද්ගලයකු හෝ පදයක් වේ නම් එය කර්ම පදය ලෙස වාක්‍යයෙහි ඒකවචන, බහුවචන බේදයකින් තොරව භාවිත කළ හැක.
- **Rest :-** ඉතිරිය වාක්‍යයෙහි කර්තෘ, ක්‍රියාව, කර්මය ආදී වශයෙන් පිළිවෙලින් යෙදී කාලය හඟවන පද වේ නම් ඒවා ඉතිරිය ලෙස වාක්‍යයෙහි අවසානයට භාවිත කළ හැක.

**Analysis of the sentence formation** - වාක්‍යය රටාවෙහි සැකැස්ම විශ්ලේෂණය.

**Subject + Be used to + Verb (ing) + Object + Rest.**
සබ්ජෙක්ට් + බී යූස්ඩ් ටූ + වර්බ් (අයිඑන්ජී) + ඔබ්ජෙක්ට් + රෙස්ට්.
කර්තෘ + අත්දැකීම් ඇති බව, පළපුරුද්ද ඇති බව + ක්‍රියාපදය (ing ස්වරූපය) + කර්මය + ඉතිරිය.

**He is used to playing cricket.**
හී ඊස් යූස්ඩ් ටූ ප්ලේයින්ග් ක්‍රිකට්.
ක්‍රිකට් ක්‍රීඩා කරන එක ඔහුට හොඳින් හුරු දෙයක්.

***"English vision"*** නව පාඩම් මාලාවක් ඔස්සේ ඔබගේ ඉංග්‍රීසි භාෂා දැනුම වර්ධනය සඳහා "රණවිරුවා" මීළඟ කලාපය සමග එක්වන්න. තවද ඔබට මගහැරුණු පාඩම් අධ්‍යයනය කිරීම සඳහා පහත දී ඇති වෙබ් අඩවිය වෙත පිවිසෙන්න.



කපිතාන් චමින්ද ලියනගේ
ශ්‍රීලංපොසේබ
ජනමාධ්‍ය අංශ - යුමු
*www.englishvision.lk*




### නීල හරිත රට යළි ගොඩනගමු...

සිහිල් සුළං රැල් හමා ඇදෙද්දී
සියොතුන් ගී හඬ පැතිර යතී
ලහිරු කිරණ මිහි මඬල සිඹිද්දී
රිදී තුෂර සැට බිම වැටෙතී

ගොවියන් ගොවිබිම වෙතට ඇදෙද්දී
සියොතුන් ඒ මත පියාඹතී
කිරිකොක් පැහැයට සැරසුණු දරුවන්
වෙල මැද්දෙන් පාසලට යතී

ගම්මැද්දේ සිට කෑමත් අරගෙන
කිරි මාමා කඩපොළට යතේ
හිමිදිරි මෙහෙවර අහවර හැසැ තව
ඉදල් මිටිය අම්මාගෙ අතේ

වයසට ගියමුත් ගත වෑහැරීලා
ශක්තිය ඇත තව ඔහුගේ සිතේ
උදැල්ල සමගින් නියර මනිනවා
පත් කෙණ්ඩිය සමගින් දෑතේ

ගෙජ්ජිය බැඳගෙන කරත්ත මාමා
ගොනු දක්කන හඬ දුරට ඇසේ
රැකියාවට යන ගම්වැසියන්ගේ
කවුලු පියන්පත් සෙමෙන් වැසේ

කොළඹට ඇදෙනා අඟුරු කෝච්චිය
කෑ ගසනා හඬ සවන් වැසේ
ගමේ පන්සලේ ඝණ්ඨා නාදය
දෝංකාර දී ගමට ඇසේ

ගම සිරියාවයි බැලූ බැලූ හැම තැන
නිල්වන් කෙත්වතු අවට ඇතේ
දූෂිත වායුව ඝෝෂාකාරය
කලබල ජීවිත අපට නැතේ

ගහසිත පුබුදන ගම සිරියාවයි
ලා කොළ පැහැයයි සතර අතේ
හෙට දින ලොකු වෙන පුරතල් අප හට
නැගී සිටින්නට රටත් ඇතේ

ලුතිතන් (උපා) ඩීඑම් සමරකෝන්
සහයක ශාසා නිලධාරී
ඉදිරි තඩත්තු පෙදෙස (හැඟගහගිර)
මින්නේරිය

### මගේ සකිසඳ...

බියෙන් පීඩිත රුදුරු සමයක
තැබුවේ පියවර තවමු මගකට
අතරමගදී හැවතු රියසක
සිරකළා සොල්දාදු දොනනක..

සහය දී රට රකින සැමහට
ඉදිරියට පියමනින සැනෙකට
කරුණු විමසූ නුඹේ නෙතු මට
රහස කිව්වේ නොකියූ හැඟුමක

එදත් අද මෙන් නුඹේ නිලයට
හිස නැමුවෙමි සකිය ගරු කොට
නුඹේ දෙනෙතේ තිබුණු බැල්මට
අතරමං විය එකම මොහොතට

යළිත් දිනයක නුඹව දකුමට
පෙරුම් පුරනෙමි එදා සිට මම
තිහක් ගෙවුණත් වසර හෙමිහිට
අදත් සිහිවෙයි මගේ සකිසඳ

ජීවිල්අයි සංකල්පනී
කළුතර උතුර

### මගේ ආදර අප්පච්චී

පාසල් ගමනට හැවතුම තබමින්
ජීවන ගමනට උරතියා
නිතරම ජීවිතය සරු කරවන්නට
නුඹ වින්ද දුක් අපමණයි අප්පච්චී

බොහෝ දුක් කරදර මැදින්
මා හැදූ වැඩූ අප්පච්චී
මහින් තොර ලොව සුන්දර බව කියා
මා හට ඔවදන් දුන් අප්පච්චී

මගේ දයාබර දරුවන් හට
ආදරණීය සීයා කෙනෙක්ද
මගේ මවට දයාබර සැමියෙක්ද වූ අප්පච්චී
මගේ බිරිඳට හා සහෝදරියට නිතරම
සෙවනැල්ලක් වූ අප්පච්චී

රට රැකුමට මා නිවසින් පිටව ගිය මොහොතේ
පවුරක් මෙන් නිවසේ තනියට සිටි අප්පච්චී
ඔබ මෙලොවින් සමුගත් මොහොතේ
මගේ ජීවන ගමනෙහි කණිමඩළ කඩා හැලුනා සේ
දැනුණා මට අප්පච්චී

සංසාර ගමනෙහි අනිත්‍ය බව වටහා දී
මෙලොවින් සමුගත් අප්පච්චී
ප්‍රාර්ථනා කරන සුගතියකට යාමට
කුසල් රැස් කරන්නෙමි අප ඔබ වෙනුවෙන්
මාගේ සොහොයුර අප්පච්චී..

සෙ/109148
සැරයන් වීරකෝන් එම්ඩබ්ලිව්
1 විජය ශ්‍රීලසබ
553 පාබල බලසේනාව - අලිමංකඩ

### උදව් උපකාර...

උදව් උපකාර කරන්න
හැවත සිතයවත් වත්
බලාපොරොත්තු නොවී

සෙ/2එල්00833
මා/සැරයන් අජිත් ජයවීර රීවීවිල් (විශ්‍රාමික)
2(සේවී) ශ්‍රීලසුගෙවබ

### යසෝරාවියේ...

හිරිමල් යෞවනයේ යසෝරාවියේ
නුඹ පා තබන මේ මාවත බියකරුය
වන මෘගයන්ගේ පාරාදීසයේ නුඹ මුවැත්තියකි
කටුකොහොලින් පිරී විසල් වූ මේ ලෝකයේ
නුඹගේ ජීවන ගමන කෙතරම් බියකරුද

සෙ/2ඩී03197
ලා/කෝප්‍රල් දයාරත්න ඩීවී - 2 ශ්‍රීලපාහ

### මගේ සොයුර නුඹ...

හිරු පායා එවී සෙවනැල්ල මැකී ගොස් ඇත
මා තනිකර සඳ පායා දිලුනත්
අමාවක වී ඇත අද සිට
අයියේ.. යන හඬ සිහිනයක්ව තබමින්
සියලු දේ අතහැර අකලට ඇදවැටුණේ කොහොමද

සොඳුරු මතකය සමග එක්ව වැලපෙන්ට බෑ මට
තබා ගන්නෙමු එය සුරැකිව නුඹ මතක් වනු පිණිස
හෙට දින
නෙරක් නොපෙනෙන ගමනක වැනිය සසර
දීර්ඝායු ලැබ යළිත් බවයක මගෙ සොයුර වී
එනවද මිහිර නුඹ

සෙ/427749
ලා/කෝප්‍රල් ඉසුරු මධුසංඛ ඩබ්ලිව්කේ
12 වන ගැමුණු හේවා බලකාය

### සංසාර ප්‍රේමය

සැනසෙන්නට බැරි වේදනාවක්
සිතන්නට පවා අකමැති
වෛර බඳින
අතීතය මතකයට නැගෙන හැමවිටම
මැරි මැරි උපදිනවා
සංසාර ප්‍රේමය
අනන්ත අප්‍රමාණ වාරයක් පාසා
මේ ආත්ම භවයේ දෑසට උරුම වූ
උණු කඳුලු ගලාවිත් වැටුනත් පපුමතට
නිවාලන්නට උහුලන්නට බැරි ගින්දර

සෙ/284936 සංසෙ ප්‍රියන්ත එච්බී
3 ශ්‍රීලංසංබ

### සුදු දෝණි...

හැඩුල් දුරලූ රන් කඳක්
උපා නුඹ මට පුර හඳක්
මටම මවාලූ පින් කඳක්
මගේ වුන සේව්වන්දියක්

ප්‍රේමයට තව එක නමක්
හදින් නැගෙනා හිමි නමක්
සෙනෙහෙ ගලනා පෙම් ගඟක්
නුඹ නොවෙද සුදු හංසියක්

පෙමින් වෙලිලා කාලයක්
උපත් නෑ කිසි පාලුවක්
හිදිනෙමි තව නීල මැණික
ඒ අපේ රන් දියණියක්

සෙ/285894
ලා/කෝප්‍රල් දයානන්ද එච්එච්එම්එන්
3 ශ්‍රීලංසංබ

# පාන් පෝලිම...

ඒ මොහොතෙහි ඒ රුසියානු නිවසේ සිටියේ කුඩා දැරියක පමණි. කවුදෝ අමුත්තකු පැමිණ දොරට තට්ටු කළවිට දැරිය දොර ඇරියාය.

**අමුත්තා :** "ඔයාගේ තාත්තා කෝ"
**දැරිය :** "තාත්තා දැන් ගෙදර නැහැ" ඇය කීවාය. "ඒත් ඔහු තව පැය අටකුත් මිනිත්තු හතලිස්තුනකුත් තත්පර 23 කින් මෙතන"
**අමුත්තා :** "ඔයා කොහොමද ඒක හරියටම කියන්නෙ"
**දැරිය :** "තාත්ත අභ්‍යාවකාශගාමියෙක්. එයාගේ චන්ද්‍රිකාව පොළොව වටේ කරකැවෙනව"
**අමුත්තා :** "හොදයි ඔබේ අම්මා"
**දැරිය :** "එයත් ගෙදර නැහැ"
"ඇය කීය වෙනකොට ගෙදර එයිද?"
**දැරිය :** "කාටද කියන්න පුළුවන්" දැරිය උරහිස් ගැස්සුවාය. "එයා ගියේ පාන් පෝලිමට"



# දෙගිඩියාව...



දේශපාලඥයා ඔහුගේ උපදේශක තුමා අමතා "මම ස්ථිර තීරණයකට බහින්න බැරි මිනිහෙක් කියල ඡන්ද දායකයෝ කියනව. තමුසේ හිතන විදියට මම මේ ප්‍රශ්නෙට උත්තර දෙන්න ඕනිද? ඒත් නැත්තම් දෙපැත්ත කැපෙන උත්තරයක් දෙන්න ඕනිද? එහෙමත් නැත්තම් මම මොකද කරන්නේ?

# මුංඇට අටක්...



එක්තරා තරුණ යුවලක් විවාහ වී සතුටින් කාලය ගතකරන විට හදිසියේම සැමියාට පිටරට රැකියාවකට යාමට සිදුවිය. අලුත විවාහ වී සිටි නිසා ඉතාම දුකින් හඬමින් වැලපෙමින් බිරිඳගෙන් සමුගෙන සැමියා පිටරට ගියේය. වසර තුනකට පසු සැමියා යළි නිවසට ආවේය. බිරිඳ සමග දින කිහිපයක් සතුටින් ගතකළ සැමියා දිනක් තම නිදන කාමරය පිරිසිදු කිරීමට පටන් ගත්තේය. නිදන ඇඳේ මෙට්ටය බිමට ඇද දැමූ විට යමක් කොලයක ඔතා තිබෙනු දැක එය අතට ගෙන දිගහැර බැලූ විට, එහි මුංඇට කිහිපයක් හා රුපියල් සීයේ කොලයක් තිබිණ. කුතුහලයට පත් සැමියා තව තවත් එය පරීක්ෂා කළේය. එහි මුංඇට අටක් සහ රුපියල් සීයක් තිබිණ. බිරිඳට කතාකළ සැමියා ඒ ගැන විමසීය. බිරිඳ ඉකි ගසමින් හඬන්නට විය. බිරිඳ ළගට ළංවූ ඇගේ සැමියා ඇයගේ හිස අතගාමින් " කියන්න මොකද වුනේ? මොනවද මේවා කොහින්ද" යැයි විමසීය. බිරිඳ හඬමින් "ඔයා රට ඉන්න දවස්වල අයියා කෙනෙක් මගේ තනියට ගෙදර ආව ගියා. එයා ආව හැම වතාවකම මං මුං ඇටයක් ගෙනල්ල මෙට්ටෙ යටින් තියල ගියා" යැයි හඬමින් පැවසීය.

ටිකක් කල්පනා කළ සැමියා "කමක් නැහැ අට වතාවයි ඇවිල්ලා තියෙන්නෙ අවුරුදු තුනටම. ඔයත් තනියෙන්මයි හිටියේ" කියමින් බිරිඳ සනසාලූ ඔහු "එතකොට මේ රුපියල් සියය මොකක්දැයි" විමසීය. එවිට බිරිඳ විලාප තියමින් මහ හයියෙන් යළිත් හඬන්නට විය. සැමියා යළිත් ඇයව ළගට ගෙන පිරිමදිමින් "කියන්න කියන්න මොකක්ද වුනේ යැයි" ඇසීය. "බිරිඳ හඬමින් මුං ඇට කිලෝ දෙකක් විකුණුවා" යැයි පැවසීය.

# වෙරි බැස්සහම එන්නම්...

දීර්ඝ වේලාවක් ලෙඩා පරීක්ෂා කළ දොස්තර අන්තිමේදී ඔහු අමතා මෙසේ කීය.

"ඔබේ ලෙඩේට හේතුව මොකක්ද කියලා හොයාගන්න මට අමාරුයි. මට හිතෙන්නේ මෙහෙම වෙන්නේ බීපු නිසා වෙන්න ඇති කියලයි"

"එහෙනම් මම දොස්තර මහත්තයාගේ වෙරි බැස්ස වෙලාවක ආපසු එන්නම්" කියමින් රෝගියා වේගයෙන් ඉවත ඇදී ගියේය.



## වෘත්තීය දිවියේ අනේකවිධ කඩඉම් පසු කොට
## සුබ මොහොතින් නව තනතුරු ලැබූ ඔබ සියලු දෙනාට දිරිය, විරිය, රැකවරණය ලැබේවායි
## "රණවිරුවා" මෙසේ සුබ පැතුම් එක්කරයි.



62 වන පාබල සේනාංකාධිපති ලෙස

**මේජර් ජෙනරාල්**
**එස්ආර්කේ**
**හෙට්ටිආරච්චි ආර්ඩබ්ලිව්පී**
**ආර්එස්පී යූඑස්පී එන්ඩියූ පීඑස්සී**

**2022 අප්‍රේල් මස 07 දින සිට**



52 වන පාබල සේනාංකාධිපති ලෙස

**බ්‍රිගේඩියර්**
**එච්එම්යූ හේරත් ආර්ඩබ්ලිව්පී**
**ආර්එස්පී යූඑස්පී පීඑස්සී**
**එච්ඩීඑම්සී**

**2022 මාර්තු මස 14 දින සිට**



ආරක්ෂක සේනා මූලස්ථානය (මධ්‍යම) බ්‍රිගේඩියර් ප්‍රමා ලෙස

**බ්‍රිගේඩියර්**
**ඩබ්ලිව්එම්එස්සීකේ**
**වනසිංහ ආර්එස්පී යූඑස්පී**
**2022 අප්‍රේල් මස 26 දින සිට**



ගට කාර්ය සම්පාදන පුහුණු පාසලේ සේනාවිධායක ලෙස

**බ්‍රිගේඩියර්**
**රුඑම්එම් ප්‍රනාන්දු ඊඑට්බී එල්එස්සී**

**2022 අප්‍රේල් මස 04 දින සිට**



242 වන පාබල බලසේනාධිපති ලෙස

**බ්‍රිගේඩියර්**
**බීපීඑස් ප්‍රනාන්දු**
**යූඑස්පී පීඑස්සී**
**2022 අප්‍රේල් මස 22 දින සිට**



රණවිරු සම්පත් කේන්ද්‍ර වෘත්තීය පුහුණු මධ්‍යස්ථානයේ සේනාවිධායක ලෙස

**බ්‍රිගේඩියර්**
**ඩීඑස්ඩීආර් වෛද්‍යසේකර**
**ආර්එස්පී**
**2022 මාර්තු මස 21 දින සිට**



212 වන පාබල බලසේනාධිපති ලෙස

**බ්‍රිගේඩියර්**

**එම්ඩබ්ලිව්ඩීඑන් මැදිවක**
**ආර්එස්පී යූඑස්පී**

**2021 මාර්තු 28 දින සිට**



ශ්‍රී ලංකා යුද්ධ හමුදා ස්වේච්ඡා බලසේනාවේ පුහුණු පරීක්ෂක ලෙස

**බ්‍රිගේඩියර්**

**එම්ටීජේආර් සිල්වා කේඑස්පී**

**2022 මාර්තු 21 දින සිට**



532 වන පාබල බලසේනාධිපති ලෙස

**කර්නල්**

**එස්පී වික්‍රමසේකර ආර්ඩබ්ලිව්පී**
**ආර්එස්පී යූඑස්පී පීඑස්සී**

**2021 දෙසැම්බර් 20 දින සිට**



21 වන පාබල සේනාංකයේ කර්නල් සම්බන්ධීකරණ ලෙස

**කර්නල්**
**එම්එම්ආර් චන්ද්‍රසේකර**

**2022 ජනවාරි 31 දින සිට**



ආරක්ෂක සේනා මූලස්ථානය (නැගෙනහිර) කර්නල් (පාලන/හකාස) ලෙස

**කර්නල්**
**අයිබී දසනායක**

**2022 අප්‍රේල් 06 දින සිට**



ආරක්ෂක සේනා මූලස්ථානය (බටහිර) කර්නල් සම්බන්ධීකරණ ලෙස

**කර්නල්**
**ඊආර්ඩබ්ලිව්සී අසුරසිංහ**
**ආර්ඩබ්ලිව්පී ආර්එස්පී යූඑස්පී**
**2022 අප්‍රේල් 12 දින සිට**



පුනරුත්ථාපන අධ්‍යක්ෂ මණ්ඩලයේ මාණ්ඩලික 1 ලෙස

**ලුතිනන් කර්නල්**
**ඒඑම්ඒඩීආර් උඩරාපොල ආර්එස්පී**

**2022 මාර්තු 25 දින සිට**



ආරක්ෂක සේනා මූලස්ථානය (නැගෙනහිර) ප්‍රමාණි 1 (ක්‍රියා) ලෙස

**ලුතිනන් කර්නල්**
**එම්ටීඅයි ගුණවර්ධන**
**ආර්එස්පී පීඑස්සී**

**2022 මාර්තු 21 දින සිට**



ආරක්ෂක සේනා මූලස්ථානය (යාපනය) ප්‍රමාණි 1 (සම්) ලෙස

**ලුතිනන් කර්නල්**
**එල්ඒපීඑම්යේ ලියනආරච්චි**

**2022 අප්‍රේල් 08 දින සිට**



ගුවන් සංචලනීය බලසේනාවේ ජ්‍යෙෂ්ඨ මාණ්ඩලික නිලධාරී ලෙස

**ලුතිනන් කර්නල්**
**යූආර් ගාල්ලගේ ආර්එස්පී යූඑස්පී**

**2022 මාර්තු 30 දින සිට**



ආරක්ෂක සේනා මූලස්ථානය (නැගෙනහිර) මාණ්ඩලික 1 (යකාස) ලෙස

**ලුතිනන් කර්නල්**
**ජේපීඩබ්ලිව්පීඑම්පීඩීආර්**
**ද අල්මේදා**

**2022 මාර්තු 17 දින සිට**



53 වන පාබල සේනාංකයේ ප්‍රමාණි I (ක්‍රියාන්විත) ලෙස

**ලුතිනන් කර්නල්**
**ඒජේඑස් අබේනායක ආර්එස්පී**

**2022 පෙබරවාරි 11 දින සිට**



9 වන සංඥා බලකායේ අණදෙන නිලධාරී ලෙස

**මේජර්**
**බීඑම්එම්බී හේරත් ආර්එස්පී යූඑස්පී**

**2022 පෙබරවාරි මස 14 දින සිට**



6 වන ගැමුණු හේවා බලඇණියේ අණදෙන නිලධාරී ලෙස

**මේජර්**
**එස්එල්ඩබ්ලිව් දිසානායක ආර්එස්පී**

**2022 මාර්තු මස 07 දින සිට**



4 (සේවා) රෙජිමේන්තුව ශ්‍රී ලංකා යුද්ධ හමුදා යුධෝපකරණ බලකායේ අණදෙන නිලධාරී ලෙස

**මේජර්**
**එන්පීජේපී තිලකරත්න**
**පීඑස්සී ඒඑටීම්**

**2022 මාර්තු මස 04 දින සිට**



ශ්‍රීලවියාඉ (කාලතුවක්කු) බලඇණියේ අණදෙන නිලධාරී ලෙස

**මේජර්**
**ඒඑම්වීජ් අත්තනායක එල්එස්සී**

**2022 පෙබරවාරි 14 දින සිට**



16 වන ශ්‍රී ලංකා ජාතික ආරක්ෂක බළමුළුවේ අණදෙන නිලධාරී ලෙස

**මේජර්**
**කේආර්එම් අලවත්ත**

**2022 මාර්තු මස 22 දින සිට**



17 වන ශ්‍රී ලංකා ජාතික ආරක්ෂක බළමුළුවේ අණදෙන නිලධාරී ලෙස

**මේජර්**
**පීපීඑල් හේමකුමාර**

**2022 මාර්තු මස 11 දින සිට**

# දෙස ගොඩනගන මෙහෙයට උරදෙමින්



12 වන පාබල සේනාංකාධිපති බ්‍රිගේඩියර් ඒඑච්එල්ජී අමරපාල ආර්ඩබ්ලිව්පී ආර්එස්පී එන්ඩීසී පීඑස්සී ගේ උපදෙස් මත එම සේනාංකයෙහි සෙනින් විසින් ප්‍රාදේශීයව සොයාගත් අමුද්‍රව්‍ය මගින් නිෂ්පාදනය කරන ලද කොම්පෝස්ට් ටොන් 23 ක ප්‍රමාණයක් ලක් පොහොර සමාගමෙහි නියෝජිතයින් වෙත භාරදීම ඉකුත් අප්‍රේල් 04 වන දින එම සේනාංක මූලස්ථානයේදී සිදුකෙරිණ. ආරක්ෂක මාණ්ඩලික ප්‍රධානී හා යුද්ධ හමුදාධිපති මෙන්ම හරිත කෘෂිකාර්මික ක්‍රියාන්විත මධ්‍යස්ථාන ප්‍රධානී ජෙනරාල් ශවේන්ද්‍ර සිල්වා ඩබ්ලිව්ඩබ්ලිව්වී ආර්ඩබ්ලිව්පී ආර්එස්පී වීඑස්වී යූඑස්පී එන්ඩීසී පීඑස්සී එම්ෆිල් ගේ සංකල්පයක් අරුත් ගන්වමින් ක්‍රියාත්මක මෙම වැඩසටහන තුළින් මෙවර යල කන්නය සඳහා භාවිතා කළ හැකි මෙම ටොන් 23 ක් වූ පොහොර තොගය ලක්පොහොර අලෙවි කළමණාකරු වෙත භාරදුන් අවස්ථාවට 12 වන පාබල සේනාංකාධිපති ඇතුළු පිරිසක් එක්වූහ.


රණවිරුවා

පරිගණක අකුරු සංයෝජනය,
කවර නිර්මාණය හා පිටු සැකසුම

සෙ/752158 බිහි II සේනාරත්න ජීසී 3 ඉසේරෙ
සෙ/753797 කෝප්‍රල් කුමාරසිංහ එම්ජීඑම් 11 ඉසේරෙ
සෙ/754676 ලා/කෝප්‍රල් ලක්තිලිණ ඩබ්ලිව්ආර් 11 ඉසේරෙ

රණවිරුවා ලිපිනය

රණවිරුවා
මනෝවිද්‍යාත්මක මෙහෙයුම් අධ්‍යක්ෂ මණ්ඩලය,
යුද්ධ හමුදා මූලස්ථානය,
කොළඹ

ඊමේල්

dtepsyops@army.lk
ranaviruwa@yahoo.com

දුරකථන

011 2993076

ගුප්ත දිගුව

51445/51446

"රණවිරුවා" අන්තර්ජාලය ඔස්සේ කියවීමට

ප්‍රකාශනය

ශ්‍රී ලංකා යුද්ධ හමුදා
මනෝවිද්‍යාත්මක මෙහෙයුම් අධ්‍යක්ෂ මණ්ඩලය





අධීක්ෂණය

බ්‍රිගේඩියර්
කේපීපී ද සිල්වා ආර්එස්පී පීඑස්සී



උපදේශකත්වය

ලුතිනන් කර්නල්
ඩීඑම්එම් දිසානායක ආර්ඩබ්ලිව්පී



ප්‍රධාන සංස්කාරක

ලුතිනන් කර්නල්
සුජිත් චමින්ද එදිරිසිංහ



සහාය සංස්කාරක

කපිතාන්
එච්ඩබ්ලිව්යූ ලක්ෂිකා

# යුද්ධ හමුදාධිපති රණවිරු සංගම්වල දිස්ත්‍රික් නියෝජිතයින් හමුවෙයි







ආරක්ෂක මාණ්ඩලික ප්‍රධානී හා යුද්ධ හමුදාධිපති ජෙනරාල් ශවේන්ද්‍ර සිල්වා ඩබ්ලිව්ඩබ්ලිව්වී ආර්ඩබ්ලිව්පී ආර්එස්පී වීඑස්වී යූඑස්පී එන්ඩීසී පීඑස්සී එම්ෆිල් ඉකුත් අප්‍රේල් 11 වන දින සිංහල හා දමිළ අලුත් අවුරුද්දට සුභාසිංසන පිරිනැමීමේ අරමුණින් යුද්ධ හමුදා මූලස්ථානයේදී රණවිරු සංගම්වල දිස්ත්‍රික් නියෝජිතයින් හමුවූහ.

විශ්‍රාමික, රණක්ෂිතයටපත් සහ මියගිය රණවිරුවන්ගේ සහ ඔවුන්ගේ පවුල්වල සාමාජිකයින්ගේ සුබසාධන කටයුතු වෙනුවෙන් හැකි අයුරින් සහන සැලසීමේ අරමුණින් ආරක්ෂක මාණ්ඩලික ප්‍රධානී සහ යුද්ධ හමුදාධිපති ගේ සංකල්පයකට අනුව 2021 පෙබරවාරි මස 16 වන දින මෙම රණවිරු සංසදය ස්ථාපිත කරන ලදි. ඒ අනුව ඔවුන්ට පැනනැගෙන ගැටලු රණවිරු සේවා අධිකාරිය සහ යුද්ධ හමුදා මූලස්ථානයේ රණවිරු සේවා අධ්‍යක්ෂ මණ්ඩලය මෙන්ම සුබසාධක අධ්‍යක්ෂ මණ්ඩලය සමඟ සම්බන්ධීකරණයෙන් නිරාකරණය කර ගැනීමේ හැකියාව මින් ලැබෙනු ඇත.

මාතෘභූමියේ උන්නතිය වෙනුවෙන් අතීතයේ ඔවුන් කළ කැපවීම් අගය කරමින් රණවිරු සංගම්වල සාමාජිකයින් වෙත සිංහල හා දමිළ අලුත් අවුරුද්ද වෙනුවෙන් ත්‍යාග ප්‍රදානය කිරීමේ උත්සවයක් ද යුද්ධ හමුදා මූලස්ථානයේදී පැවැත්වුනු අතර ඊට ප්‍රධාන ආරාධිත අමුත්තා ලෙස යුද්ධ හමුදාධිපති සහභාගී විය. එම අවස්ථාව සඳහා යුද්ධ හමුදා මාණ්ඩලික ප්‍රධානී මේජර් ජෙනරාල් එච්එල්වීඑම් ලියනගේ ආර්ඩබ්ලිව්පී ආර්එස්පී එන්ඩීයූ, විධායක ජෙනරාල් මේජර් ජෙනරාල් ඩීඑම්කේඩීබී පුස්සැල්ල ආර්ඩබ්ලිව්පී ආර්එස්පී, රණවිරු සේවා අධිකාරියේ අධ්‍යක්ෂ බ්‍රිගේඩියර් එම් මායාදුන්න ආර්එස්පී යූඑස්පී ඇතුළු ජ්‍යෙෂ්ඨ නිලධාරීන් පිරිසක්ද එක්ව සිටියහ.

මෙම උත්සව අවස්ථාව සඳහා කෑගල්ල, කළුතර, අනුරාධපුර, මාතර, මහනුවර, මොණරාගල, ගාල්ල, කුරුණෑගල, අම්පාර, පොළොන්නරුව, කොළඹ, රත්නපුර, මාතලේ, වවුනියාව, ගම්පහ, බදුල්ල, හම්බන්තොට, ත්‍රිකුණාමලය, මුලතිව්, මඩකලපුව, නුවරඑළිය සහ පුත්තලම යන දිස්ත්‍රික්ක 22 ක් නියෝජනය කරමින් විධායක සභිකයින් සහභාගී වූහ.





# දිශාව...

යුද බිමේ තබන හැම පියවරකටම හේතුවක් තිබුණා. ඒ හේතුව හොයාගෙන ගිය ගමනට නිවැරදි දිශාවක් තිබුනා. අවසානයේ යුද්ධය ජයග්‍රහණය කරලා මව්බිමට සාමය උදාකරදුන්න දා පටන් අපේ රට යළිත් නිවැරදි දිශානතියකට හරවන්නත් අපට පුළුවන් වුණා. ඒ උත්තම මෙහෙවර පිටිපස්සේ හැමදාම ඉන්නේ රණවිරුවෝ.

රණබිමේ මතක

මනෝවිද්‍යාත්මක මෙහෙයුම් අධ්‍යක්ෂ මණ්ඩලය, යුද්ධ හමුදා මූලස්ථානය, ශ්‍රී ජයවර්ධනපුර.